

වාර්ෂික වාර්තාව

2019

© DMC 2019

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

විද්‍යා මාවත,

කොළඹ 07.

වෙබ් අඩවිය

www.dmc.gov.lk

විද්‍යුත් තැපෑල

info@dmc.gov.lk

හදිසි ඇමතුම්

011 213 6222
011 267 0002
117



ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

Disaster Management Centre

1 හැඳින්වීම 1

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව 1

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා 2

2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක් 3

2.1 දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ 3

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම් 3

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය 4

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්යය මණ්ඩලය 5

2.4.1 කාර්යය මණ්ඩලය බඳවා ගැනීම් 5

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 6

2.5 2019 වර්ෂයේ ඇති වූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය 7

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය 7

3 ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම් 12

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම 12

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම 12

3.3 ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP) 12

3.4 අන්තර්කාලීන ආපදා කළමනාකරණ සැලැස්ම (IMC) 13

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC) 13

4 අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය 14

4.1 හැඳින්වීම 15

4.2 අංශයේ වගකීම් හා කාර්යභාරය 15

4.3 අංශයේ ක්‍රියාකාරකම් 16

4.4 2019 වර්ෂයේ ප්‍රගතිය 18

4.5 ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 20

4.6 2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති 21

4.7 2019 වර්ෂයේ නව ව්‍යාපෘති 21

4.8 වෙනත් ව්‍යාපෘති 29

5 පෙර සූදානම් හා සැලසුම් අංශය 30

5.1 හැඳින්වීම 30

5.2 දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් සැලසුම් 30

5.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන 31

5.4 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්ම 31

5.5 දිස්ත්‍රික් මට්ටමේ පෙර සූදානම් වැඩසටහන් 32

5.6 විශාල ජලාශ වේළි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සූදානම් කටයුතු 33

5.7 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම 33

5.8 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම 33

5.9 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන් 34

5.10 ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන 34

5.11	මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය	35
5.12	ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 - 2030	36
5.13	සංයුක්ත සැලැස්ම (2020 – 2024) සහ ප්‍රධාන කාර්යය දර්ශක සැකසීම (KPI)	36
6	පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	37
6.1	හැඳින්වීම	37
6.2	මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම	45
6.3	අත් පත්‍රිකා මඟින් ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම	45
6.4	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල යාවත්කාලීන කිරීම	46
6.5	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්	47
6.6	ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහන්	48
6.7	ජාතික සුරක්ෂිත දින වැඩසටහන්	50
7	හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය	51
7.1	හැඳින්වීම	51
7.2	2019 නිරිත දිග හා ඊසාන දිග මෝසම් සක්‍රිය වීම නිසා ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් හටගත් ගංවතුර හා නායයෑම් කළමනාකරණය කිරීම	52
7.3	පූර්ව දැනුම් දීම්	56
7.4	ඇමතුම් මැදිරිය	57
7.5	පොලිසිය හා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ කටයුතු	58
7.6	සෙවීම් හා මුදවා ගැනීම් පිළිබඳ ආපදා කළමනාකරණ දින 12ක නේවාසික පුහුණු පාඨමාලාව	59
7.7	SPILLEX 2019 පෙරහුරු වැඩසටහන පැවැත්වීම	61
7.8	හදිසි අවස්ථාවන්හි මාධ්‍ය සම්බන්ධීකරණය	62
7.9	ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම	62
7.10	2019 වර්ෂය තුළදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාළ අනෙකුත් කාර්යයන්	63
7.11	හදිසි මෙහෙයුම් අංශය මඟින් සිදුකරනු ලබන කාර්යයන්	64
7.12	අභියෝග	65
8	මූල්‍ය අංශය	66
8.1	2019 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රගතිය	66
9	2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව	93

01. හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය සඳහා වන ප්‍රධානතම ආයතනය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වේ. අදාළ සියලුම පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව ආපදා අවම කිරීම සඳහා ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී ඇත්තේ මෙම ආයතනය වෙතය.

ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව යටතේ ක්‍රියාත්මක ආයතනය ලෙස 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යවසන කළමනාකරණ පනතෙහි 8 වන වගන්තිය ප්‍රකාරව මෙම ආයතනය පිහිටුවන ලදි. ජාතික ප්‍රතිපත්ති සැලසුමෙන් ක්‍රමෝපායික මහපෙන්වීම ලබාදීම පිළිබඳ කාර්යය ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව වෙත පැවරී ඇති අතර රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඒ සඳහා මහපෙන්වීම ලබා දීම සිදු කරනු ලැබේ. ප්‍රතිචාර මත පදනම් යාන්ත්‍රණයෙන් බැහැරව ප්‍රගාමී ප්‍රවේශයක් ලබාගැනීම උදෙසා ප්‍රතිපත්තිමය විතැන්වීමක් සඳහා යොමුවෙමින් ශ්‍රී ලංකාවේ ව්‍යසන කළමනාකරණය සම්පූර්ණයෙන්ම ආවරණය කරන ව්‍යසන අවදානම් අඩු කිරීමේ වැඩසටහන් සඳහා වන කාර්ය රාමුවක් බවට 2005 අංක 13 දරන මෙම පනත පත්විය.

මෙම පනත මඟින් පිහිටුවන ලද ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වනුයේ, ආපදා අවම කිරීම, පෙර සූදානම් සැලසුම් සැකසීම, මහජන දැනුවත් කිරීම්, අවදානමට ලක්ව ඇති ජනතාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, හදිසි අවස්ථා මෙහෙයුම් කටයුතු සහ අනිකුත් ප්‍රධාන ආයතන සමඟ එක්ව සහන සහ පශ්චාත් ව්‍යසන කළමනාකරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම වේ. ප්‍රාදේශීය මට්ටමේ ව්‍යසන අවදානම් තත්ත්ව අඩු කිරීමේ කටයුතු සියලුම දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් ආපදා ව්‍යසන කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පිහිටුවා ඇත.

1.1 ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව

2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සඳහන් නීතිමය ප්‍රතිපාදන අනුව ව්‍යසන කළමනාකරණය සඳහා වන ජාතික සභාව 2005 වසරේදී පිහිටුවන ලදි. මෙය ආපදා කළමනාකරණයේ ප්‍රධාන ස්ථානය වන අතර එය අතිගරු ජනාධිපතිතුමාගේ සහභාගීත්වයෙන් සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ උප සභාපතිත්වයෙන් යුතු ඉහළ මට්ටමේ අන්තර් අමාත්‍යාංශ නියෝජනයක් සහිත ආයතනයකි. ආපදා කළමනාකරණ ජාතික සභාවේ අනෙකුත් සාමාජිකයන් වන්නේ පනතේ විශේෂයෙන් සඳහන් කර ඇති තෝරාගත් විෂයයන් භාරව සිටින අමාත්‍යවරු, පළාත් ප්‍රධාන අමාත්‍යවරු (ප්‍රධාන අමාත්‍යවරයාට සහභාගිවීමට නොහැකි විට එම පළාත් සභාවේ ආණ්ඩුකාරවරයා) සහ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ සාමාජිකයන් පස් දෙනෙකුන්ගෙන් යුතු කණ්ඩායමකි.
(සටහන 1.1)

ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාවේ සංයුතිය



සටහන 1.1: ජාතික සභාවේ සංයුතිය

1.2 ආපදා කළමනාකරණ විෂය පථය යටතට ගැනෙන ආපදා

2005 අංක 13 දරන පනත අනුව ආපදා කළමනාකරණය යටතට ගැනෙන උවදුරු වන්නේ,

- නායයෑම්
- සුළි සුළඟ
- ගං වතුර
- නියඟය
- කාර්මික ආපදා
- සුනාමි
- භූමි කම්පා
- ගුවන් උවදුරු
- සමුද්‍රීය උපද්‍රවයන්
- ගිනි
- වසංගත තත්වයන්
- පිපිරීම්
- ගුවන් ප්‍රහාර
- සිවිල් හෝ අභ්‍යන්තර අරගල
- රසායනික අනතුරු
- විකිරණ සම්බන්ධ හදිසි අවස්ථා
- අභ්‍යන්තර සහ මුහුදු කාන්දුවීම් ඇතුළත් තෙල් කාන්දු වීම්
- න්‍යෂ්ටික ආපදා
- නාගරික සහ වනාන්තර ගිනිගැනීම්
- වෙරළ බාදනය
- ටොනාඩෝ, අකුණු ගැසීම් සහ දැඩි හිඟුරුම් සහිත කුණාටු

2. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳ කෙටි හැඳින්වීමක්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට පැවරී ඇති ජාතික වගකීම වන්නේ ඇතිවිය හැකි ඕනෑම ආපදා තත්වයක් කාර්යක්ෂමව කළමනාකරණය කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කරමින් සුරක්ෂිත ප්‍රජාවක් ඇති කිරීමයි. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ නායකත්වය යටතේ අංශ හතකින් සමන්විතව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාවලිය සකස් වී ඇත.
ඒ අනුව එහි ප්‍රධාන අංශ පහත සඳහන් වේ.

1. ආපදා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය
2. පෙර සූදානම් හා සැලසුම් අංශය
3. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය
4. හදිසි මෙහෙයුම් හා පූර්ව අනතුරු ඇඟවීමේ අංශය
5. මානව සම්පත් හා පරිපාලන අංශය
6. මූල්‍ය අංශය
7. අභ්‍යන්තර විගණන අංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ජාතික වගකීම දිවයින පුරා ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක සෑම දිස්ත්‍රික්කයක් තුළම ස්ථාපිත කර ආපදා කළමනාකරණ යාන්ත්‍රණය කාර්යක්ෂමව හා ඵලදායීව රටතුළ ක්‍රියාත්මක කෙරේ.

2.1 දැක්ම, මෙහෙවර සහ අභිමතාර්ථ

<u>දැක්ම</u>

සුරක්ෂිත ප්‍රජාවක් සහ තිරසාර සංවර්ධනයක්.

<u>මෙහෙවර</u>

ස්වාභාවික, තාක්ෂණික සහ මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇතිවන හදිසි ආපදා තත්වයන් ක්‍රමානුකූලව කළමනාකරණය තුළින් ප්‍රජාව තුළත් පොදුවේ පවුල් ඒකක තුළත් සුරක්ෂිත වූ සංස්කෘතියක් ගොඩනැගීම.

<u>අභිමතාර්ථ</u>

අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන, පළාත් සභා, පළාත් පාලන ආයතන, දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී යනාදී දීප ව්‍යාප්ත පරිපාලන ව්‍යුහයන් තුළින් පහත සඳහන් කාර්යයන් සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම.

2.2 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ක්‍රියාකාරකම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති ප්‍රධාන වගකීම්,

- ජාතික ප්‍රතිපත්තිය මත පදනම්ව ජාතික ව්‍යසන කළමනාකරණ සැලැස්ම සහ ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සකස් කිරීම.
- උවදුරු සිතියම්ගත කිරීම සහ අවදානම් තත්ත්ව තක්සේරු කිරීම.

- පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම සහ පැවැත්වීම.
- පෙර සූදානම් සැලසුම් සකස් කිරීම සඳහා රාජ්‍ය ආයතනවලට සහායවීම ඇතුළුව ව්‍යසන සඳහා පෙර සූදානම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.
- පූර්ව අනතුරු ඇඟවීම් ලබාදීම හා ප්‍රචාරණය.
- හදිසි අවස්ථා මෙහෙයුම් කළමනාකරණය කිරීම සහ සෙවීම් සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම.
- සහනාධාර බෙදාදීම ඇතුළු පශ්චාත් ව්‍යසන කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- ආපදා අවම කිරීම් ව්‍යුහාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු.
- ආපදා අවදානම් අවම කිරීම සඳහා සංවර්ධන ප්‍රවාහයට ආපදා අවදානම් අන්තර්ගත කිරීම.
- දේශගුණික වෙනස්කම් සඳහා අනුවර්තනය වීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.
- ව්‍යසන අවදානම් අඩුකිරීමේ කටයුතු පිළිබඳව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය, පුද්ගලික අංශයේ ආයතන, රාජ්‍ය නොවන දේශීය සංවිධාන, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අදාළ ආයතන සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ආපදා අවම කිරීම, ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ව්‍යසනවලින් පසු යථා තත්ත්වයට පත්වීම සඳහා විදේශ ආධාර ලබා ගැනීම, ව්‍යාපෘති සම්බන්ධීකරණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

2.3 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

සටහන 2.1හි දක්වා ඇති පරිදි ආපදා කළමනාරණ මධ්‍යස්ථානය විසින් ඉටුකරනු ලබන විවිධ කාර්යයන් හා වැඩසටහන් සැලකිල්ලට ගනිමින් මෙම ආයතනික ව්‍යුහය සකස් කර ඇත.



සටහන 2.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආයතනික ව්‍යුහය

2.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවක සංඛ්‍යාව සහ කාර්ය මණ්ඩලය

2.4.1 කාර්ය මණ්ඩලය බඳවා ගැනීම්

ආයතනයේ පවතින අධ්‍යක්ෂ තනතුරු පුරප්පාඩු 03 අතුරින් අධ්‍යක්ෂ (මෙහෙයුම්) තනතුර සඳහා තාවකාලිකව ශ්‍රී ලංකා යුධ හමුදා නිලධාරියෙකු අනුයුක්ත කරවාගෙන ඇත. සංවර්ධන නිලධාරී තනතුරු 101ක් අතුරින් තනතුරු 100ක් අලුතින් අනුමත වී ඇති අතර 2020 වසරේදී එම පුරප්පාඩු පිරවීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කර තිබේ. අවශ්‍ය අනුමැතින් ලැබුණු පසු 2020 වසරේදී සෙසු පුරප්පාඩු ද සම්පූර්ණ කර ගැනීමට බලාපොරොත්තු වේ.

2019.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

වගුව 2.1: 2019.12.31 දිනට කාර්යය මණ්ඩල තොරතුරු

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අධ්‍යක්ෂ	6	3	3
අභ්‍යන්තර විගණක	1	1	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ	18	0	18
සහකාර අධ්‍යක්ෂ	15	12	3
සහකාර අධ්‍යක්ෂ (දිස්ත්‍රික්)	25	25	0
ගිණුම් නිලධාරී	1	1	0
පරිපාලන නිලධාරී	1	0	1
පුද්ගලික සහකාර	1	0	1
විමර්ශන නිලධාරී	1	1	0
දුර දැනීම්/භූ තොරතුරු දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
දත්ත පද්ධති විශ්ලේෂක	1	1	0
තොරතුරු තාක්ෂණ නිලධාරී	1	0	1
ජාල පද්ධති පරිපාලක	1	0	1
පුස්තකලයාධිපති	1	1	0
සංවර්ධන නිලධාරී	101	0	101
භාෂා පරිවර්තක	2	0	2
තොරතුරු තාක්ෂණ සහකාර	6	6	0
චලන හා නිශ්චල කැමරා ශිල්පී	1	1	0
සන්නිවේදන කාර්මික ශිල්පී	3	2	1
සංඥා ක්‍රියාකරු	1	1	0
කළමනාකරණ සහකාර / ආපදා කළමනාකරණ සහකාර	201	186	15
රියදුරු	39	38	1
කාර්යාල කාර්යය සහායක	35	34	1
එකතුව	**465**	**316**	**149**

2019.12.31 දිනට නව බඳවා ගැනීම්

වගුව 2.2: 2019.12.31 දිනට නව බඳවා ගැනීම්

තනතුර	සංඛ්‍යාව
විමර්ශන නිලධාරී	01
දුර දැනීම්/භූ තොරතුරු පද්ධති විශ්ලේෂක	01
රියදුරු	02

2019.12.31 දිනට අයදුම්පත් කැඳවීම

වගුව 2.3**:** 2019.12.31 දිනට අයදුම්පත් කැඳවීම්

තනතුර	සංඛ්‍යාව
කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන)	15

2.4.2 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක

මෙම ඒකක දිස්ත්‍රික් 25 තුළම පිහිටුවා ඇත. මෙම එක් එක් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කාර්ය මණ්ඩලය, සහකාර අධ්‍යක්ෂවරයෙකු (දිස්ත්‍රික්) සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කළමනාකරණ සහකාරවරුන්ගෙන්, කාර්යාල සහායකවරයෙකු මෙන්ම රියදුරුවරයෙකුගෙන් සමන්විත වේ.

දිස්ත්‍රික්කය ආපදාවලට භාජනය වීමට ඇති නැඹුරුතාවය අනුව දිස්ත්‍රික් ව්‍යසන කළමනාකරණ සහායකයින් සංඛ්‍යාව වෙනස් වේ. මුළු එකතුව ගත් කල සහකාර අධ්‍යක්ෂවරුන් (දිස්ත්‍රික්) 25 දෙනෙකු සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාරවරුන්, ආපදා කළමනාකරණ සහකාරවරුන්, කළමනාකරණ සහකාරවරුන් ඇතුළුව 113 දෙනෙකු දිස්ත්‍රික්ක 25 හි සේවය සඳහා යොදවා ඇත.

කොළඹ, කළුතර, ගාල්ල, මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට යුධ හමුදා සහ ගුවන් හමුදා නිලධාරීන් අනුයුක්ත කර ඇත.

කළුතර දිස්ත්‍රික්කය හැර සෙසු දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ස්ථාපිත කර තිබේ. රූප සටහන 2.2හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය දැක්වේ.



සටහන 2.2: දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ යාන්ත්‍රණය

2.5 2019 වර්ෂයේ ඇතිවූ ආපදා තත්වයන් පිළිබඳ විග්‍රහය

2.5.1 ආපදාවල බලපෑම විශ්ලේෂණය - 2019

i. සමස්ත බලපෑම- 2019

2019 වසරේ නියඟය, ගංවතුර, නායයෑම්, කණ්ඩි කඩා වැටීම්, දැඩි සුළං, ගිනි ගැනීම් සහ අකුණු යනාදියෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 1,622,773ක් පමණ වේ. නියඟය නිසා පමණක් බලපෑමට ලක් වූ පුද්ගලයින් සංඛ්‍යාව 975,385ක් වන අතර ගංවතුර හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් ගණන 589,796ක් වේ. මරණයට පත් වූ සහ තුවාල ලැබූ සංඛ්‍යාව පිළිවෙලින් 106ක් සහ 164 ක් වේ.

තවද, 2018 සමඟ සන්සන්දනය කිරීමේදී මරණ අතුරුදහන්වීම් සහ තුවාල ලැබූවන් ගේ සංඛ්‍යාවේ සැලකිය යුතු අඩුවීමක් දක්නට ලැබේ.



සටහන 2.3: මරණ, අතුරුදහන්වීම් සහ තුවාල



සටහන 2.4: නිවාස හානි පූර්ණ සහ අර්ධ



සටහන 2.5: ආපදාවට ලක්වූ පුද්ගලයන් සංඛ්‍යාව

සටහන :

ආපදා නිසා බලපෑමට ලක් වූ පුද්ගලයින්ගේ සංඛ්‍යා ලේඛණ ඉදිරිපත් කිරීමේදී සමුච්චිත එකතුව භාවිතා කර ඇත.

උදා: එක් පුද්ගලයෙක් එක් වසරක් තුළදී යම්කිසි ආපදාවක් නිසා දෙවරක් බලපෑමට ලක්වුයේ නම් එකතුව 02ක් ලෙස ගණනය කරනු ලැබේ.

ii. නිවාස හානි - 2019

2019 වසරේ වැඩිම නිවාස හානි වාර්තා වී ඇත්තේ සැප්තැම්බර් මාසයේය. දැඩි සුළං හා ගංවතුර හේතුවෙන් වැඩිම හානි වාර්තා වී ඇති අතර එය නිවාස 6,108 කි. එම හානියට පත් වැඩිම නිවාස වාර්තා වන්නේ ගාල්ල දිස්ත්‍රික්කයෙනි. එනම්, ගංවතුර හේතුවෙන් නිවාස 1425කට අර්ධ හානි වී ඇත. වැඩිම පූර්ණ හානි වාර්තා වන්නේ මාතර දිස්ත්‍රික්කයෙන් වන අතර එය නිවාස 43ක් වේ.



සටහන 2.6: නිවාස හානි

iii. එක් එක් ආපදා බලපෑමෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස- 2019

නිවාස 511ක් පමණ විනාශ වූ අතර නිවාස 19969කට වැඩි ප්‍රමාණයක් හානියට පත්විය. වැඩිම හානිය සිදුවී ඇත්තේ සුළිසුළං හේතුවෙනි.



සටහන 2.7 ආපදා බලපෑම හේතුවෙන් විනාශ වූ / හානියට පත්වූ නිවාස



සටහන 2.8: පූර්ණ නිවාස හානි



සටහන 2.9: අර්ධ නිවාස හානි

iv. මරණ / අතුරුදහන් වීම් සහ තුවාල

වැඩිම මරණ වාර්තා වී ඇත්තේ දියේ ගිලීම් හේතුවෙන් වන අතර එය 32ක් සහ අතුරුදහන් වීම් 01ක් ලෙස වාර්තා වී ඇත. සුළි සුළං සහ ගංවතුර හේතුවෙන් මරණ 26ක් සහ 13ක් ලෙස වාර්තා වී ඇත. වැඩිම මරණ ගණනක් වාර්තා වන්නේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් වන අතර එය සුළි සුළං හේතුවෙන් මරණ 16ක් වේ. අකුණු අනතුරු හේතුවෙන් නිසා මරණ 17ක් වාර්තා වේ.



සටහන 2.10: මරණ / අතුරුදහන් වීම් හා තුවාල

2019 වසරේ මරණයට පත්වූ සංඛ්‍යාව 106ක් වන අතර එයින් 30%ක් පමණ දියේ ගිලීම් නිසා සිදුවී ඇත. දෙවැනි වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වූයේ සුළිසුළං මඟිනි. එය 25%කි. අකුණු ගැසීම්, ගංවතුර සහ සත්ව ප්‍රහාර හේතුවෙන් සිදු වී ඇති මරණ සංඛ්‍යාව පිළිවෙලින් 16%ක්, 12%ක් සහ 8%ක් පමණ වේ.



සටහන 2.11: එක් එක් ආපදාවලින් සිදුවූ මරණ



සටහන 2.12: එක් එක් ආපදාවලින් බලපෑමට ලක් වූ පුද්ගලයන්



සටහන 2.13: එක් එක් ආපදාවලින් මරණයට පත් වූ පුද්ගලයන්



සටහන 2.14: ගංවතුර හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්



සටහන 2.15: නියඟය හේතුවෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන්

v. (www.desinventar.lk) දත්ත අනුව ආපදාවල බලපෑමේ සාරාංශය- 2019

- 2019 වසර තුළ වැඩි වශයෙන් පීඩාවට පත්වූ ජනතාව සිටින දිස්ත්‍රික්ක ලෙස අම්පාර, මඩකලපුව, ගම්පහ, බදුල්ල සහ මුලතිව් සහ යන දිස්ත්‍රික්ක හැඳින්විය හැකිය.

- වැඩිම මරණ සංඛ්‍යාවක් වාර්තා වී ඇත්තේ නුවරඑළිය ගාල්ල, හම්බන්තොට, සහ මඩකලපුව යන දිස්ත්‍රික්කවලින් වේ.

- සමස්තයක් ලෙස 2019 වසරේදී සියලුම දිස්ත්‍රික්ක ආපදා බලපෑම් ඇති අතර ගංවතුර හේතුවෙන් දිස්ත්‍රික්ක 23කට ද, නියඟය හේතුවෙන් දිස්ත්‍රික්ක 22කට ද බලපෑම් සිදු වී ඇත.

3. ජාතික මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

3.1 ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත සංශෝධනය කිරීමේ කාර්යය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් අවසන් කර ඇති අතර එම සංශෝධිත පනතින් කෙටුම්පත නීතිපති අනුමැතිය සඳහා යොමුකර ඇත.

3.2 ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම (NEOP)

ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම නිර්මාණය කිරීමේ අවශ්‍යතාව 2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මඟින් පෙන්වා දී ඇත. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාලගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පරිශීලනය කිරීමේ පහසුව සඳහා ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පළමු වෙළුම සහ දෙවන වෙළුම ලෙස වෙළුම් දෙකකින් භාෂාත්‍රයෙන් මුද්‍රණය කර ඇත. කිසියම් ආයතනයක සක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පළමු වෙළුම මඟින් ද, ආයතනික වගකීම් හා කාර්ය භාරය, ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම දෙවන වෙළුම මඟින් ද, විස්තර කර ඇත.

භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම සඳහා, ඉදිරියේදී ආපදා කළමනාකරණය ජාතික සභාවෙහි අනුමැතිය ලබා ගන්නා තෙක් ජාතික හදිසි අවස්ථා මෙහෙයුම් සැලැස්ම පළමු වෙළුම මාර්ගෝපදේශ කර ගනිමින් හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් සිදු කරන කටයුතු සඳහා අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ එකඟතාවය ලබා දී ඇත.

3.3 ආයතනික ආපදා කළමනාකරණ සැලැස්ම (IDMP)

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් සඳහා මාර්ගෝපදේශයන් සකස් කිරීමේ වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇත. ඒ අනුව ආපදා කළමනාකරණ අමාත්‍යාංශය යටතේ පවත්නා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය යන ආයතන සමඟ එක්ව මාර්ගෝපදේශයන් සකස් කරන ලදි. එම මාර්ගෝපදේශය ක්‍රියාවේ යෙදවීමට ප්‍රථමව ප්‍රධාන පාර්ශවකාර ආයතන 10ක් සඳහා නේවාසික වැඩමුළුවක් සංවිධානය කර එම මාර්ගෝපදේශයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ ආයතන මට්ටමින් නිරීක්ෂණ ලබාගන්නා ලදි. අවසාන මාර්ගෝපදේශය අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කර නැවත ඉහත ආයතන හා ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව, සෞඛ්‍ය අමාත්‍යාංශය, පොලිසිය සහ ආගමන හා විගමන දෙපාර්තමේන්තුව යන ආයතන සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව සෞඛ්‍ය අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

මාර්ගෝපදේශයන් සකස් කරගෙන ඇත. අනෙකුත් ආයතන ද මේ වනවිට මාර්ගෝපදේශයන් සකස් කරමින් පවතී. මෙහි ක්‍රියාකාරීත්වයේ දුර්වලතා හා ගැටලු ඇත්නම් ඒවා ප්‍රතිශෝධනය කිරීමට සැලසුම් කර ඇත.

3.4 අන්තර්කාලීන කළමනාකරණ කමිටුව (IMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකරණමය කටයුතු සම්බන්ධව තීරණ ගන්නා වූ මෙහෙයුම් ක්‍රියාකාරීත්වය අන්තර්කාලීන කළමනාකරණ කමිටුව නම් වේ. එය ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් 2019 වර්ෂය තුළදී රැස්වීම් වාර 6ක් පවත්වා ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අන්තර්කාලීන කළමනාකරණ කමිටුවේ සංයුතිය පහත සඳහන් පරිදි වේ.

1) ලේකම්, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සභාපති
2) මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය - නියෝජිත-සාමාජික
3) ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය- නියෝජිත - සාමාජික
4) පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය - නියෝජිත- සාමාජික
5) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - සාමාජික
6) ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය - සාමාජික
7) අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය - ලේකම්

3.5 විගණන සහ කළමනාකරණ කමිටුව (AMC)

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සියළු ක්‍රියාකාරකම් විගණනයට ලක් කරනු ලබන අතර ඒ සම්බන්ධව විගණනාත්මක උපදේශන මෙහෙයුම් කමිටුව විගණන සහ කළමනාකරණ කමිටුව නම් වේ. එහි 2019 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සාමාජිකයන්ගේ සංයුතිය පහත දැක්වේ.

ඒ.වී. ජනාදර මහතා (සභාපති)	-	අධ්‍යක්ෂ, භාණ්ඩාගාර අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය
ඩබ්. ඒ. ධර්මසිරි මහතා (සමාජික)	-	අධ්‍යක්ෂ ජනරාල්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
එච්.යූ.ආර්. ෆොන්සේකා මහතා (සමාජික)	-	ප්‍රධාන ගණකාධිකාරි, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
කේ.ඒ. සුභද්‍රා වල්පොල මහත්මිය (සමාජික)	-	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
ඒ.බී.ආර්. අමරකෝන් මහත්මිය (නිරීක්ෂක)	-	විගණන අධිකාරි, විගණකාධිපති දෙපාර්තමේන්තුව
කේ.ඒ. නිශාන්ත මහතා (සමාජික)	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මූල්‍ය (රා.ඉ.) ,ආ.ක.ම.
ජේ.එච්.පී. ජයලත් මහතා (සමාජික)	-	අභ්‍යන්තර විගණක, ආ.ක.ම.

ජාතික විගණන කාර්යාලයෙන් හා මධ්‍යස්ථානයේ අභ්‍යන්තර විගණන අංශයෙන් නිකුත් කර තිබූ විගණන විමසුම්වලින් මතුකර ඇති නිරීක්ෂණ පිළිබඳව කරුණු මෙහිදී සාකච්ඡාවට භාජනය කර ඇත. ඒ අනුව මුදල් රෙගුලාසි 133 හා 134 මඟින් දැක්වෙන කාර්යභාරයන්, කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවේ චක්‍ර ලේඛනවල දැක්වෙන උපදෙස් හා ජාතික විගණන පනතේ නියමයන්ට අනුව විගණන හා කළමනාකරණ කමිටුවේදී කරුණු සාකච්ඡා කර අදාළ නිවැරදි කර ගැනීම් සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය වෙත අවශ්‍ය මඟපෙන්වීම් සිදුකර ඇත.

එමෙන්ම විගණන විමසුම් හා වාර්තාවලින් මතුකරන නිරීක්ෂණ හා විගණන කළමනාකරණ කමිටුවේ නිර්දේශ සඳහා මධ්‍යස්ථානය විසින් සිදුකරනු ලබන නිවැරදි කර ගැනීම්වල ප්‍රමාණාත්මක හා ගුණාත්මකභාවය පිළිබඳව ද මෙහිදී වැඩිදුරටත් කරුණු සොයා බලනු ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 වර්ෂයට අදාළව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් (04) පවත්වා අභ්‍යන්තර පාලන පද්ධතිය විධිමත්ව හා නිවැරදිව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මඟපෙන්වීම් කළමනාකාරීත්වය වෙත ලබා දී ඇත.

ශ්‍රී ලංකාවේ සම්පත්වලට මූලිකත්වය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් භාර ගන්නා ලද ව්‍යාපෘති, වැඩසටහන් හා කාර්යභාර්යන්වල පූර්ව නිශ්චය කරගත් අරමුණු ළඟා කර ගැනීමේ පරමාර්ථයෙන් සම්පත් සකසුරුවම් ලෙස සහ කාර්යක්ෂමව භාවිත කර ඇති බවට සහතික වීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සෑම අංශයක්ම සමාලෝචනය කිරීම සහ එකී ක්‍රියාකාරකම් සඳහා වෙන් කරන ලද අරමුදල් වියදම් කිරීම සඳහා, අවසරලත් කාල සීමාව තුළ එකී පරමාර්ථ සැබෑවටම අත්කර ගෙන තිබේද යන්න සහ නිම කළ ව්‍යාපෘති හෝ වැඩසටහන්, සැලසුම්වලින් අපේක්ෂිත වූ පරිදි ක්‍රියාත්මක වන්නේ ද යන්න නිර්ණය කිරීම සිදුකිරීම විගණන හා කළමනාකරණ කමිටුවට පැවරී ඇති කාර්යන් වේ. එය ඉදිරි වර්ෂවලදී ද මනාව ඉටුකිරීමට කමිටුව විසින් අපේක්ෂා කර ඇත.

4. අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ප්‍රධාන අංශ හතරකින් සමන්විත වේ. අවමකිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මේ අතරින් එක් අංශයක් වේ. මහා භාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලද අතර එම වර්ෂයේ භෞතික සහ මූල්‍ය ප්‍රගතිය ද පහත පරිදි වේ.

2019 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන සහ එම වර්ෂයේ මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය.

වගුව 4.1: 2019 වර්ෂය සඳහා වෙන් කළ ප්‍රතිපාදන සහ මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2019 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන)		භෞතික ප්‍රගතිය (%)
			ප්‍රගතිය	අතැති බිල්	
3-2509	ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	200	131.23	42.63	90
10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	10	7.17	4.4	90
7-2509	ආපදා අවදානම් තක්සේරුව	15	9.72	0	80

4.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනත යටතේ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවන ලද අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ආපදා පෙර සූදානම්, පුහුණු කිරීම්, අවමකිරීම් / පර්යේෂණ හා සංවර්ධන සහ හදිසි ආපදා ප්‍රතිචාර ලෙස ප්‍රධාන අංශ හතරකින් සමන්විත වේ. ඒ අනුව ආපදාවන්ට පෙර, ආපදා අවස්ථාවන් සහ පසු යන අවස්ථාවන් හිදී ආපදා අවදානම් කළමනාකරණය සඳහා ක්‍රමෝපායික සැලසුම් සකසමින් කෙටි කාලීන සහ දිගුකාලීනව එම සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා මෙම එක් එක් අංශය වෙත පැවරී ඇති වගකීම් සහ කායීභාරයන් එම අංශය මඟින් ඉටුකරනු ලබයි.

දිස්ත්‍රික් 25 තුළ ස්ථාපිත කර ඇති දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් ආපදා කළමනාකරණ ක්‍රියාකාරකම් දියත්කිරීම සහ සම්බන්ධීකරණය සිදුකරනු ලබන අතර ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් පහත සඳහන් කායීභාරය ඉටුකරනු ලබයි.

4.2 අංශයේ වගකීම් හා කාර්යභාරය

01. ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවමකිරීම සඳහා උපායමාර්ගික සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම

සියලුම ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ආපදා අවදානම් අවමකිරීම සඳහා වන උපාය මාර්ගික සැලසුම් සකසා ඉදිරිපත් කිරීම. මෙහිදී අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශ මඟින් සිදුකිරීම සඳහා මැදිහත්ව කටයුතු කිරීම සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ආපදා අවදානම් අවමකිරීම සඳහා ලැබෙන ප්‍රතිපාදන ද භාවිතා කර දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගත් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති තුළින් ව්‍යාපෘති තෝරාගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරු මඟින් සම්බන්ධීකරණය සිදුකිරීමේ සහ ඒ සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම.

ජාතික මට්ටමින් ආපදා අවදානම් අවමකිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ, ආයතන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අවශ්‍ය අවස්ථාවන් හිදී දායකත්වය ලබාදී ආපදා අවදානම අවමකිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය සිදු කිරීම සහ ඒ පිළිබඳ ප්‍රගතිය වාර්තා කිරීම සිදු කරනු ලැබේ.

02. ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා රාජ්‍ය හා පුද්ගලික ආයතන සම්බන්ධීකරණය තුළින් අදාළ ක්ෂේත්‍ර හඳුනාගැනීම සහ එක් එක් ක්ෂේත්‍ර සඳහා ආපදා අවදානම් අවමකිරීම සඳහා මාර්ගෝපදේශ නිර්මාණය තුළින් ජාතික මට්ටමේ ආපදා අවදානම් අවමකිරීම් සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශයක් නිර්මාණය කිරීම සහ එම මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන පසුගමනීය කටයුතු සිදුකිරීම.

03. දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ කාර්යයන් අනිකුත් ආයතන සහ සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම.

04. අමාත්‍යාංශයේ උපදෙස් මත පදනම්ව ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම. පාර්ශවකාර ආයතන හා සම්බන්ධීකරණය කොට පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ, නැවත යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

05. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම.

06. ආපදා සම්බන්ධ දත්ත පද්ධතීන් පවත්වාගන යාම සහ යාවත්කාලීන කිරීම.

07. ආපදා අවදානම් දිස්ත්‍රික්ක සම්බන්ධීකරණය කොට අවදානම් තක්සේරුකරණය සම්බන්ධ කාර්යයන් සිදුකිරීමට ආපදා අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම.

08. දිස්ත්‍රික්, ප්‍රාදේශීය සහ ග්‍රාම නිලධාරී වසම් මට්ටම්න්, නගර සභා බල ප්‍රදේශ සහ තෝරාගත් ක්ෂේත්‍ර සඳහා ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම සඳහා දත්ත ඒකරාශී කිරීම, තක්සේරුකරණය සිදුකිරීම/යාවත්කාලීන කිරීම සහ ආපදා අවදානම් තක්සේරුව පිළිබඳ පාර්ශවකරුවන් දැනුවත් කිරීම.

4.3 අංශයේ ක්‍රියාකාරකම්

i. ජාතික හා දිස්ත්‍රික් මට්ටම්න් ආපදා අවදානම් අවම කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම

- **දිස්ත්‍රික් මට්ටම්න් ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

ඉදිරි වසර සඳහා, දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් මඟින් දිස්ත්‍රික් මට්ටම්න් ආපදා අවම කරන ක්‍රියාකාරකම් තෝරාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අදාළ නිර්දේශ සහිතව (අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දිස්ත්‍රික් වෙත ලබාදී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශය අනුව) මූලික ව්‍යාපෘති යෝජනා ගෙන්වා ගැනීම.

- ඉදිරි වසර සඳහා, දිස්ත්‍රික් මට්ටම්න් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වන මූලික සුදුසුකම් සපුරා ඇති ද යන බව සහතික කර ගැනීම, ඒ පිළිබඳ වාර්තා සැකසීම සහ දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපෝෂණ ඉදිරිපත් කිරීම.
- අවම කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අවම කිරීමේ අංශය වෙත වෙන්කර ඇති ප්‍රතිපාදනවලට අනුරූපව ප්‍රමාණවත් මට්ටම්න් දිස්ත්‍රික්ක මඟින් ව්‍යාපෘති යෝජනා ගෙන්වාගැනීම සඳහා කටයුතු කිරීම.
- ඉදිරි වසර සඳහා දිස්ත්‍රික් මට්ටමේ ව්‍යාපෘති යෝජනා සාරාංශය යාවත්කාලීන කිරීම සහ ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා ජාතික මට්ටමේ කමිටු සඳහා ඉදිරිපත් කිරීමට අවශ්‍ය ලියකිවිලි සැකසීම.
- ජාතික මට්ටම්න් ව්‍යාපෘති තෝරා ගැනීමෙන් අනතුරුව (අධ්‍යක්ෂ ජනරාල් විසින් දිස්ත්‍රික්ක වෙත ලබාදී ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ මාර්ගෝපදේශ අනුව) තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සහ වාර්තාකරණය සිදුකිරීම.

- තෝරාගත් ව්‍යාපෘති සඳහා වන ඇස්තමේන්තු සහ අනෙකුත් ලියකිවිලිවල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සහ ඊට අදාළ ලිපිගොනු යාවත්කාලීන කිරීම අධීක්ෂණය කිරීම.
- තෝරාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී උද්ගතවන ප්‍රායෝගික ගැටලු විසඳීම සඳහා මැදිහත්වීම සහ ව්‍යාපෘතිවල ප්‍රගතිය වේගවත් කිරීම සඳහා අවශ්‍ය මැදිහත්වීම් සිදුකිරීම.
- ව්‍යාපෘති නිමකිරීමෙන් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව අවසන්කල බවට වාර්තා ගෙන්වා ගැනීම සහ මූල්‍ය වාර්තාකරණය නිසියාකාරව අවසන් කිරීමට කටයුතු කිරීම.
- ආපදා අවම කිරීමේ ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතිය වාර්තාකරණය (භෞතික හා මූල්‍ය).

- **ජාතික මට්ටමින් ආපදා අවදානම් අවම කිරීම සඳහා වෙනත් අමාත්‍යාංශ, ආයතන යටතේ ක්‍රියාත්මක වන වැඩසටහන් සහ ව්‍යාපෘති**
  - විවිධ වූ තාක්ෂණික ප්‍රවීණත්වය සහිත අමාත්‍යාංශ සහ ආයතන තුළින් ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීමේදී ඒ සඳහා අවශ්‍ය දායකත්වය ලබාදීම සහ මැදිහත්වීම් සිදුකිරීම.
  - ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ තාක්ෂණික ආයතන සහ රේඛීය අමාත්‍යාංශ මඟින් සිදුකර ගැනීම සඳහා සම්බන්ධීකරණය කිරීම.
  - වෙනත් අමාත්‍යාංශ, ආයතන මඟින් සිදුකරනු ලබන ආපදා අවදානම් අවම කිරීමේ වැඩසටහන් අධීක්ෂණය සහ වාර්තාකරණය කිරීම.

ii. ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම

- ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම පිළිබඳ රාජ්‍ය සහ පුද්ගලික අංශයේ පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කිරීම.
- තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායමේ තාක්ෂණික නිර්දේශ තුළින් සැලසුම් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
- එක් එක් ක්ෂේත්‍ර සඳහා ආපදා අවදානම් අවම කිරීම සඳහා මාර්ගෝපදේශ නිර්මාණය කිරීම සඳහා උපදේශන සේවාවක් තෝරාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සඳහා සහය වීම.
- මාර්ගෝපදේශ සැකසීම, පරිවර්තනය කිරීම සහ මුද්‍රණය කිරීම සඳහා කටයුතු කිරීම.
- විවිධ ක්ෂේත්‍ර තුළ සකසන ලද ආපදා අවදානම් අවම කිරීමේ මාර්ගෝපදේශ පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු, රැස්වීම් ආදිය සංවිධානය කිරීම තුළින් ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු කිරීම.
- ව්‍යාපෘති අධීක්ෂණය කිරීම.
- මාර්ගෝපදේශ ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම සඳහා වන පසුගමනීය කටයුතු සිදුකිරීම.

iii. දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවම කිරීමට අදාළ කාර්යයන් අනෙකුත් ආයතන සහ සම්බන්ධීකරණය කොට ක්‍රියාත්මක කිරීම

- දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ ව්‍යාපෘති යෝජනා පිළිබඳ කටයුතු සිදුකිරීම.
- දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ වැඩසටහන්, පුහුණුවීම්, වැඩමුළු ආදිය නියෝජනය කිරීම සහ එම වැඩසටහන්වලට අදාළ ඉදිරි කටයුතු සිදුකිරීම.
- දේශගුණික විපර්යාස සඳහා අනුහුරුවීම, අනුගතවීම හා අවමකිරීමට අදාළ වාර්තා සැකසීම.

iv. ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම

- අමාත්‍යාංශයේ උපදෙස් මත පදනම්ව ආපදාවන්ගේ අභිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම.
- පාර්ශවකාර ආයතන හා සම්බන්ධීකරණය කර පශ්චාත් ආපදා ප්‍රතිසංස්කරණ, නැවත යථාතත්වයට පත්කිරීමේ වැඩසටහන් සම්බන්ධීකරණය කිරීම.

v. ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදුකිරීම

- ආපදා සම්බන්ධ දත්ත පද්ධතීන් පවත්වාගෙන යාම යාවත්කාලීන කිරීම අධීක්ෂණය කිරීම.
- ආපදා අවදානම් දිස්ත්‍රික්ක හා සම්බන්ධීකරණය කොට ආපදා අවදානම් තක්සේරුකරණය සම්බන්ධ කාර්යයන් සිදුකිරීමට ආපදා අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශ ලබාදීම.
- ආපදා අවදානම් පැතිකඩට අදාළ ක්‍රියාකාරකම් සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ආපදා අවදානම් පැතිකඩ සැකසීම පිළිබඳ අධීක්ෂණය සිදුකිරීම සහ යාවත්කාලීන කිරීම.
- අදාළ අංශ සහ ආයතන වෙත ආපදා පිළිබඳ තොරතුරු ලබාදීමට කටයුතු කිරීම.
- අවශ්‍යතාවයන් අනුව තොරතුරු වාර්තා, සිතියම් ආදිය සැකසීම.
- වාර්තාකරණය සිදුකිරීම.

4.4 2019 වර්ෂයේ ප්‍රගතිය

පසුගිය වසරවල සිදුවූ ආපදා සහ ඉදිරියේදී තීව්‍ර විය හැකි ආපදා පිළිබඳ අධ්‍යනය කරමින් දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා පදනම් කර ගනිමින්, අවමකිරීම් පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාකාරී සැලසුම් සකසනු ලැබීය. එමෙන්ම ආපදා කළමනාකරණ විෂයට අදාළ පර්යේෂණ කටයුතු, ආපදා අවදානම් තක්සේරුව සහ සංවර්ධන ප්‍රවාහය තුළ ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා වන කටයුතු ද අදාළ තාක්ෂණික කමිටු හරහා සැලසුම් කර ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලැබේ.

මහාභාණ්ඩාගාරය මඟින් පහත සඳහන් පරිදි 2019 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය වෙත වෙන්කරන ලදී.

වගුව 4.2: මහා භාණ්ඩාගාරය මඟින් 2019 වසර සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2019 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රුපියල් මිලියන)
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	200
10-2509	ආපදා අවදානම් අවම කිරීමේ ක්‍රමවේදය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	10
7-2509	ආපදා අවදානම් තක්සේරුව	15
එකතුව		225



සටහන 4.1: 2019 වසර සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම

අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් ආපදා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ආපදා හඳුනාගැනීම සහ දිස්ත්‍රික් මට්ටමේ අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම, ආපදා කළමනාකරණ කටයුතු සඳහා පර්යේෂණ දායකත්වය ලබාදීම සහ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම යන වැඩසටහන් සඳහා ප්‍රමුඛස්ථානය ලබාදෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වගකීම් සහ කාර්යභාරය ඉටුකිරීමට දායකත්වය ලබාදෙනු ලැබේ.

ඒ අනුව 2019 වර්ෂයේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා මූල්‍ය සහ භෞතික ප්‍රගති සාරාංශය පහත පරිදි වේ.

වගුව 4.3: 2019 වර්ෂයේ සිදුකරන ලද අවම කිරීම් වැඩසටහන්වල මූල්‍ය හා භෞතික ප්‍රගති සාරාංශය

වැය ශීර්ෂය	ව්‍යාපෘතිය	2019 වර්ෂය සඳහා වෙන්කල ප්‍රතිපාදන (රුපියල් මිලියන)	මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන)		භෞතික ප්‍රගතිය (%)
			ප්‍රගතිය	අතැති බිල්	
3-2509	ආපදා අවමකිරීමේ ව්‍යාපෘති	**200**	**131.23**	**42.63**	**90**

10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම	**10**	**7.17**	**4.4**	**90**
7-2509	ආපදා අවදානම් තක්සේරුව	**15**	**9.72**	**0**	**80**

4.5 ආපදා අවමකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ශ්‍රී ලංකාව තුළ ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ ප්‍රධානතම කාර්යයක් වන අතර එහිදී එක් එක් වර්ෂය සඳහා මහාභාණ්ඩාගාරය මඟින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන කළමනාකරණය කරමින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනාවල ප්‍රමුඛතා ගතකිරීම අනුව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදුකරනු ලබයි. මෙහිදී විවිධ වූ ආපදා අවම කිරීමේ වැඩසටහන් ඊට අදාළ රේඛීය අමාත්‍යාංශය මඟින් එම අමාත්‍යාංශ සතු ප්‍රතිපාදන මඟින් සිදුකරගැනීම සඳහා යොමුකෙරෙන අතර ප්‍රමුඛතාවය මත අනෙකුත් ආපදා අවම කිරීමේ යෝජනා ක්‍රියාත්මක කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් සිදුකරනු ලබයි.

මෙහිදී දිස්ත්‍රික් මට්ටමින් කැඳවනු ලබන ආපදා අවමකිරීමේ ව්‍යාපෘති යෝජනා සලකා බලමින් ජාතික මට්ටමින් පත්කරනු ලබන කමිටුවක් මඟින් ආපදා අවමකිරීමේ ව්‍යාපෘති තෝරාගනු ලබන අතර ඉන් අනතුරුව එම ව්‍යාපෘති යෝජනාවලට අදාළ විස්තරාත්මක තක්සේරු වාර්තා සහ අදාළ වන අනෙකුත් තාක්ෂණික වාර්තා ද සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික් ලේකම්වරු වෙත ප්‍රතිපාදන නිදහස් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හරහා සිදුකරනු ලැබේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක විසින් සෘජුවම අධීක්ෂණය කරනු ලබන අතර ජාතික මට්ටමින් ද ව්‍යාපෘති ප්‍රගතිය අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි. එක් එක් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන විවිධ වූ තාක්ෂණික දායකත්වයන් දිස්ත්‍රික් මට්ටමින් ඊට අදාළ තාක්ෂණික ආයතන මඟින් ලබාගනු ලබන අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා මූල්‍ය සංසරණය සිදුකරනු ලබයි. ව්‍යාපෘතිය නිමකිරීමෙන් අනතුරුව විධිමත් ක්ෂේත්‍ර පරීක්ෂණයකින් අනතුරුව ව්‍යාපෘතිය සාර්ථකව නිමකල බවට අදාළ තාක්ෂණික නිර්දේශයන් සමඟ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සහකාර අධ්‍යක්ෂක මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත වාර්තා කරනු ලැබේ.

ආපදා පිළිබඳ තොරතුරු සහ දිස්ත්‍රික් මට්ටමින් ඉදිරිපත් කරන ලද යෝජනා පදනම්කර ගනිමින් ඉදිරිපත් කරන ලද අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 200ක් 2019 වර්ෂය සඳහා මහා භාණ්ඩාගාරය මඟින් අනුමත කර ඇත. (රු.මිලියන 100ක් වසර ආරම්භයේ දීත්, රු.මිලියන 100ක් ජුනි මාසයේ දීත් මහාභාණ්ඩාගාරය මඟින් වෙන්කරන ලදී).

2019 වසර සඳහා වෙන්වන ලද ප්‍රතිපාදන මඟින් රු. මිලියන 68.71ක මුදලක්, 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල හිඟ බිල්පත් ගෙවීම සඳහා වෙන්කරන ලදී. පසුගිය වර්ෂ අවසානයත් සමඟ ඉදිරිපත් කරන ලද මෙම බිල්පත් නිසි අධීක්ෂණය යටතේ ගෙවීම් කටයුතු කිරීමට සිදුවීම නිසා මෙම මුදල වෙන්කිරීමට සිදුවිය.

2018 වසරින් 2019 වසරට අවිච්ඡේද වූ ව්‍යාපෘති තුනක් සඳහා රු.මිලියන 12.9ක ප්‍රතිපාදන මුදලක් වෙන්කරන ලද අතර මෙම ව්‍යාපෘති අවසන් කර ගෙවීම් සිදුකර ඇත. ඒ අනුව අවිච්ඡේද ව්‍යාපෘති තුන සඳහා රු මිලියන 9.75ක මුදලක් ගෙවීම සඳහා කටයුතු කර ඇත.

2019 වර්ෂය සඳහා වසර මුලින්ම වෙන්කරන ලද මිලියන 100ක ප්‍රතිපාදන මඟින් උක්ත සඳහන් හිඟ බිල්පත් ගෙවීම සහ අවිච්ඡේද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් අනතුරුව අතිරික්ත ප්‍රතිපාදන නව ව්‍යාපෘති දෙකක් සඳහා වෙන්කරන ලදී. ඉන් අනතුරුව 2019 වර්ෂයේ ජුනි මස වෙන්කරන ලද රු. මිලියන 100ක නව ප්‍රතිපාදන මඟින් ව්‍යාපෘති 13ක් සඳහා ප්‍රතිපාදන ලබාදෙන ලදී.

වසර අවසානයේ ඇතිවූ හදිසි ආපදා තත්වයන් සැලකිල්ලට ගනිමින් ආපදා ප්‍රතිචාර දැක්වීම සඳහා පූර්ව සූදානම සඳහා පොලිසැක් උර මිලදී ගැනීම සඳහාත් මහනුවර ප්‍රදේශයේ අවදානම් ගල් ඉවත්කිරීම සඳහාත් ආපදා අවදානම් අවම කිරීමේ වැය ශීර්ෂය යටතේ ප්‍රතිපාදන වෙන්කරන ලදී.

4.6 2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යාපෘති

වගුව 4.4: 2018 වර්ෂයේ අවිච්ඡේද ව්‍යපෘති

දිස්ත්‍රික්කය	ව්‍යාපෘති ගණන	වෙන්කළ ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය
පොළොන්නරුව	1	7,679,794.53	5,100,268.75	නියඟය පැවතීම හේතුවෙන් ව්‍යාපෘතියේ පිඩලි ඇල්ලීමට වෙන්වූ මුදල නැවත පවරාගන්නා ලද අතර එම ක්‍රියාකාරකම හැරුණු කොට ව්‍යාපෘතිය අවසන් කරන ලදී.
හම්බන්තොට	1	3,236,969.36	2,859,518.81	100%
නුවරඑළිය	1	1,994,258.47	1,793,467.40	100%
එකතුව	**3**	**12,450,284.86**	**9,753,254.96**	

4.7 2019 වර්ෂයේ නව ව්‍යාපෘති

වගුව 4.5: 2019 වසරේ නව ව්‍යාපෘති

දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	වෙන්කළ ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	භෞතික ප්‍රගතිය (%)
මොණරාගල	මැදගම	12,400,000.00	5,588,007.60	85
	බුත්තල	10,000,000.00	-	100
	මඩුල්ල	1,997,264.59	1,664,043.24	100
	පොදුළිං ඉදිකිරීම (මොනරාගල, මැදගම, මඩුල්ල, සියම්බලාණ්ඩුව)	26,938,468.20	3,165,089.17	100
මඩකලපුව	වෙඩ්ඩිපලායම් දකුණ	4,300,000.00	1,119,229.16	100
කළුතර	බේරුවල	10,000,000.00	1,507,369.70	100
අම්පාර	අඩාලවිවේනිය	5,500,000.00	5,323,473.34	100

ත්‍රිකුණාමලය	කන්තලේ	1,000,000.00	970,000.00	100
	සේරුවිල	6,000,000.00	5,820,000.00	100
මහනුවර	ගඟවටකෝරලේ	9,800,000.00	6,178,670.00	100
	ගඟවටකෝරලේ	3,229,640.40	2,414,910.00	100
	අකුරණ	956,091.75	950,000.00	100
වව්නියාව	වව්නියාව	6,700,000.00	-	100
හම්බන්තොට	හම්බන්තොට	8,838,634.17	6,677,799.90	100
මාතලේ	යටවත්ත	2,581,752.57	-	100
පොළොන්නරුව	ලංකාපුර	7,418,514.12	-	100
හදිසි ආපදා සඳහා පොලිසැක් උර මිලදී ගැනීම		2,500,000.00	2,5000,000.00	100

ව්‍යාපෘති වැඩ අවසන් කර බිල්පත් ඉදිරිපත්කර ඇති නමුත් 2019 වසර තුළ බිල්පත් පියවීමට නොහැකිවීම නිසා ව්‍යාපෘති කිහිපයක භෞතික ප්‍රගතිය 100% වූ නමුත් මූල්‍ය ප්‍රගතිය අවම අගයක් වාර්තාවී ඇති අතර එම ව්‍යාපෘතිවලට අදාළ බිල්පත් අතැති බිල්පත් ලෙස දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරුන් මඟින් වාර්තාකර ඇත. ඒ අනුව මූල්‍ය ප්‍රගතිය රු. මිලියන 117.57ක් වන අතර අතැති බිල්පත්වල වටිනාකම රු. මිලියන 51ක් වේ. එක ව්‍යාපෘතියක් පමණක් අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ඉදිරි වසරට දීර්ඝ කල යුතුව ඇත.




හම්බන්තොට- උහපිටගොඩ, වැසි ජලය බැසයාම සඳහා කානු පද්ධතියක් සකස් කිරීම




පොළොන්නරුව- කන්දේගම සද්ධානිස්ස වැව් බැම්ම පිළිසකර කිරීම



නුවරඑළිය- නෝර්වුඩ් ඇල මාර්ගය පුළුල් කිරීම

<u>ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම</u>

ආපදා කළමනාකරණ විෂය සාමුහික ක්‍රියාදාමයක් විය යුතු අතර මේ සඳහා සියලු ක්ෂේත්‍රයන්හි දායකත්වය අත්‍යවශ්‍ය කාරණයක් වේ. ස්වභාවික සහ මිනිසා විසින් ඇතිකරනු ලබන ආපදා රටේ ඕනෑම ස්ථානයක සිදුවීමේ අවදානම පවතින බැවින් ජලය, ගොඩබිම සහ ගුවන යන සෑම ක්ෂේත්‍රයකම ක්‍රියාකාරකම් සමඟ ආපදා අවදානම් අවම කිරීම බද්ධ විය යුතුව ඇත. ප්‍රායෝගිකත්වය සලකා බලමින් සෘජුවම ආපදා අවදානම් කළමනාකරණය සඳහා දායක කරගත යුතු ක්ෂේත්‍ර 10ක් හඳුනාගන එම ක්ෂේත්‍ර තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙහිදී මෙම ව්‍යාපෘතිය රාජ්‍ය සහ පුද්ගලික යන ප්‍රවාහයන් දෙකම සහසම්බන්ධ කරගනිමින් ක්‍රියාත්මක වන අතර මෙම ක්ෂේත්‍ර තුළ පුළුල් ලෙස ආපදා අවදානම් අවමකිරීම පිළිබඳ අවධානයට ලක්කිරීම තුළින් සංවර්ධන ප්‍රවාහය තුළට අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මෙමඟින් ආපදා සිදුවීමේ ප්‍රවණතාවය ඉතාමත් සීඝ්‍රයෙන් අවමකර ගත හැකි අතර එමඟින් මානව, භෞතික සහ මූල්‍ය සම්පත් ආරක්ෂා කරගනිමින් තිරසාර සංවර්ධනයක් කරා රට මෙහෙයවීම සඳහා දායකත්වය ලබාදිය හැක.

ආපදා අවදානම් කළමනාකරණය සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික ක්‍රියාකාරී කමිටුවක් නිර්මාණය කර ඇති අතර විවිධ වූ ක්ෂේත්‍රයන්හි ප්‍රවීණයන් මෙම තාක්ෂණික කමිටුව නියෝජනය කරනු ලබයි. මෙම කමිටුව රැස්වී ව්‍යාපෘතියට අදාළ ඉදිරි ක්‍රියාකාරකම් සැලසුම් කිරීම සහ අධීක්ෂණය කිරීම සිදුකරනු ලබයි.

2019 වසර තුළදී උක්ත තාක්ෂණික කමිටු රැස්වීම් පවත්වන ලද අතර එහිදී, හඳුනාගත් ක්ෂේත්‍ර දහය තුළ ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීමට අදාළ අධීක්ෂණ කටයුතු සිදුකරන ලදී.

මෙම මාර්ගෝපදේශ සැකසීමේ ක්‍රමවේදය පිළිබඳව උපදේශන ආයතනය මඟින් තාක්ෂණික කමිටුව දැනුවත් කල අතර එහිදී තාක්ෂණික කමිටුවේ අදහස් සහ එකඟතා මත මාර්ගෝපදේශ සැකසීම සිදුකරන ලදී. ඉන් අනතුරුව ප්‍රථම කෙටුම්පත තාක්ෂණික ක්‍රියාකාරී කමිටුව වෙත ඉදිරිපත්කර කමිටු සාමාජිකයන්ගේ අදහස් ලබාගන්නා ලද අතර අවස්ථා තුනකදී තාක්ෂණික ක්‍රියාකාරී කමිටුව සමඟ මේ පිළිබඳ සාකච්ඡා කර එම අදහස් අනුව නිර්මාණය කරන ලද අවසන් කෙටුම්පත ද තාක්ෂණික කමිටුව

වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව උපදේශක ආයතනය විසින් එම අවසන් නිමැවුම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත භාරදෙන ලදී.

මේ අනුව පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා වන ආපදා අවදානම් අවමකිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය තුළට අන්තර්ග්‍රහණය කිරීම සඳහා මාර්ගෝපදේශ සැකසීම අවසන්කර ඇත.

01. ජාතික සැලසුම් සම්පාදන
02. නාගරික සංවර්ධන
03. ජාතික සහ පලාත් මහාමාර්ග ඉදිකිරීම් හා සංවර්ධන
04. පළාත්පාලන
05. සංචාරක
06. පුද්ගලික අංශය
07. සෞඛ්‍ය
08. ජල හා සනීපාරක්ෂාව
09. පාරිසරික බලපෑම් අධ්‍යන
10. දේශීය ආපදා කළමනාකරණ ක්‍රමෝපාය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් මෙම මාර්ගෝපදේශ මුද්‍රණය කර අදාළ ක්ෂේත්‍රවලට ලබාදීමට අපේක්ෂිත අතර එම මාර්ගෝපදේශ එක් එක් ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක කිරීම පහසුකරණය කිරීමට අපේක්ෂා කෙරේ. එහිදී තාක්ෂණික ක්‍රියාකාරී කණ්ඩායම් සාමාජිකයන්ගේ මූලිකත්වයෙන් එම ක්ෂේත්‍රවලට අදාළ ආයතන තුළ ආපදා අවදානම් කළමනාකරණය අන්තර්ග්‍රහණය කිරීම සඳහා වූ කමිටු සකස්කර එමඟින් උක්ත මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම සඳහා උනන්දු කිරීමටත් මෙම වැඩසටහන පසුගමනීය කටයුතු සිදුකිරීමටත් අපේක්ෂා කෙරේ.

<u>අධ්‍යාපන ක්ෂේත්‍රය තුළට ආපදා අවදානම් අවමකිරීම අන්තර්ග්‍රහණය කිරීම</u>

ආපදා අවදානම් අවම කිරීම සමාජගත කිරීම සඳහා සුදුසුම මාධ්‍ය ලෙස පාසල් පද්ධතිය හඳුන්වා දිය හැකි අතර කුඩාකල සිට ආපදා අවදානම් කළමනාකරණය ළදරු මනස තුළ රෝපණය කිරීම තුළින් ආපදා අවදානම් අවමකිරීමේ චර්යාත්මක වෙනසක් මිනිස් සමාජය තුළ ස්ථාපනය කිරීමේ අවස්ථාව ඇත.

ආපදා අවදානම් අවමකිරීම ජීවිතයට පුරුද්දක් ලෙස එකතු වීම තුළින් රටේ සමස්ත ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම ක්‍රියාත්මක කිරීම පහසුවනු ඇත. විවිධ ක්ෂේත්‍රයන් තුළ ආපදා අවදානම් අවම කිරීම අන්තර්ග්‍රහණය කිරීම සඳහා කටයුතු සිදුකෙරෙන අතරතුර උක්ත වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම තුළින් තිරසර ආපදා අවදානම් අවමකිරීමේ සංස්කෘතියක් නිරිමාණය කිරීම මෙහි දිගුකාලීන ඉලක්කය වනු ඇත.

ඒ අනුව පාසල් දරුවන් සඳහා මූලික ආපදා කළමනාකරණ මූලධර්ම පිළිබඳ දැනුවත් වෙමින් ආපදා අවදානම් තක්සේරුකරණය පාසල් මට්ටමින් සිදුකිරීම සඳහා අත්පොතක් නිර්මාණය කිරීම 2019 වසර තුළදී සිදුකරන ලද අතර මේ සඳහා විවිධ තාක්ෂණික මූලාශ්‍ර භාවිතා කල අතර අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ණ සහභාගීත්වය සහිතව සිදුකරන ලදී.

නිර්මාණය කරන ලද අත්පොත් 10,000ක් සිංහල මාධ්‍යයෙන් ද, 3,000ක් දමිල මාධ්‍යයෙන් ද, මුද්‍රණය කිරීමට කටයුතු කරන ලද අතර මෙම අත්පොත භාවිතයෙන් ශ්‍රී ලංකාවේ සියලු පාසල් ආවරණ වන පරිදි පාසල් පද්ධතිය තුළ ආපදා අවදානම් තක්සේරුව පිළිබඳ ධාරිතාව සංවර්ධනය කිරීම සඳහා ඉදිරි වසර තුළ කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ.

ආපදා අවදානම් තක්සේරුව

රට තුළ සිදුවී ඇති ආපදා, කාලගුණ සහ දේශගුණික රටා, භූවිෂමතා, ආර්ථික සමාජීය සහ භෞතික පසුබිම, ආදී විවිධ වූ කරුණු පදනම් කරගනිමින් ආපදා අවදානම් තත්වයන් පිළිබඳ යම් පුරෝකථනයක් විද්‍යාත්මකව සිදුකිරීමේ හැකියාවක් පවතින අතර මේ සඳහා විවිධ වූ තාක්ෂණික ආයතන මඟින් සිදුකරනු ලබන පරීක්ෂණ, වාර්තා ආදිය ද ඉවහල් වේ. එමෙන්ම ආපදා තත්වයක් ඇති වුවහොත් එක් එක් ආපදාව අනුව ගොදුරුවිය හැකි ප්‍රදේශ, ආරක්ෂිත ස්ථාන ආදී විවිධ වූ තොරතුරු විධිමත්ව නවීන තාක්ෂණය භාවිතා කරමින් ආපදා කළමනාකරණ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන්ට පරිශීලනය කළහැකි පරිදි සැකසීම ද ඉතාමත් වැදගත් කාරණයක් වේ. එමෙන්ම ආපදා අවදානම් තක්සේරුවට අදාළ තොරතුරු මඟින් ආපදා කළමනාකරණයට අදාළ විවිධ වූ තීරණවලට එළඹීම සහ වැඩසටහන් සැලසුම් කිරීම ද පහසුකරවනු ලැබේ.

දිස්ත්‍රික් මට්ටමින් දත්ත ඒකරාශී කිරීම 2018 වසරේ ආරම්භ කරන ලද අතර ජාතික මට්ටමින් අදාළ පාර්ශවකාර ආයතන මඟින් අවශ්‍ය දත්ත ඒකරාශී කිරීම ද සිදුකරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම පහත පියවර අනුගමනය කරමින් සිදුකරන ලද අතර මේ වන විට ආපදා අවදානම් දර්ශක පොත මුද්‍රණය කර අවසන් කර ඇත.

- දත්ත ඒකරාශී කිරීම - දිස්ත්‍රික් මට්ටමින් සහ විවිධ දත්ත මූලාශ්‍ර මඟින් දත්ත ඒකරාශී කිරීම සිදුකරන ලදී.
- දත්ත ගබඩා කිරීම (database එකක් නිර්මාණය කිරීම)
- දත්ත සැකසීම (data processing)
- දත්ත විශ්ලේෂණය (data analyzing) - එක් එක් ආපදාවට අනුව වෙන වෙනම පහත ක්ෂේත්‍ර පදනම් කරගනිමින් විශ්ලේෂණය කරන ලදී.
  - උවදුරු/ පාත්‍රතා තක්සේරුව
  - ගොදුරුවීමේ හැකියා තක්සේරුව
  - ධාරිතා තක්සේරුව
- අවදානම් දර්ශකය ගණනය කිරීම (risk index calculation)
- වලංගුකරණය (Validation)
- සිතියම් සැකසීම (mapping)
- මුද්‍රණය

මුද්‍රණය කරන ලද සිතියම් පොත් අදාළ ආයතන වෙත බෙදාහැරීම සහ දැනුවත් කිරීම් සිදුකිරීම 2020 වර්ෂය තුළ සිදුකිරීමට අපේක්ෂා කෙරේ. මෙම අවදානම් දර්ශකය වසරින් වසර යාවත්කාලීන කරමින් අවදානම් දර්ශකයේ විචලනයන් අධ්‍යන කල යුතු වන අතර ඒ සඳහා වන ක්‍රියාකාරකම් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.

අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ආපදා අවදානම් තක්සේරුකරණය සිදුකිරීම

ජාතික මට්ටමින් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පාසල් ආපදා අවදානම් තක්සේරුවක් සිදුකිරීමේ අවශ්‍යතාවය අධ්‍යාපන ක්ෂේත්‍රය තුළින්ම අවස්ථා ගණනාවකදීම ඉස්මතු වූ අතර එය කාලීන අවශ්‍යතාවයක් ද විය. ඒ

අනුව 2019 වර්ෂය තුළදී ශ්‍රී ලංකාව තුළ පාසල් සඳහා අවදානම් දර්ශකයක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය මූලික මැදිහත්වීම් සිදුකිරීමට මෙම අංශය මඟින් කටයුතු කරනලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදුකිරීමෙන් අනතුරුව අධ්‍යාපන කලාප අධ්‍යක්ෂකවරුන් සහ විදුහල්පතිවරුන් දැනුවත්කර උක්ත අවදානම් දර්ශකය සැකසීම සඳහා දත්ත ඒකරාශී කිරීමට අදාළ පෝරම බෙදාහැරීම සිදුකර අවසන්කර ඇති අතර එම දත්ත එකතු කිරීම මෙවන විට සිදුකෙරෙමින් පවතී. මෙම දත්ත ඒකරාශී කිරීමෙන් අනතුරුව එම දත්ත පරිගණකගත කර, 2020 වර්ෂයේ මුල් කාර්තුව තුළ මෙම තක්සේරුකරණයට අදාළ වාර්තාව නිමකිරීමට අපේක්ෂා කෙරේ.

පාසල් තුළ ආපදා අවදානම අවමකිරීමට අදාළ තීන්දු තීරණ ගැනීමේදී මෙම මූලාශ්‍රය වැදගත් වන අතර ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ තාක්ෂණික ප්‍රවේශයන් සඳහා ද මහෝපකාරී වනු ඇත.

<u>ආපදාවන්ගේ අහිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීම</u>

ආපදාවන්ගේ අහිමිවීම් හා හානි පිළිබඳ තක්සේරු කිරීමට අදාළ කටයුතු මෙම අංශය මඟින් ඉටුකෙරෙන අතර ඒ සඳහා දත්ත යාවත්කාලීන කිරීමට ක්‍රමවේද නිර්මාණය කිරීම සඳහා හඳුනාගත් ක්ෂේත්‍රයන් ගේ ධාරිතාවය වර්ධනය කිරීම ද මේ යටතේ සිදුකරනු ලැබේ. ඒ අනුව 2019 වර්ෂයේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ උක්ත කාර්ය සඳහා ධාරිතාවය වර්ධනය කිරීමට ජාතික මට්ටමේ වැඩමුළු හතරක් ක්‍රියාත්මක කරන ලදී.

මේ පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ මූලික සාකච්ඡා සිදුකර ඇතිකරගන්නා ලද එකඟතා අනුව වැඩසටහන් සංවිධානය කරන ලදී. අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ දිවයිනේ සියලුම අධ්‍යාපන කලාප නියෝජනය කරමින් නිලධාරීන් 150ක පමණ ප්‍රමාණයක් මේ සඳහා සහභාගී වන ලදී.



අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ දිවයිනේ සියළුම අධ්‍යාපන කලාප නියෝජනය කරමින් ආපදාවන්ගේ අහිමිවීම් හා හානි පිළිබඳ තක්සේරුකරණය කිරීමේ ජාතික මට්ටමේ වැඩමුළු

<u>Desinventar දත්ත ගබඩාව</u>

ආපදා අවදානම් අවම කරමින් සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම පර්යේෂණ කටයුතු පියවරෙන් පියවර දීර්ඝ කාලීනව පුළුල් පරාසයක් තුළ විහිදයන ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කලයුතු වේ. මෙහිදී ආපදා අවදානම් අවමකර ගැනීම පිළිබඳ අධ්‍යන සඳහා පාදක කරගැනීමට නිවැරදිව යාවත්කාලීන වන දත්ත පදනමක් අත්‍යවශ්‍ය කාරණයක් වන අතර මෙම අවශ්‍යතාවය හඳුනාගත් අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් 2008 වසරේ සිට

Desinventar දත්ත ගබඩාව පවත්වාගන යනු ලබන අතර **riskinfo** වෙබ් පිටුව ද යාවත්කාලීන කරනු ලබයි. මෙම සියලු දත්ත අන්තර්ජාලය තුළ විවෘතව පවතින අතර මෙම දත්ත අවශ්‍ය ඕනෑම අයෙකුට අන්තර්ජාලය මඟින් නොමිලේ ලබාගැනීමේ පහසුකම ලබාදී ඇත.

ආපදා සම්බන්ධ පසුගිය තොරතුරු සියල්ල ඇතුළත් දත්ත බැංකුව www.desinventar.lk ලෙස අන්තර්ජාලය වෙත මුදාහැර ඇති අතර එක් එක් සිද්ධීන්ට අදාළව දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ අනුව අදාළ ආපදාවන් යටතේ අදාළ කාලයන් තුළ සිදුවූ මරණ, විපතට පත් ජනතාව හා හානියට පත් දේපල පිළිබඳ තොරතුරු සංඛ්‍යාත්මක වශයෙන් මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් හදිසි මෙහෙයුම් අංශයෙන් නිකුත් කරනු ලබන තත්ව වාර්තාවලින් මෙන්ම සෞඛ්‍ය, වනසංරක්ෂණ, වාරිමාර්ග සහ රිය අනතුරු පිළිබඳ පොලිස් වාර්තා (www.police.lk) වැනි අංශවලින් ලබාගන්නා තොරතුරු ද මෙම දත්ත පද්ධතියට ඇතුළත් කොට ඇත. මෙම දත්ත පද්ධතිය සක්‍රීයව යාවත්කාලීන වන අතර නව දත්ත මූලාශ්‍රයන් හඳුනාගනිමින් වඩාත් නිවැරදි දත්ත පද්ධතියක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු හඳුනාගනිමින් ක්‍රියාත්මක කරනු ලබයි.

දත්ත ගබඩා යාවත්කාලීන කිරීම පිළිබඳවත් දත්ත ගබඩා වැඩිදියුණු කිරීම පිළිබඳවත් අදාළ පාර්ශව ආයතන නියෝජනය කරමින් පාර්ශවකරුවන් 40කගේ සහභාගීත්වයෙන් 2019.06.25 දින වැඩමුළුවක් පවත්වන ලද අතර එහිදී ඇතිකරගත් එකඟතා ක්‍රියාත්මක කරන ලදී.

2019 වසර තුළදී විවිධ ක්ෂේත්‍රවලට අදාළ ආයතන සහ පුද්ගලයන් විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත සිදුකරන ලද ඉල්ලීම් මඟින් මෙන්ම අන්තර්ජාලය තුළින් මෙම දත්ත පද්ධතිය මඟින් දත්ත ලබාගෙන ඇත. නාගරික සංවර්ධන අධිකාරිය, කැලණිය විශ්වවිද්‍යාලය, කොළඹ විශ්වවිද්‍යාලය, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය, කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, සීමාසහිත පාරිසරික පදනම, JICA ආයතනය, MAS CAPITAL වැනි පුද්ගලික ආයතන මෙන්ම ත්‍රිවිධ හමුදාව සහ දෙස් විදෙස් පර්යේෂකයින් මෙම දත්ත පද්ධතිය මගින් දත්ත ලබාගෙන විවිධ පර්යේෂණ සහ තීන්දු තීරණ ගැනීම සඳහා යොදාගෙන ඇත.

Riskinfo අවදානම් තොරතුරු වෙබ්අඩවිය (riskinfo web potal)

භූ විද්‍යාත්මක දත්ත (Geospatial Data) මෙම වෙබ්අඩවියට ඇතුළත් කිරීම (upload) මෙහිදී සිදුකරනු ලබයි. මෙම භූ විද්‍යාත්මක දත්ත දෙස් විදෙස් පර්යේෂකයින් විසින් භාවිතා කරනු ලබන අතර එමඟින් ආපදා සිදුවන, සිදුවිය හැකි ප්‍රදේශ පිළිබඳ අධ්‍යනය කිරීම්, තීරණ ගැනීම් ඉදිරි සැලසුම් සැකසීම් සිදුකරනු ලබයි.

කිසිදු අයකිරීමකින් තොරව අන්තර්ජාලය හරහා මෙම දත්ත ලබාගත හැකි අතර එමඟින් ආපදා කළමනාකරණය පිළිබඳ කටයුතු කරනු ලබන ආයතන සහ පුද්ගලයින් සඳහා සහයවීමත් පර්යේෂණ කටයුතු සඳහා දිරිමත් කිරීමත් සිදුකරනු ලබයි. විශ්ව විද්‍යාලවල අධ්‍යාපනය ලබන සිසු සිසුවියන් සඳහා අවශ්‍ය පුහුණු අවස්ථා ලබාදීමද මේ හරහා අවම කිරීම්, පර්යේෂණ හා සංවර්ධන අංශය මඟින් සිදුකරනු ලබන අතර එමඟින් ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය සඳහා නව මානව සම්පත් බිහිවීම ද මෙහි අතුරු ප්‍රතිඵලයක් ලෙස හැදින්විය හැක.

චන්ද්‍රිකා ඡායාරූප භාවිතාකර ආපදාවට පාත්‍රවූ ප්‍රදේශ සහ තොරතුරු අනාවරණය කිරීම

ආපදා පෙරසුදානම් වීම සඳහා මෙන්ම හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීම් සඳහා, ආපදා සිදුවිය හැකි සහ ආපදා සිදුවී ඇති ප්‍රදේශ මෙන්ම ආපදාවට ලක්වූ පිරිස් පිළිබඳ දත්ත ඉතාමත් වැදගත් සාදකයක් වේ. මෙම දත්ත ලබාගැනීම සඳහා නවීන තාක්ෂණය උපයෝගී කරගනිමින් තොරතුරු අනාවරණය කිරීම අවමකරණ, පර්යේෂණ සහ සංවර්ධන අංශය මඟින් කටයුතු කරනු ලැබේ. මෙහිදී කාලගුණ අනාවැකි පදනම් කර ගනිමින් ආපදා ඇතිවීමට පෙර සහ ආපදා ඇතිවීමෙන් පසු චන්ද්‍රිකා ඡායාරූප ලබාගෙන එම ඡායාරූප විශ්ලේෂණය මඟින් පවතින ද්විතීක දත්ත පදනම් කරගනිමින් උක්ත තොරතුරු ලබාගැනීමට කටයුතු කෙරේ.

ජාත්‍යන්තර චන්ද්‍රිකා තාක්ෂණ ආයතන මඟින් මෙම ඡායාරූප ලබාගන්නා අතර ඒ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත විශේෂිත අවස්ථාවක් "ඉන්ටනැෂනල් චාටර්" (International Charter) සහ "සෙන්ටුඅල් එශියා" (Sentiual Asia) යන ආයතන මඟින් ලබාදී ඇති අතර ආපදාවකට පෙර නිසි ක්‍රමවේද ඔස්සේ මෙම ආයතන වෙත දැනුම් දීමෙන් අනතුරුව එම ආපදා අවදානම් ප්‍රදේශ ආවරණය වන පරිදි චන්ද්‍රිකා ඡායාරූප ලබාගැනීම සිදුකෙරෙන අතර ආපදාවට පෙර සහ පසු ඡායාරූප ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත ලබාදීමට කටයුතු කෙරේ. තාක්ෂණික උපාංග භාවිතයෙන් මෙම ඡායාරූප විශ්ලේෂණය කිරීම ඉන් අනතුරුව සිදුකරනු ලැබේ.

දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම

ආපදා අවම කිරීමට අදාළව මහජනතාව විසින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත යොමුකරනු ලබන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබන අතර යොමුකර ඇති ඉල්ලීම අනුව ඒ සඳහා ප්‍රතිචාර දැක්වීම තීරණය වනු ඇත. මෙහිදී මෙම ලිපි සඳහා විසඳුම් ලබාදීමට ඇති හැකියාව පිළිබඳ අවධානය යොමුකරමින්, පවතින නීති රෙගුලාසි සහ ධාරිතාවයන් අනුව තාක්ෂණික නිර්දේශයන් ද සලකා බලමින් ජනතාව අපේක්ෂා ඉටුකිරීමට දායකවීම අවමකිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ පරමාර්ථය වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ විෂය පරාසය තුළ වන ඉල්ලීම් සඳහා ජාතික මට්ටමින් සහ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකකය හරහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සිදුකර එම පරීක්ෂණ වාර්තා පදනම් කරගනිමින් ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිසි ක්‍රමවේදයන් අනුව තීන්දු තීරණ ලබාගන අවශ්‍ය කටයුතු සිදුකර ඇත. මෙහිදී එක් එක් කාරණය අනුව ඊට අදාළ තාක්ෂණික ආයතනය සහ රේඛීය අමාත්‍යාංශය වෙත උක්ත ඉල්ලීම් යොමුකිරීම ද සිදුකෙරෙන අතර සෑම ලිපි ගනුදෙනුවකදීම ඉල්ලුම්කරු වෙත පිටපතක් යොමු කරමින් ඉල්ලුම්කරු දැනුවත් කිරීම සිදුකරනු ලබයි.

යොමුකරන ලද සෑම ලිපියකටම ලිඛිතව ප්‍රතිචාර දක්වා ඇති අතර සෘජුවම සිදුකල හැකි මහපෙන්වීම් සහ තාක්ෂණික දැනුවත්කිරීම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ඉල්ලුම්කරු වෙත සිදුකර ඇත. 2019 වර්ෂය තුළ මෙවැනි ලිපි 266ක් ලැබී ඇති අතර ඒ සියලුම ලිපි සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

වගුව 4.6: දිස්ත්‍රික් මට්ටමින් මහජන පැමිණිලි, ඉල්ලීම්, යෝජනා, කරුණු විමසීම් සඳහා ප්‍රතිචාර දැක්වීම්

අනු අංක	දිස්ත්‍රික්කය	ඉල්ලීම් ලිපි ගණන												
		මාසය												
		1	2	3	4	5	6	7	8	9	10	11	12	එකතුව
1	මාතර	1	-	2	1	-	-	2	-	-	2	2	-	10
2	කළුතර	-	2	3	-	1	2	2	2	2	3	2	2	21
3	ගම්පහ	2	2	-	2	-	6	1	3	2	1	1	1	21
4	අම්පාර	-	-	-	-	-	-	-	1	-	-	1	1	03
5	පුත්තලම	1	-	-	2	-	1	1	-	-	-	2	-	07
6	හම්බන්තොට	-	-	-	1	-	-	-	-	-	-	2	-	03
7	කුරුණෑගල	1	1	-	1	2	1	1	-	2	1	2	-	12
8	නුවරඑළිය	2	2	1	-	-	-	3	-	1	3	1	2	15
9	මොනරාගල	-	2	2	-	-	2	1	-	-	-	-	-	07
10	මාතලේ	1	2	-	-	1	3	1	-	1	-	2	2	13
11	වව්නියාව	-	-	-	-	-	-	-	-	-	-	-	-	00
12	ත්‍රිකුණාමලය	-	-	-	-	-	-	1	-	-	-	-	-	01
13	පොළොන්නරුව	-	-	-	-	1	1	-	1	-	-	-	-	03
14	කෑගල්ල	2	1	1	-	-	3	1	-	2	-	1	2	13
15	රත්නපුර	3	2	1	1	-	1	1	2	1	4	3	-	19
16	මහනුවර	5	4	3	3	1	2	3	2	2	6	2	2	35
17	ගාල්ල	3	-	-	1	2	-	1	1	1	1	2	1	13
18	කොළඹ	1	9	4	4	4	4	3	6	1	7	2	4	49
19	බදුල්ල	-	-	1	-	-	1	2	1	5	1	4	1	16
20	අනුරාධපුර	-	-	-	-	-	-	-	-	-	-	1	-	01
21	යාපනය	-	-	-	-	-	-	-	-	-	-	-	-	00
22	කිලිනොච්චිය	-	1	-	-	-	-	-	-	-	-	-	-	01
23	මන්නාරම	-	-	-	-	-	-	-	-	-	-	-	-	00
24	මුලතිව්	-	-	-	-	-	-	-	-	-	-	-	-	00
25	මඩකලපුව	1	-	-	-	-	1	-	-	1		-		03
එකතුව		23	28	18	16	12	28	24	19	21	29	30	18	266

4.8 වෙනත් ව්‍යාපෘතීන්

➢ JICA ව්‍යාපෘතිය

කාලගුණික විපර්යාස හේතුවෙන් සිදුවන අවදානම් තත්ත්ව පාදක කරගනිමින් කැළණි ගඟ ද්‍රෝණිය තුළ පවතින අවදානම් අවමකිරීම සඳහා JICA ආයතනය සමඟ විශේෂිත ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා මේ වනවිට එකඟතාවය ඇතිකරගනිමින් අදාළ ගිවිසුම්වලට එළඹීමට මෙම වසර තුළ හැකිවිය.

ඒ අනුව 2010 වසර තුළ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යෝජිත අතර ඉදිරි වසර හතරක කාලය තුළ ව්‍යාපෘති ඉලක්ක සපුරාගැනීමට අපේක්ෂා කෙරේ.

5. පෙර සූදානම් හා සැලසුම් අංශය

5.1 හැඳින්වීම

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනත මඟින් නියම කර ඇති පරිදි දිස්ත්‍රික්ක, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, අවදානමට ලක්ව ඇති ග්‍රාම නිලධාරී කොට්ඨාස සහ රාජ්‍ය අංශයේ ආයතන ආදිය සඳහා ආපදා කළමනාකරණ සැලසුම් පිළියෙළ කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙර සූදානම් හා සැලසුම් අංශයේ ප්‍රධාන කාර්යයක් වේ. ගංවතුර, නායයෑම්, සුනාමි, සුළි සුළං ආදි ශ්‍රී ලංකාව තුළ වාර්ෂිකව ඇතිවන උවදුරු සඳහා ආපදා පෙර සූදානම් කටයුතු සැලසුම් කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පෙරසූදානම් හා සැලසුම් අංශය මඟින් ක්‍රියාත්මක කරනු එක් කාර්යයක් වේ.

ආපදාවන් සිදුවන විට එයට ප්‍රතිචාර දැක්වීම සඳහා දිස්ත්‍රික් මට්ටමේ යාන්ත්‍රණයක් නිර්මාණය කිරීමට සහාය වන කෘත්‍යාත්මක ලේඛණයක් ලෙස ආපදා පෙර සූදානම් සැලැස්ම හැඳින්විය හැකිය. දිස්ත්‍රික්කයන් තුළ සිදුවන ආපදා සඳහා ප්‍රතිචාර දක්වන ඉහළම කළමනාකාරීත්ව ආයතන වන්නේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුවයි. කමිටුවේ සාමාජිකත්වය, අනු කමිටු සහ ඔවුන්ගේ කාර්යභාර්යයන් සහ වගකීම් මොනවා ද යන්න සැලැස්ම තුළ ලේඛණ ගත කර ඇත.

පරිපාලන ප්‍රදේශය පිළිබඳ තොරතුරු, පවතින උවදුරු, අවදානම් තත්ත්වවල ප්‍රතිඵල සහ සිදුකරන ලද අවදානම් තත්ත්ව ඇගයීම්, ප්‍රධාන මධ්‍යස්ථාන පිළිබඳ තොරතුරු, ප්‍රදේශය තුළ පවතින මානව හා භෞතික සම්පත් සහ ව්‍යසන ප්‍රතිචාර යාන්ත්‍රණය හා සම්බන්ධ විවිධ පාර්ශවකරුවන්ගේ වගකීම් පිළිබඳ තොරතුරු මෙම සැලසුම්වල අන්තර්ගත වේ.

5.2 දිස්ත්‍රික් මට්ටමේ පෙර සුදානම් සැලසුම්

2019 වර්ෂයට ලැබුණු රු.මි.18 යොදා දිස්ත්‍රික් මට්ටමේ වැඩසටහන් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලද අතර එහි මූල්‍ය ප්‍රගතිය 99.51%ක් ලෙසත්, භෞතික ප්‍රගතිය 100%ක් ලෙසත් වාර්තා වී ඇත.

2019 වර්ෂයේදී දිස්ත්‍රික් 25 තුළ ව්‍යසන සඳහා පෙර සූදානම් සැලසුම් කටයුතු නිර්මාණය කිරීම සහ ඒ පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා රු. මිලියන 18ක මුදලක් වෙන් කරන ලදී. රටෙහි ආර්ථික තත්වය සහ ව්‍යසන මඟින් ප්‍රජාවට ඇතිවන බලපෑම සැලකිල්ලට ගනිමින් දිස්ත්‍රික්ක වෙත ප්‍රතිපාදන මුදා හරිනු ලැබේ. දිස්ත්‍රික්ක අතර ප්‍රතිපාදන බෙදා හැරීම සිදු කරන ලද ආකාරය සහ එහි භෞතික හා මූල්‍ය ප්‍රගතිය පහත දැක්වේ.

වගුව 5.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2017 - 2019

වර්ෂය	මහා භාණ්ඩාගාරයෙන් අනුමත වූ ප්‍රතිපාදන (රු. මිලියන)	වියදම (රු. මිලියන)
2017	19.8	19.5
2018	25.0	24.93
2019	18.0	16.8



සටහන 5.1: දිස්ත්‍රික් අතර ප්‍රතිපාදන බෙදා හැරීම හා වියදම් කිරීම 2017 - 2019

දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටමින් ව්‍යාසන කළමනාකරණ සක්‍රියතාවය සවිමත් කිරීම උදෙසා විවිධ පෙර සූදානම් සැලසුම් කටයුතු සඳහා 2019 වර්ෂය තුළදී පෙර සූදානම් සැලසුම් අංශය විසින් ප්‍රතිපාදන වෙන් කර දෙන ලදී. ව්‍යාසන කළමනාකරණ සැලසුම් මුද්‍රණය කිරීම සහ පිළියෙල කිරීම / සමාලෝචනය කිරීම සඳහා පාර්ශවකාර රැස්වීම්, වැඩමුළු සඳහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමින් ප්‍රතිපාදන ලබා දී ඇත.

සුනාමි, ජලගැලීම් සහ නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම උවදුරු සිතියම්ගත කිරීම, අවදානම් තත්ත්ව විශ්ලේෂණය, ග්‍රාමීය මට්ටමේ ව්‍යාසන කළමනාකරණ කමිටු ස්ථාපනය කිරීම වැනි ප්‍රජා මට්ටමේ ව්‍යාසන ප්‍රතිචාර වැඩසටහන් පැවැත්වීම, ජලාශ වේලි බිඳී යාමට පූර්වෝපායක් ලෙස, ජලාශ වේලි පහළ බෑවුමේ ජීවත්වන ජනතාව සඳහා හදිසි අවස්ථා තත්ව සඳහා ප්‍රතිචාර දැක්වීමට ප්‍රජා සහභාගීත්වය සහිත පෙර සූදානම් සැලසුම් නිර්මාණය කිරීම හා දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම සඳහා ද මෙම අංශය විසින් ප්‍රතිපාදන සලසා දෙනු ලැබේ.

5.3 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන

කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික් මට්ටමින් සිදුකරන ලද අතර රු. මිලියන 0.38ක ප්‍රතිපාදන යොදාගනිමින් පවත්වන ලදි. 2019 වර්ෂය තුළ දිස්ත්‍රික් 12ක මෙම වැඩසටහන් පවත්වන ලද අතර එහි භෞතික ප්‍රගතිය 100%කි.

5.4 දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලැස්ම

2019 දෙසැම්බර් මස 31 වන විට දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සැලසුම් දිස්ත්‍රික් 14ක පමණක් සකස් කර අවසන් කරන ලදි. ඒ සඳහා රු. මිලියන 2.21ක ප්‍රතිපාදන ලබාදෙන ලදි.

5.5 දිස්ත්‍රික් මට්ටමේ පෙරහුරු වැඩසටහන

- **දිස්ත්‍රික් මට්ටමින් ගංවතුර හා නායයෑම් පිළිබඳ පෙරහුරු වැඩසටහන**

මෙම වැඩසටහන් යටතේ කළුතර, ගාල්ල, මාතර, රත්නපුර, ත්‍රිකුණාමලය, අම්පාර හා කිළිනොච්චි යන දිස්ත්‍රික්කයන්හි පෙරහුරු වැඩසටහන් පවත්වන ලදි. ඒ සඳහා පෙර සූදානම් අංශය විසින් රු. මිලියන 1.73ක ප්‍රතිපාදන වෙන් කරන ලදි. ගංවතුර හා නායයෑම් ආපදාවට ලක්වන දිස්ත්‍රික්කයන්හි පවත්වන ලද ගංවතුර හා නායයෑම් පෙරහුරු වැඩසටහන් සඳහා සහභාගී වූ පිරිස සහ ඒ සඳහා වූ වියදම් පහත පරිදි විය.

වගුව 5.2: දිස්ත්‍රික්කවල පවත්වන ලද පෙරහුරු වැඩසටහන් පිළිබඳ සාරාංශය

	දිස්ත්‍රික්කය	වියදම් කළ මුදල (රු.)	සහභාගී වූ පිරිස
1	කළුතර	260,625.00	1825
2	ගාල්ල	324,040.00	2353
3	මාතර	353,980.00	2160
4	රත්නපුර	388,805.00	3476
5	ත්‍රිකුණාමලය	302,070.00	3021
6	අම්පාර	198,585.00	983
7	කිළිනොච්චි	58,498.00	581
		1,886,603.00	**14399**

ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් හඳුනාගැනීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන්ගේ වගකීම් ඔවුන්ට අවබෝධ කරවීම, ආපදා ප්‍රතිචාර කටයුතුවල යෙදෙන පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම හා අවබෝධය වැඩිකිරීම, ආපදා ප්‍රතිචාර කටයුතු සඳහා දිස්ත්‍රික් ධාරිතාවයන් හා දුර්වලතා හඳුනාගැනීම, මුලදී සැලසුම් කළ පෙරහුරු සැලැස්ම හා සැලසුම් කළ යාන්ත්‍රණය පරීක්ෂාවට ලක් කිරීම, දිස්ත්‍රික් ලේකම් කාර්යාල රාජ්‍ය යාන්ත්‍රණය සහ පළාත් සභා යාන්ත්‍රණය අතර සබඳතාවය හා දේශපාලන මැදිහත්වීම ආපදා ප්‍රතිචාර කටයුතුවල යොමුගත කිරීම, අවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාවට අවශ්‍ය ආපදා ප්‍රතිචාර කටයුතු කාර්යක්ෂම කිරීම, ආපදා අවදානම් කලාපවල ජීවත් වන ප්‍රජාව හා බාහිර පාර්ශවකරුවන් අතර සම්බන්ධීකරණය තහවුරු කිරීම, වඩාත් ගුණාත්මක හා කාර්යක්ෂම ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයක් සියළු පාර්ශවකරුවන් හා ප්‍රජාව අතර තහවුරු කිරීම, සමාජය තුළ ආපදා පෙර සූදානම් සංස්කෘතියක් හා සුරක්ෂිත සංස්කෘතියක් සඳහා ප්‍රජාව හුරු කිරීම මෙම වැඩසටහනේ අරමුණ වේ.





ගංවතුර පෙරහුරු වැඩසටහන - නාගොඩ ප්‍රා. ලේ. කොට්ඨාසය

5.6 විශාල ජලාශ වේලි ආශ්‍රිත ව්‍යසන සම්බන්ධයෙන් පෙර සුදානම් කටයුතු

සුළි සුළං හෝ භූවලනයන් හෝ සිදුවන අවස්ථාවකදී ජලාශ වේලි ආශ්‍රිතව ආපදා ඇතිවීමට ඇති ඉඩකඩ සැලකිල්ලට ගනිමින්, තෝරාගත් ප්‍රධාන ජලාශ වේලි පාමුල ජීවත්වන ප්‍රජාවන්ගේ පෙර සූදානම් හැකියාව ඉහළ නැංවීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී. 2019 වර්ෂය තුළ වේලි ආශ්‍රිත දැනුවත් කිරීම් හා පෙරහුරු වැඩසටහන් 19ක් හම්බන්තොට, රත්නපුර, කුරුණෑගල, අනුරාධපුර, පොළොන්නරුව, අම්පාර, කිළිනොච්චිය, මහනුවර හා නුවරඑළිය යන දිස්ත්‍රික්කවල පවත්වා ඇත. සෝදිසි හා මුදවා ගැනීම්, ප්‍රථමාධාර කඳවුරු කළමනාකරණය සහ ගම්මානවල ආරක්ෂාව යනාදී කටයුතු අනු කමිටු නිර්මාණය කිරීම පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරණ යාන්ත්‍රණයන් නිර්මාණය කිරීම, සංඥා පුවරු ප්‍රදර්ශනය කිරීම සහ අවසාන වශයෙන් ආරක්ෂිත ස්ථාන කරා ජනතාව රැගෙන යාම පිළිබඳ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මඟින් ජලාශ වේලි පාමුල ජීවත්වන අවදානමට ලක්ව ඇති ප්‍රජාවන් සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් මෙම වැඩසටහනට ඇතුළත් විය.

5.7 රට තුළ දියේ ගිලීම නිසා සිදුවන මරණ සංඛ්‍යාව අඩු කිරීම

ශ්‍රී ලංකාව තුළ දියේ ගිලීම නිසා සිදු වී යයි වාර්තා වන මරණ සංඛ්‍යාව වැඩිවීමේ නැඹුරුතාවයන් පසුගිය වසර කිහිපය තුළ ඇති විය. මෙම වැඩසටහනෙහි අරමුණ වනුයේ, අවදානමට ලක්ව ඇති ප්‍රදේශවල සංඥා පුවරු සවිකිරීම සහ එමඟින් අනතුරුදායක පොකුණු ගංඟා සහ වැව් තුළ දිය නෑම සිදු නොකරන ලෙස ජනතාව දැනුවත් කිරීම වේ. මාතර, බදුල්ල, මාතලේ, කෑගල්ල, රත්නපුර, කුරුණෑගල, අනුරාධපුර, යාපනය, මුලතිව් හා මන්නාරම යන දිස්ත්‍රික්ක තුළ දියේ ගිලීම් සංඥා පුවරු 215ක් ස්ථාපිත කරන ලදි.

වගුව 5.3: එක් එක් දිස්ත්‍රික්කවල ස්ථාපිත කර ඇති සංඥා පුවරු සංඛ්‍යාවන්

දිස්ත්‍රික්කය	සංඥා පුවරු සංඛ්‍යාව
මාතර	10
බදුල්ල	10
මාතලේ	30
කෑගල්ල	55
රත්නපුර	30
කුරුණෑගල	10
අනුරාධපුර	10
යාපනය	30
මුලතිව්	10
මන්නාරම	20
මුළු එකතුව	**215**

5.8 රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීම

රෝහල් හදිසි පෙර සූදානම් සැලසුම් සකස් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ රෝහල් සේවක සේවිකාවන්ගේ ආරක්ෂාව, රෝගීන්ගේ ආරක්ෂාව, හදිසි ආපදා අවස්ථාවකදි රෝහල් කරා එන රෝගීන්ට, ඔවුන්ට ප්‍රතිකාර ලබා දීම හා ඊට ප්‍රතිචාර දැක්වීම සඳහා සැලසුම් සකස් කිරීම වේ. මෙම

වැඩසටහන තුළදී රෝහල තුළ හා අවට ප්‍රදේශවල ස්වභාවික ආපදාවලට ඇතිවන ආපදා හඳුනාගෙන එම තොරතුරු සිතියම් ගතකර ඒ අනුව එම ආපදා අවම කිරීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම, දැනුවත් කිරීම හා පෙරහුරු වැඩසටහන් පැවැත්වීම පිළිබඳ තොරතුරු ඇතුළත් සැලැස්මක් වේ. මෙම වැඩසටහන් දිස්ත්‍රික්ක 22ක ක්‍රියාත්මක කර අවසන් කර ඇත.



රෝහල් ආරක්ෂණ වැඩසටහන - මහමෝදර රෝහල

5.9 පාසල් ආපදා ආරක්ෂණ වැඩසටහන්

අධ්‍යාපන අමාත්‍යාංශය හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය එක්ව ආපදා අවදානම් ඇති පාසල්වල පාසල් ළමුන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් 25 තුළ මෙම වැඩසටහන් 79ක් 2019 වසරේදී පවත්වන ලදි. මෙම වැඩසටහන් මඟින් පාසල් ළමුන් හා ගුරුවරුන් සමඟ එම පාසලේ ආපදා අවදානම් සිතියම් සකස් කිරීම, ආපදා පිළිබඳ දැනුවත් කිරීම සහ පෙරහුරු වැඩසටහන් පැවැත්වීම මෙහි අරමුණ වේ.



භික්කඩුව රත්නසාර විදුහල් පාසල් ආරක්ෂණ වැඩසටහන හා සීනිගම ශ්‍රී විමලබුද්ධි විදුහල් පාසල් ආරක්ෂණ වැඩසටහන

5.10 ප්‍රාදේශීය මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා සමාජ සවිබල ගැන්වීම්, සුභ සාධන හා කන්ද උඩරට උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව දිස්ත්‍රික් මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා ආපදා කළමනාකරණ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන යටතේ ආරක්ෂිත ස්ථාන හඳුනා ගැනීම හා ආපදා අවදානම් සිතියම් සකස් කර හදිසි ආපදා අවස්ථාවන්හි දී ග්‍රාමීය ජනතාව වෙත දැනුම් දීමේ ක්‍රමවේදයක් සකස් කිරීම කරනු ලැබේ. මේ වන විට දිස්ත්‍රික්ක 10ක ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් 87ක් 2019 වසරේදී ක්‍රියාත්මක කර අවසන් කර ඇත. මෙම වැඩසටහන සඳහා රු. 3,560,000.00ක මුදල් දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක වෙත ලබාදෙන ලදි.

වගුව 5.4: 2019 වර්ෂය තුළ පවත්වන ලද පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ප්‍රමාණයන් හා සහභාගී වූ ප්‍රමාණයන්

	දිස්ත්‍රික්කය	වැඩසටහන් ප්‍රමාණය	සහභාගී වූ ප්‍රමාණය
01	කොළඹ	13	12200
02	මාතර	04	
03	බදුල්ල	04	
04	කුරුණෑගල	09	
05	අනුරාධපුර	13	
06	ත්‍රිකුණාමලය	05	
07	මඩකලපුව	09	
08	අම්පාර	18	
09	මොනරාගල	06	
10	පුත්තලම	06	

5.11 මෝසම් පෙර සූදානම් වැඩසටහන - ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය

නිරිත දිග මෝසම හා ඊසාන දිග මෝසම බලපාන දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු සමඟ කළ පෙර සූදානම් ක්‍රියාකාරකම් ලෙස පූර්ව අනතුරු ඇඟවීමේ ක්‍රමවේදය, හදිසි ස්ථානගත කිරීම්, කණ්ඩායම් ස්ථානගත කිරීම හා සහන සේවා කටයුතු හා කඳවුරු කළමනාකරණය පිළිබඳව සාකච්ඡා කරනු ලබයි. ඒ මඟින් සිදුවිය හැකි ජීවිත හා දේපල හානිය අවම කර ගැනීමට බලාපොරොත්තු වේ.

ජාතික මට්ටමෙන් කාලගුණික ආයතන ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් අධික වර්ෂාව හා සුළි සුළං පිළිබඳව ද ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් නායයෑම් පිළිබඳව ද වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ජල ගැලීම් පිළිබඳව ද අනාවැකි හා පුරෝකථනයන් පාදක කර ගනිමින් ජාතික මට්ටමේ පාර්ශවකාර ආයතන සහ ප්‍රතිචාර දැක්වීමේ කණ්ඩායම් ලෙස ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සමඟ මූලික සාකච්ඡා පවත්වන අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටම දක්වා රාජ්‍ය නිලධාරීන් හා ආපදා සඳහා ගොදුරුවන ජනතාව ඊට මුහුණ දී ජීවිත හා දේපලවලට සිදුවන හානිය අවම කර ගැනීමට මේ තුළින් බලාපොරොත්තු වේ.

මෙම වැඩසටහන මඟින් දිවයිනට වාර්ෂිකව බලපාන නිරිත දිග මෝසම් හා ඊසාන දිග මෝසම් කාලවකවානුවලදී දිවයිනට බලපාන අධික වර්ෂාපතනයත්, දැඩි සුළං තත්වයන් පදනම් කරගෙන එයට ගොදුරු වන දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටු කැඳවා බලපෑ හැකි තත්වයන් (ගංවතුර, නායයෑම්, සුළි සුළං) සඳහා අදාළ දිස්ත්‍රික්ක සූදානම් කිරීම අරමුණු වේ.

2019 වර්ෂය තුළදී මෝසම් පෙර සූදනම් වැඩසටහන් ජාතික, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් දිස්ත්‍රික් 25 තුළම වැඩසටහන් 152ක් සිදුකර අවසන් කරන ලදි.





දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මෝසම් වැඩසටහන් - ගාල්ල දිස්ත්‍රික්කය

5.12 ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම 2018 – 2030

2005 අංක 13 දරන ව්‍යසන කළමනාකරණ පනතට අනුකූලව ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම මූලික කොට ගනිමින් අනෙකුත් සියලුම සැලසුම් සකස් කළ යුතු වේ. ජාතික ආපදා කළමනාකරණ සැලැස්ම ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ සම්බන්ධ පුළුල් රාමුව නියෝජනය කරන අතර එමඟින් රට තුළ ආපදා අවදානම අවම කිරීම සම්බන්ධ පස් අවුරුදු සැලැස්මකි. ආපදා කළමනාකරණ පනතට අනුකූලව ඉහත සැලසුම පාදක කොට ගනිමින් ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම, ආයතනික ආපදා කළමනාකරණ සැලසුම් හා අනෙකුත් ආපදා කළමනාකරණ සැලසුම් සකස් කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ ආපදා අවදානම අවම කිරීම සඳහා වූ සෙන්දායි රාමුවට අනුකූලව සකස් කරන ලද 2018 – 2030 දක්වා වූ ජාතික ආපදා කළමනාකරණ සැලැස්මේ පළමු කෙටුම්පත මේ වනවිට නිකුත් කර ඇති අතර එහි පළමු හා දෙවන වෙළුම (ක්‍රියාකාරකම් ලයිස්තුව) සියලුම ආපදා කළමනාකරණය හා සම්බන්ධ හවුල්කාර ආයතන වෙත යෝජනා හා අදහස් සඳහා යොමු කර ඇත.

5.13 සංයුක්ත සැලැස්ම (2020 – 2024) සහ ප්‍රධාන කාර්යය දර්ශක සැකසීම (KPI)

සංයුක්ත සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය වසර ගණනාවක සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අවශ්‍යතාවයක් ලෙස පැවතුණි. ආයතනයට ප්‍රතිඵල මූලික කළමනාකරණ ක්‍රියාවලියක් නිර්මාණය කිරීම උදෙසා (Results Based Management) මෙම සැලසුම මඟින් ක්‍රියාවට නැංවීමට උත්සහ කර ඇත. ඒ අනුව ප්‍රධාන කාර්යය දර්ශක සැකසීම (KPI) මූලික කරගත් ක්‍රියාකාරී රාමුවක් 2020 – 2024 කාලසීමාව උදෙසා නිර්මාණය කර ඇත.

මෙමඟින් ආයතනයේ සමස්ත වැඩ ගොනුව (Work Basket) හා විවිධ අංශයන්හි හඳුනාගත් නිශ්චිත වැඩ ගොනු (Divisions work basket) අදාළ වර්ෂයන්හි ඉටුකරන ආකාරය පිළිබඳව පැහැදිලි කර ඇත. ඒ අනුව මෙමඟින් අපේක්ෂා කරනුයේ ප්‍රතිඵලදායි කළමනාකරණ රාමුවකින් අයතනය ඉදිරි වසර පහ තුළ ඉදිරියට ගෙන යාමයි.

මෙහි ඉදිරි ක්‍රියාමාර්ග වශයෙන් වර්ෂයට අලුත්වන ලෝක ප්‍රවණතා මත මෙන්ම ගෝලීය ආපදා අවදානම් කළමනාකරණ සම්මුතීන් ඔස්සේ නව ක්‍රියාකාරකම් උදෙසා එක් එක් අංශයන් සඳහා මෙන්ම එහි නිලධාරීන් සඳහා ද වැඩ ගිවිසුම් එකඟතා (Work Agreements) ඇති කර ගැනීමට ඉඩකඩ සලසා ඇත. එමඟින් ඉහළ පරිපාලනයට ආයතනයේ එක් එක් සේවකයින් සිදුකරන සෑම ක්‍රියාකාරකමක්ම

ප්‍රතිඵලදායී භාවයක් කාර්යය සාධනයෙහි ඇගයුමත් මැනවින් තක්සේරු කළ හැකි අතර එය සමස්ත ආයතනයේ අභිවෘද්ධියට ඉවහල් වේ. ඒ තුළ රජය විසින් රාජ්‍ය සේවයෙන් අපේක්ෂිත ප්‍රතිඵල මූලික සේවාව ලබා ගැනීම සඳහා මෙම සැලැස්ම ඉවහල් වනු ඇත.

06. පුහුණු හා දැනුවත් කිරීමේ අංශය

6.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතින් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කාර්යභාරය කාර්යක්ෂමව හා ඵලදායිව රට තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සහ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වෙත පැවරී ඇති අතර ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ අංශය ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ මහජනතාව හා අදාළ පාර්ශව දැනුවත් කිරීම හා පුහුණු කිරීමේ කාර්යභාරය ඉටුකරමින් සිටී. 2019 වර්ෂයේ ජාතික, දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටම මෙන්ම ග්‍රාමීය මට්ටම දක්වා දිවයිනේ සියලු දිස්ත්‍රික් ආවරණය වන පරිදි ඒ ඒ දිස්ත්‍රික් තුළ පවතින ආපදා අවදානම් තත්වය තේරුම් ගෙන ඒ අනුව පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 24 පුරාම ප්‍රමුඛතා අනුව පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් පුළුල් ලෙස ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් සඳහා සහභාගී වී ඇති පිරිස 29,403 කි. පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්වලට අමතරව ජාතික හා දිස්ත්‍රික් මට්ටමින් ප්‍රදර්ශන හරහා ද ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳව මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම් සිදුකරන ලදි. ඒ අනුව ප්‍රදර්ශන නැරඹීමට පැමිණි පිරිස දළ වශයෙන් 61000 කි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂයේ මහා භාණ්ඩාගාරයෙන් රු. මිලියන 19.5ක මූල්‍ය ප්‍රතිපාදන ලැබුණු අතර එහි මූල්‍ය ප්‍රගතිය 98%ක් වන අතර භෞතික ප්‍රගතිය 100%ක් ලෙස වාර්තා වී ඇත. 2013 - 2019 දක්වා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණය පහත රූපසටහන මඟින් දැක්වේ.



සටහන 6.1: පුහුණු හා දැනුවත් කිරීම් අංශය සඳහා 2013 සිට 2019 දක්වා වෙන් කරන ලද ප්‍රතිපාදන

ජාතික මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දැනුවත් කිරීමේ අංශය මඟින් මෙහෙය වූ අතර දිස්ත්‍රික්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හා ග්‍රාමීය මට්ටමේ

වැඩසටහන්, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක මඟින් ක්‍රියාත්මක කරන ලදි. මෙම වැඩසටහන් අධීක්ෂණය අධ්‍යක්ෂ පුහුණු හා දැනුවත් කිරීම් මඟින් සිදු කරන ලදි. ඒ අනුව 2019 වර්ෂය ක්‍රියාත්මක කළ ජාතික මට්ටමේ සිට ග්‍රාමීය මට්ටම දක්වා වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක විස්තරය පහත සඳහන් වේ.

1. **ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය හා ජාතික තරුණ සේවා සභාව හා එක්ව තරුණ තරුණියන් ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායක කර ගැනීමේ වැඩසටහන.**

ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම වර්ධනය කරමින් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ යොවුන් සේනාංකයන්හි පුහුණුවන තරුණ තරුණියන් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම මෙම වැඩසටහනේ මූලික අරමුණ වේ.

ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා ජාතික යොවුන් සේනාංකය එක්ව යොවුන් සේනාංක මධ්‍යස්ථාන 48ක පුහුණුව ලබන තරුණ තරුණියන් ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දී ඔවුන් දිස්ත්‍රික් මට්ටමින් හදිසි අවස්ථාවලදී මෙන්ම ආපදා කළමනාකරණ වැඩසටහන්වලට දායක කර ගැනීමේ ක්‍රමවේදයක් යටතේ මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදි. 2019 වර්ෂයේ එවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් දිස්ත්‍රික්ක 25 සඳහාම පැවැත් වූ අතර ඒ සඳහා තරුණ තරුණියන් 6831ක් සහභාගී වී ඇත. මීට අමතරව ජාතික තරුණ සේවා සභාව හා ඒකාබද්ධව ප්‍රාදේශීය මට්ටමින් තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් ද ක්‍රියාත්මක කරන ලද අතර ඒ සඳහා තරුණ තරුණියන් 668ක් සහභාගී වී ඇත. 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

වගුව 6.1: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සහ ජාතික යොවුන් සේනාංකය හා ජාතික තරුණ සේවා සභාව හා එක්ව තරුණ තරුණියන් ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායක කර ගැනීමේ වැඩසටහන් සඳහා සහභාගී වූ ප්‍රමාණය

අංකය	දිස්ත්‍රික්කය	වැඩසටහන	සහභාගී වූ ප්‍රමාණය
01	අම්පාර (කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)	තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පුහුණු කිරීම	65
02	අම්පාර (ආලයඩිවෙම්බු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)	තරුණ ස්වේච්ඡා කණ්ඩායම් පුහුණු කිරීම	69
03	බදුල්ල	තරුණ ස්වේච්ඡා සංචිත පුහුණු කිරීම	126
04	යාපනය (කෝපායි ප්‍රා.ලේ කොට්ඨාශය)	තරුණ ස්වේච්ඡා නිළධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	35
05	නුවර (ගඟවටකෝරලේ හා පූජාපිටිය ප්‍රා.ලේ කොට්ඨාශය)	තරුණ ස්වේච්ඡා නිලධාරීන් සඳහා ජීවිතාරක්ෂණ පුහුණු වැඩසටහන	134
06	කෑගල්ල (යටියන්තොට, බුලත්කොහුපිටිය, රුවන්වැල්ල, දැරණියගල ප්‍රා.ලේ කොට්ඨාශය)	වතු ආශ්‍රිත තරුණ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන	132
07	නුවරඑළිය	තරුණ සේවා නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	50
08	බදුල්ල	තරුණ ස්වේච්ඡා සංචිත පුහුණු කිරීම	57
එකතුව			**668**





ආපදා කළමනාකරණය පිළිබඳ තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු කිරීම- කෑගල්ල දිස්ත්‍රික්කය





ආපදා කළමනාකරණය පිළිබඳ තරුණ ස්වෙච්ඡා කණ්ඩායම් පුහුණු කිරීම - ගම්පහ දිස්ත්‍රික්කය

2. ආපදා කළමනාකරණය පිළිබඳ පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් ප්‍රජාව දැනුවත්කර පාසල් සිසුන්ගේ ජීවිත හා දේපළ සුරක්ෂිත කිරීම උදෙසා වූ පුළුල් වැඩසටහනක් 2018 වර්ෂයේ සිට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ආරම්භ කරන ලදි. එහිදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන් අතර සම්බන්ධීකරණය ගොඩ නැගීම, පාසල් ආපදා ආරක්ෂණ මාර්ගෝපදේශය පිළිබඳ විදුහල්පතිවරුන්ගේ, පාසල් ගුරුවරුන්ගේ දැනුම අවබෝධය දියුණු කර සියළුම පාසල් සඳහා පාසල් ආපදා ආරක්ෂණ සැලසුම් සකස් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කිරීම මෙමඟින් සැලසුම් කරන ලදි. ඒ අනුව 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

වගුව 6.2: 2019 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

අංකය	වැඩසටහන	දිස්ත්‍රික්කය	සහභාගී වූ ප්‍රමාණය
1	පාසල් සුරක්ෂිතතාව පිළිබඳ ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු නිලධාරීන් එක්ව අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් සමඟ වැඩසටහනේ ප්‍රතිපත්ති පිළිබඳව පැවති සාකච්ඡාව	කොළඹ- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය	13
2	පාසල් සුරක්ෂිතතාව පිළිබඳ වැඩසටහන අධ්‍යාපන කලාප සහකාර අධ්‍යක්ෂකවරු හා දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂකවරු දැනුවත් කිරීම	කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට, කෑගල්ල, රත්නපුර, නුවර	50

3	පාසල් සුරක්ෂිතතාව පිළිබඳ අධ්‍යාපන කලාප සහකාර අධ්‍යක්ෂකවරු හා සහකාර අධ්‍යක්ෂකවරු දැනුවත් කිරීම	බදුල්ල, මොනරාගල, අනුරාධපුර, පොලොන්නරුව, පුත්තලම, කුරුණෑගල, මාතලේ, නුවරඑළිය, කළුතර	50
4	පාසල් සුරක්ෂිතතාව පිළිබඳ අධ්‍යාපන කලාප සහකාර අධ්‍යක්ෂකවරු හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල සහකාර අධ්‍යක්ෂකවරු දැනුවත් කිරීම	යාපනය, මන්නාරම, මුලතිව්, කිළිනොච්චිය, වව්නියා, ත්‍රිකුණාමලය, අම්පාර සහ මඩකලපුව	45
5	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	කොළඹ- ශ්‍රී ජයවර්ධනපුර කලාපය	70
6	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	කොළඹ- හෝමාගම කලාපය	80
7	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	ගම්පහ- කැළණිය කලාපය	120
8	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	කොළඹ- කොළඹ කලාපය	120
9	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	කෑගල්ල- කෑගල්ල කලාපය	150
10	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	ගාල්ල- ගාල්ල කලාපය	150
11	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පස් අවුරුදු සැළැස්ම හඳුන්වා දීම	ගාල්ල-අම්බලන්ගොඩ, ඇල්පිටිය, උඩුගම කලාප	250
12	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	නුවරඑළිය- හැටන් අධ්‍යාපන කලාපය	121
13	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීම	කොත්මලේ අධ්‍යාපන කලාපය	57
14	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ගුරු උපදේශකවරු පුහුණු කිරීමේ වැඩසටහන	කළුතර, රත්නපුර, කෑගල්ල, ගාල්ල, මාතර, හම්බන්තොට, කොළඹ, ගම්පහ, නුවර	25
15	ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ ගුරු උපදේශකවරු පුහුණු කිරීමේ වැඩසටහන	අනුරාධපුර, පොලොන්නරුව, කුරුණෑගල, පුත්තලම, නුවරඑළිය, මාතලේ, බදුල්ල සහ මොණරාගල	35
16	අධ්‍යාපන කලාපයන් හී සංවර්ධන නිලධාරීන් සඳහා අවදානම් කළමනාකරණය පිළිබඳ වැඩසටහන	බදුල්ල	55
එකතුව			**1391**

3. ජාතික හා ප්‍රාදේශීය මට්ටමේ ප්‍රදර්ශණ හරහා ආපදා කළමනාකරණය පිළිබඳ පාසල් සිසුන් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳවත් හදිසි අවස්ථාවලදී ප්‍රතිචාර දැක්වීම පිළිබඳවත් න්‍යායාත්මක හා ප්‍රායෝගික දැනුම ලැබෙන පරිදි ප්‍රදර්ශන කට්ටල සකස් කර ඇති අතර ඒවා උපයෝගී කර ගෙන පාසල් සිසුන් සහ මහජනතාව ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම ජාතික හා දිස්ත්‍රික් මට්ටමේ ප්‍රදර්ශන සංවිධානය කරන අතර මෙම වැඩසටහන 2019 වර්ෂයේ දී ද ක්‍රියාත්මක කරන ලදි. 2019 වර්ෂයේ එම ප්‍රදර්ශන අම්පාර, කළුතර, නුවර, අනුරාධපුරය, පොළොන්නරුව හා ගාල්ල යන දිස්ත්‍රික්කවලදී පැවැත් වූ අතර ඒ සඳහා 61000ක ආසන්න පිරිසක් ප්‍රදර්ශන කුටියට පැමිණ ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම හා අවබෝධය ලබාගෙන ඇත.




පාසල් ආරක්ෂණ වැඩසටහන පිළිබඳ පාසල් විදුහල්පතිවරු දැනුවත් කිරීමේ වැඩසටහන- ගාල්ල දිස්ත්‍රික්කය




පාසල් සුරක්ෂිතතාව පිළිබඳව අධ්‍යාපන කලාප සහකාර අධ්‍යක්ෂකවරු හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂකවරු අතර සම්බන්ධීකරණය හා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සකස් කිරීම සඳහා වූ වැඩසටහන

2019 වර්ෂයේ ප්‍රදර්ශන මඟින් මහජනතාව හා පාසල් සිසුන් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පැවැත්වූ ප්‍රදර්ශන පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

වගුව 6.3: 2019 වර්ෂයේ ප්‍රදර්ශන මඟින් මහජනතාව හා පාසල් සිසුන් ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ පැවැත්වූ ප්‍රදර්ශන පිළිබඳ විස්තර

අංකය	ප්‍රදර්ශනය පැවැති ස්ථානය	දිස්ත්‍රික්කය	සහභාගී වූ පිරිස	සහභාගී වූ ප්‍රමාණය
1	ඩී. එස්. සේනානායක විද්‍යාලීය ප්‍රදර්ශනය	අම්පාර	පාසල් සිසුන් හා මහජනතාව	5000
2	කළුතර මුස්ලිම් විද්‍යාලීය ප්‍රදර්ශනය	කළුතර	පාසල් සිසුන් හා මහජනතාව	20000

3	නුවර ගේට්වේ විද්‍යාලීය ප්‍රදර්ශනය	නුවර	පාසල් සිසුන්	1500
4	රජරට වසන්තය ප්‍රදර්ශනය	අනුරාධපුරය	මහජනතාව	3500
5	V-2025 Enterprise Sri Lanka වෙළඳ ප්‍රදර්ශනය	අනුරාධපුරය	මහජනතාව	16500
6	V-2025 Enterprise Sri Lanka වෙළඳ ප්‍රදර්ශනය	යාපනය	මහජනතාව	2500
7	ශිල්පසේනා තාක්ෂණික ප්‍රදර්ශනය	පොලොන්නරුව	මහජනතාව	10000
8	මහින්ද විද්‍යාලීය අධ්‍යාපන ප්‍රදර්ශනය	ගාල්ල	පාසල් සිසුන් හා මහජනතාව	2000
එකතුව				**61000**



ගේට්වේ විද්‍යාලීය ප්‍රදර්ශනය - නුවර



V-2025 Enterprise Sri Lanka වෙළඳ ප්‍රදර්ශනය- අනුරාධපුරය

4. පරිපාලන ග්‍රාම නිලධාරීන් ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

කාලගුණික සහ දේශගුණික වෙනස්වීම් මත සිදුවන ආපදා හානිය අවම කිරීමටත් ඒ සඳහා ප්‍රජාව පුහුණු කර, ප්‍රජාව මෙහෙයවීමේ කාර්යයට සහය ලබා ගැනීම උදෙසාත් මෙම වැඩසටහන පරිපාලන ග්‍රාම නිලධාරීන් හට රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඒකාබද්ධව 2019 වර්ෂයේ සිට ආරම්භ කරන ලදි. ආපදා අවදානම් අවම කිරීමට අදාළ තාක්ෂණික භාවිතයන් හරහා පරිපාලන ග්‍රාම නිලධාරීගේ දැනුම වැඩි දියුණු කර ඔවුන්ගේ සේවය වඩා කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස ලබා ගැනීමත් ආපදා අවදානම් අවම කිරීමට අදාළ විවිධ තාක්ෂණික ආයතන සහ එම ආයතන අතර සම්බන්ධීකරණය ගොඩනැගීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

ඒ අනුව 2019 වර්ෂයේ බස්නාහිර, සබරගමුව, මධ්‍යම, වයඹ හා දකුණු පළාත් සඳහා එක් පළාතකට එක් වැඩසටහනක් බැගින් පළාත් 05ක දින දෙකක පුහුණු වැඩසටහනක් තාක්ෂණික ආයතනවල ද දායකත්වයෙන් පහත සඳහන් පරිදි වැඩසටහන් පවත්වන ලදි.

වගුව 6.4: පරිපාලන ග්‍රාම නිලධාරීන් ආපදා කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ ජාතික වැඩසටහන

අංකය	වැඩසටහන	දිස්ත්‍රික්කය	සහභාගීවූ ප්‍රමාණය
1	පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- බස්නාහිර පළාත	ගම්පහ, කළුතර, කොළඹ	50
2	පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- සබරගමුව පළාත	රත්නපුර, කෑගල්ල	40
3	පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- මධ්‍යම පළාත	නුවර, මාතලේ, නුවරඑළිය	58
4	පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- වයඹ පළාත	කුරුණෑගල, පුත්තලම	60
5	පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන- දකුණු පළාත	ගාල්ල, මාතර, හම්බන්තොට	60
එකතුව			**268**




පරිපාලන ග්‍රාම නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන-දකුණු පළාත




පරිපාලන ග්‍රාම නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන-බස්නාහිර පළාත, වයඹ පළාත

5. දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන

වර්තමානයේ වැඩිවෙමින් පවතින ආපදා අවදානම් තත්වය නිසා හදිසි ආපදා අවස්ථාවලදී ජන ජීවිතය අඩාල වන අතර ජීවිත හා දේපල විනාශය ද සිදුවෙමින් පවතී. එපමණක් නොව පීඩාවට පත්වන ජනතාවගේ මානසික පීඩනය ද බරපතල ප්‍රතිඵල ගෙන එන්නකි. එබැවින් ජනතාවට හදිසි ආපදා තත්වයන් පිළිබඳව ක්ෂණිකව තොරතුරු ලබාදීමට අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් වර්තමානයේ සිදුවන ආපදාවල ස්වරූපය අනුව ඉතාම කෙටි වෙලාවක් තුළ ඒ පිළිබඳ තොරතුරු ජනතාවට දැනුවත් කර ඔවුන්ගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීම කල යුතු වේ. ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුම, අවබෝධය හා අත්දැකීම් නොමැතිව හදිසි ආපදා තත්වයන් පිළිබඳ තොරතුරු ඉතා සරලව, ජනතාවට සංවේදී අයුරින් මාධ්‍ය හරහා දැනුවත් කිරීම අසීරු කරුණකි. මේ තත්වය නිසා ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ සියලුම දිස්ත්‍රික් මට්ටමේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආරම්භ කර ඇත.

ආපදා කළමනාකරණ ක්‍රියාවලියට දායක වන ප්‍රධාන තාක්ෂණික ආයතනවල ද සහයෝගය ඇතිව දිස්ත්‍රික් මට්ටමින් මාධ්‍යවේදීන්හට ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධය, දැනුම හා අත්දැකීම් ලබා දෙමින් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ තුළින් අපේක්ෂා කරනුයේ ක්ෂණිකව මාධ්‍යවේදීන් තම මාධ්‍ය ආයතන හරහා හදිසි අවස්ථා සඳහා නිවැරදි තොරතුරු කඩිනමින් ලබා දී ජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කරමින් හදිසි ආපදා අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා සංවේදී පරිසරයක් සකස් කිරීමත් ඉතා සරලව මාධ්‍ය හරහා තොරතුරු ප්‍රජාව වෙත ඉතාම කෙටි වෙලාවකින් යැවීමට කටයුතු කිරීමත් මෙම වැඩසටහනේ අරමුණ වේ. 2019 වර්ෂයේ මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පූර්ණ මෙහෙයවීම යටතේ සිදු කළ අතර, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය යන ආයතනවල නිලධාරීන් ඒ ඒ ක්ෂේත්‍ර පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීමේ වැඩසටහන්වලට දායක විය.

වගුව 6.5: 2019 වර්ෂය තුළ පැවැත්වූ දිස්ත්‍රික් මාධ්‍යවේදී දැනුවත් කිරීමේ වැඩමුළු සඳහා සහභාගී වූ ප්‍රමාණය

අංකය	දිස්ත්‍රික්කය	සහභාගී ප්‍රාදේශිය මාධ්‍යවේදීන්
1	යාපනය	15
2	බදුල්ල	80
3	හම්බන්තොට	30
4	ගම්පහ	82
එකතුව		**207**



මාධ්‍යවේදීන් දැනුවත් කිරීම- ගම්පහ දිස්ත්‍රික්කය



මාධ්‍යවේදීන් දැනුවත් කිරීම- බදුල්ල දිස්ත්‍රික්කය

6.2 මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම

පවතින හදිසි ආපදා තත්වයන් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ තාක්ෂණික ආයතන සම්බන්ධ කරමින් මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලැබේ. ඒ අනුව 2019 වර්ෂයේ නිරිත දිග මෝසම් වර්ෂාව හේතුවෙන් ඇතිවූ ආපදා තත්වය පිළිබඳව දැනුවත් කිරීම හා පවතින නියං තත්වය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ මාධ්‍ය හමු අවශ්‍යතාව අනුව වර්ෂය පුරාම සිදුකරන ලදී.





පැවති ආපදා තත්ව පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම

6.3 අත්පත්‍රිකා මගින් ආපදා කළමනාකරණය පිළිබඳ මහජනතාව හා පාසල් සිසුන් දැනුවත් කිරීම.

ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී මෙන්ම පාසැල් සිසුන් දැනුවත් කිරීම සඳහා ඒ ඒ ආපදා පිළිබඳ ඉතා සරලම අත්පත්‍රිකා බෙදා දීම සිදු කෙරේ. ඒ අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සමස්ත ක්‍රියාවලිය පිළිබඳවත්, ගංවතුර, නියඟය, සුනාමි, භූමිකම්පා යන ආපදා පිළිබඳවත් අත් පත්‍රිකා ඉතා සරලව සකස්කර මහජනතාවට ඒ ඒ ආපදා පිළිබඳ දැනුම, අවබෝධය ලැබෙන පරිදි සහ හදිසි අවස්ථාවලදී ක්‍රියාකල යුතු ආකාරය පිළිබඳ අවබෝධය ලැබෙන පරිදි මෙම අත්පත්‍රිකා භාෂා ත්‍රිත්වයෙන්ම නිර්මාණය කර ඇත. ගංවතුර, නියඟය, සුනාමි, භූමිකම්පා යන ආපදා සම්බන්ධයෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සමස්ත සේවාවන් ඇතුලුව අත්පත්‍රිකා වර්ග 5ක් තාක්ෂණික ආයතනවල ද දායකත්වයෙන් සකස් කර 644,000ක් මුද්‍රණය කර දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ඒකක මඟින් මුලු දිවයිනටම බෙදා දීමට කටයුතු කරනු ලැබේ.



දැනුවත් කිරීම සඳහා සකස් කරන ලද අත්පත්‍රිකා

6.4 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වෙබ් අඩවිය සහ සමාජ මාධ්‍ය ජාල යාවත්කාලීන කිරීම

ආපදා පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම සහ මහජනතාව දැනුවත් කිරීම සම්බන්ධ පුර්ව නිවේදන සහ තොරතුරු ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිළ වෙබ් අඩවි හරහා සිදු කෙරේ. ඊට අමතරව ප්‍රසිද්ධ සමාජ මාධ්‍ය ජාල යාවත්කාලීන කිරීම දැනුවත් කිරීමේ අංශ යටතේ පවතින මාධ්‍ය අංශය විසින් සිදු කරනු ලබයි. විශේෂයෙන්ම හදිසි ආපදා තත්වයක දී දත්ත සහ තොරතුරු ක්ෂණිකව මාධ්‍ය වෙත ලබාදීම, ජාතික සහ ජාත්‍යන්තර ආයතන දැනුවත් කිරීම සඳහා අවශ්‍ය දත්ත යාවත්කාලීන කිරීම දෛනිකව සිදු කරනු ලබයි.



ආපදා කළමනාකරණ නිල වෙබ් අඩවිය සහ මුහුණු පොත (Facebook) පිටුව

6.5 ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

2019 වර්ෂය සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ දිස්ත්‍රික් මට්ටමේ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රුපියල් මිලියන 7.9ක් යොදා ගෙන, දිස්ත්‍රික් 25 තුළ වැඩසටහන් 347ක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් හා ග්‍රාමීය මට්ටමින්, ඒ ඒ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක හරහා ක්‍රියාත්මක කරන ලදී. එම රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 75ක් පැවැත්වූ අතර ඒ සඳහා රාජ්‍ය නිලධාරීන් 5216ක් සහභාගී වී ඇත. ත්‍රිවිද හමුදා නිලධාරීන් 3228 දෙනෙකු සඳහා වැඩසටහන් 33ක් හා ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා ග්‍රාමීය ජනතාව 17422ක් සම්බන්ධ කර ගනිමින් වැඩසටහන් 239ක් පවත්වන ලදී.

වගුව 6.6: දිස්ත්‍රික් මට්ටමේ පැවැත්වූ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

අනු අංක	වැඩසටහනේ තේමාව	වැඩසටහන් ප්‍රමාණය	සහභාගී වූ සංඛ්‍යාව
01	ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	29	3011
02	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම - ආපදා අවදානම් අවම කිරීම	57	4137
03	ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම	74	6991
04	ධීවර ප්‍රජාව දැනුවත් කිරීම	16	960
05	ජීවිතාරක්ෂක වැඩසටහන්	26	1663
06	සෙවීම් හා මුදවා ගැනීමේ වැඩසටහන්	02	136
07	ගිනි ආරක්ෂණ වැඩසටහන්	35	2431
08	යොවුන් කණ්ඩායම් පුහුණු වැඩසටහන්	18	1266
09	ප්‍රථමාධාර හා කඳවුරු කළමනාකරණ පිළිබඳ පුහුණු වැඩසටහන්	74	4195
10	වතු නිලධාරීන් දැනුවත් කිරීම	04	215
11	සෞඛ්‍ය අංශයේ නිලධාරීන් දැනුවත් කිරීම	05	349
12	දහම් පාසල් ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	07	512
එකතුව		**347**	**25866**



සටහන 6.2 : දිස්ත්‍රික් අනුව මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම - 2019

2019 වර්ෂය තුළ දිස්ත්‍රික් මට්ටමින් සිදු කරන ලද ඉහත සඳහන් වැඩසටහන්වලට අදාළ ඡායාරූප පහත සඳහන් වේ.



රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කය



රාජ්‍ය ආයතන නිලධාරීන් සඳහා ප්‍රථමාධාර පුහුණු වැඩසටහන-බදුල්ල දිස්ත්‍රික්කය



රාජ්‍ය නිලධාරීන් සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - අම්පාර දිස්ත්‍රික්කය



ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳ ත්‍රිවිධ හමුදාව දැනුවත් කිරීමේ වැඩසටහන- හම්බන්තොට දිස්ත්‍රික්කය

6.6 ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල ධාරිතා වර්ධන වැඩසටහන්

ආපදා අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය ඵලදායී හා කාර්යක්ෂම ලෙස රටතුළ ක්‍රියාත්මක කරමින්, ඇති අභියෝග ජයගැනීම ආපදා කළමනාකරන මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය වෙත පැවරී ඇති ප්‍රධාන කාර්යකි. මේ සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය සඳහා නවීන තාක්ෂණික දැනුම හා විෂය ක්ෂේත්‍රයන්හි අවබෝධය පුළුල් කරගැනීම සඳහා රු.මිලියන 03ක් යොදාගෙන ධාරිතා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල රාජකාරී කරන නිලධාරින්ට දිස්ත්‍රික් මට්ටමේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කිරීමේදී, ඔවුන්ගේ විෂය දැනුම හා කුසලතාව වර්ධනය කිරීම සඳහා ආපදා අවදානම් අවම කිරීම පිළිබඳ සිව්දින නේවාසික වැඩසටහන් 03ක් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය සම්බන්ධ කරගෙන පවත්වන ලදි. සිංහල මාධ්‍යයෙන් පැවති මෙම වැඩසටහන සඳහා දිස්ත්‍රික් කළමනාකරණ සහකාර නිලධාරින් 102ක් සහභාගී විය.





ආපදා අවදානම් කළමණාකරණය පිළිබඳ ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන- පොළොන්නරුව දිස්ත්‍රික්කය

2019 වර්ෂය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ නිලධාරීන්ගේ පශ්චාත් උපාධි සඳහා වෙන්කර තිබූ මූල්‍ය ප්‍රතිපාදනවලින් රු.531,000.00ක් නිලධාරීන් දෙදෙනෙකුගේ ආපදා අවදානම් කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය හා ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා ලබා දී ඇත. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය සඳහා සිය රාජකාරී විෂය පථයට සෘජුව සම්බන්ධ වන කෙටිකාලීන පාඨමාලා 19ක් සඳහා නිලධාරීන් 62ක් යොමු කරන ලදි. කාර්යය මණ්ඩලයේ හඳුනාගත් අවශ්‍යතා අනුව පරිගණක භාවිතයෙන් රාජකාරී කටයුතු කරන නිලධාරීන් සඳහා තොරතුරු තාක්ෂණ දැනුම වර්ධනය කිරීම සඳහා රු. 500,000.00 මූල්‍ය ප්‍රතිපාදන ලබා දෙන ලදී. ඒ අනුව රාජ්‍ය ව්‍යාපාර කළමනාකරණ ආයතනය (NIBM) සම්බන්ධ කරගෙන කාර්යාල යෙදවුම් පිළිබඳ දින 03ක ප්‍රායෝගික පරිගණක වැඩසටහන් දෙකක් පැවැත්වූ අතර සන්නිවේදන දැනුම වර්ධනය කිරීම සඳහා සන්නිවේදන අංශයේ තාක්ෂණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු ශ්‍රී ලංකා ටෙලිකොම් පුහුණු මධ්‍යස්ථානයේ තොරතුරු තාක්ෂණ ජාලගත කිරීමේ පුහුණු වැඩසටහනක් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලදී. ඒ පිළිබඳ තොරතුරු පහත සඳහන් වේ.

වගුව 6.7: පාඨමාලා සඳහා සහභාගී වූ ප්‍රමාණය

අංකය	පාඨමාලා වර්ගීකරණය	පාඨමාලා ප්‍රමාණය	පාඨමාලා සඳහා සහභාගී වූ නිලධාරීන් ගණන
01	පශ්චාත් උපාධි සඳහා මූල්‍ය ප්‍රතිපාදන	02	02
02	විෂයානුබද්ධ කෙටිකාලීන පාඨමාලා හා පුහුණු වැඩසටහන් (ගිණුම්/මානව සම්පත්/පරිපාලන)	19	62
03	තොරතුරු තාක්ෂණ පාඨමාලා සඳහා	03	53
04	දිස්ත්‍රික් කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවල කළමනාකරන සහකාර නිලධාරීන් සඳහා ආපදා අවදානම් කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන	03	102
මුළු එකතුව		**27**	**219**




ජාතික ව්‍යාපාර කළමනාකරණ ආයතනයේදී පැවති තොරතුරු තාක්ෂණ තෙදින වැඩසටහන




ආපදා අවදානම් අවමකිරීම පිළිබඳ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ පැවති සිව්දින පුහුණු වැඩසටහන

6.7 ජාතික සුරක්ෂිත දින වැඩසටහන

2004 වර්ෂයේ දෙසැම්බර් 26 දින ඇති වූ සුනාමි ව්‍යසනයෙන් 35000කට වැඩි පිරිසකගේ ජීවිත අප මාතෘ භූමියට අහිමි කරන ලදි. එපමණක් නොව බිලියන ගණනක් වටිනා යටිතල පහසුකම් ද අහිමි කරමින් ඒ මහා උදම් රළ දිස්ත්‍රික්ක කිහිපයකම ජන ජීවිතය සම්පූර්ණයෙන් ව්‍යාකූල කරන ලදි.

මෙම ව්‍යසනයෙන් මියගිය ජනතාව සිහිපත් කිරීමට 2005 අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව සෑම වසරකම දෙසැම්බර් 26 වන දින ජාතික සුරක්ෂිත දින ලෙස නම් කර ඇති අතර ඒ අනුව 2019 වර්ෂයේ දෙසැම්බර් මස 26 වන දින සුනාමි ව්‍යසනයෙන් සහ අනෙකුත් ව්‍යසනයන්ගෙන් මිය ගිය ජනතාව සිහිපත් කරමින් පිං පැමිණුවීම සඳහා සර්ව ආගමික වැඩසටහන්වලට මුල්තැන දෙමින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ දී හා දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක 25 කේන්ද්‍රකර ගෙන දේශපාලන අධිකාරිය මෙන්ම දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්වරු ඇතුළු රාජ්‍ය නිලධාරින් සහ මහජනතාවගේ ද සහභාගීත්වයෙන් එම සර්ව ආගමික වැඩසටහන් පවත්වමින් මියගිය ජනතාවට පිං පැමිණුවීම සිදු කරන ලදි.

මෙම සර්ව ආගමික වැඩසටහන්වලට අමතරව මහජනතාව ආපදා කළමනාකරණ ක්‍රියාවලිය පිළිබඳ දැනුවත් කිරීම, ශ්‍රමදාන සංවිධානය කිරීම ආදි වැඩසටහන් 2019 වර්ෂයේ ජාතික සුරක්ෂිත දිනට සමගාමීව ක්‍රියාත්මක කරන ලදි.

විශේෂයෙන් ජාතික සුරක්ෂිත දින වැඩසටහනට සමගාමීව 2004 සුනාමි ව්‍යසනයෙන් මිය ගිය ජනතාව සිහිපත් කිරීම සඳහා ගාල්ල පැරැලියේ ඉදිකර ඇති ප්‍රධාන ස්මාරකය අභියස ප්‍රධාන උත්සවයක් ද 2004

සුනාමි ව්‍යසනයේ දී පළමුව උදම් රළ පැමිණි අම්පාර දිස්ත්‍රික්කයේ කල්මුණේ ප්‍රදේශයේ සයින්දමන්දුර් ප්‍රදේශය කේන්ද්‍ර කරගෙන දේශපාල අධිකාරියේ ප්‍රධානත්වයෙන් අම්පාර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශිය ලේකම්වරු ඇතුළු ප්‍රදේශවාසීන්ගේ සහභාගීත්වයෙන් විශේෂ සර්ව ආගමික වැඩසටහනක් හා මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- ප්‍රධාන කාර්යාලය



ජාතික සුරක්ෂිත දින වැඩසටහන- කළුතර දිස්ත්‍රික්කය


නික්කවුව පැරැලිය සුනාමි ස්මාරකය අසල පැවැත් වූ ජාතික සුරක්ෂා දින වැඩසටහන



ජාතික සුරක්ෂිත දින වැඩසටහන-අම්පාර දිස්ත්‍රික්කය

07. හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය (Emergency Operations Centre)

7.1 හැඳින්වීම

2005 අංක 13 දරන ආපදා කළමනාකරණ පනතට අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි පිහිටුවා ඇති හදිසි මෙහෙයුම් අංශය, පැය 24x7 පුරා ක්‍රියාත්මක වන අතර ආපදා තත්ත්වයන් වර්ධනය වන ආකාරයත්, ප්‍රතිචාර සිදුකල යුතු මට්ටමත් අඛණ්ඩව තක්සේරු කරයි. ආපදාවේ ප්‍රමාණය ප්‍රාදේශීය මට්ටමේ නියෝජිතායතනවලට පාලනය කිරීමට හැකි සීමාවෙන් ඔබ්බට ගිය විට, ජාතික මට්ටමේ හදිසි මෙහෙයුම් අංශය, හදිසි ප්‍රතිචාර කමිටුව සමඟ සම්බන්ධීකරණයවී සෙවීම්, බේරාගැනීම් සහ අවදානමේ සිටින ප්‍රජාවන් ආරක්ෂිතව ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ “සූදානම් වීම” අඛණ්ඩව පවත්වාගැනීම සහ හදිසි ඇමතුම් මධ්‍යස්ථානය 117 සමඟ පැය 24x7 පුරා කටයුතු කිරීම සඳහා අවශ්‍ය සම්පත් වැඩි කිරීම මඟින් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානයේ කාර්යය තත්ත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් ලබා දී තිබේ.

එමෙන්ම ආපදාවෙන් වන බලපෑම තක්සේරු කර ඒ අනුව සිදුවිය හැකි ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමේ ක්‍රමවේදය පිළිබඳ තීරණ ගැනීමත්, එමඟින් ඉදිරියේදී මුහුණදීමට සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීමට

කටයුතු සැලසුම් කර විවිධ පූර්ව දැනුම්දීමේ ක්‍රමවේද භාවිතා කරමින් ඒ ඔස්සේ කටයුතු කිරීමත් හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් සිදු කරනු ලබයි.





පැය **24 x 7** හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය

7.2 2019 නිරිත දිග සහ ඊසාන දිග මෝසම් සක්‍රීය වීම නිසා ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් හටගත් ගංවතුර හා නායයෑම් කළමනාකරණ කිරීම

2019 ජනවාරි මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා කාල පරිච්ඡේදය තුළ වාර්තා වුණු ජල ගැලීම් හේතු කොට ගෙන විපතට පත්වූ සම්පූර්ණ පවුල් සංඛ්‍යාව **138,550**ක් විය. දිස්ත්‍රික් ආපදා සම්බන්ධීකරණ ඒකක විසින් සහාය ඉල්ලා සිටි විට හදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන විසින් පොලිසිය සහ ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණය කොට මහජනතාව මුදවා ගැනීම්, ජනතාව ආරක්ෂිත ස්ථාන කරා ගමන් කරවීම සහ හදිසි අවස්ථා සහනාධාර මෙහෙයුම් කටයුතු සම්බන්ධීකරණය කරන ලදි.

විශේෂයෙන් 2019 ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසවල පැවති අයහපත් කාලගුණික තත්ත්වත් සමඟ ගංවතුර ආපදා තත්ත්වය හේතුවෙන් බදුල්ල, නුවරඑළිය, මහනුවර, මඩකලපුව, අම්පාර, මන්නාරම, මුලතිව්, පොළොන්නරුව, අනුරාධපුර, පුත්තලම, කුරුණෑගල, හම්බන්තොට හා යාපනය යන දිස්ත්‍රික්කයන්හි ජනතාව පීඩාවට පත්විය. පැවති දැඩි වර්ෂාපතනය හේතුවෙන් කළුතර, මාතර, රත්නපුර සහ ගාල්ල යන දිස්ත්‍රික්කයන්හි ජනතාව වැඩියෙන්ම පීඩාවට පත්වූ දිස්ත්‍රික් ලෙස සඳහන් කළ හැකිය.

අදාළ තාක්ෂණික ආයතන කැඳවා මෝසම් තත්ත්වයට ඇති සූදානම (Monsoon Meeting) පිළිබඳ රැස්වීම පවත්වා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කර, කාලගුණ නිල නිවේදනයට අනුව බලපෑමට ලක් විය හැකි දිස්ත්‍රික්ක සියල්ල පිලිබඳ මාධ්‍ය, දුරකථන, ෆැක්ස්, අන්තර්ජාල හා සමාජ වෙබ් අඩවි මඟින් මහජනතාව අඛණ්ඩව දැනුවත් කිරීම කරන ලදී. ගංවතුර නිසා අනතුරුදායක ස්ථානවල රැඳී සිටි පිරිස් බේරා ගැනීම සඳහා බෝට්ටු හා මුදවා ගැනීමේ කණ්ඩායම් යොදවන ලද අතර, බොහෝ මාර්ගයන් ජලයෙන් යට වීම නිසා ගොඩබිමෙන් ආධාරක කණ්ඩායම් යැවීමට නොහැකි වූ බැවින්, ජනතාව මුදවා ගැනීම සඳහා හෙලියානා මඟින් සහය ලබා දෙන ලදී. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් ලබාදුන් පූර්ව ඉවත්වීමේ නිවේදනයන් සියළු මාධ්‍ය මෙන්ම, පොලීසිය, දිස්ත්‍රික් ආපදා කළමනාකරණ ජාලයන් හරහා ජනතාවට ලබාදුන් අතර මෙයින් 90% ක් පමණ ජනතාව ආරක්ෂිත ස්ථාන වෙත ඉවත්වූ අතර 10%කට ආසන්න වශයෙන් ජනතාව ගංවතුර හේතුවෙන් කොටු විය. මෙම ජනතාව බේරා ගැනීමට ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය සමඟ අඛණ්ඩ මෙහෙයුම් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් කරමින් ආපදා සඳහා ගොදුරු වී සිටි ජනතාව බේරා ගැනීම සිදුකරන ලදි.

➢ **නායයෑම්**

අයහපත් කාළගුණික තත්ත්වයේ වර්ධනයත් සමඟ නායයෑම් සහ නායයෑම් අවදානම් තත්ත්වයන් රත්නපුර කෑගල්ල, සහ මාතර යන දිස්ත්‍රික්කයන් තුළ සිදුවූ අතර රත්නපුර සහ මාතර දිස්ත්‍රික්කයන්හි බරපතල ආපදාවන් රැසක් මෙම ආපදා කාලවකවානුව තුළදී සිදුවිය. නායයෑම සම්බන්ධයෙන් යුද්ධ හමුදා මූලස්ථානය සහ ආඥාපති - ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) දැනුවත් කර සෙවීමේ සහ මුදවාගැනීමේ මෙහෙයුම් සඳහා හමුදාහට පිරිස් යොදවන ලදී.





නුවර එළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිදුවූ නායයෑම

2019 වර්ෂය තුළ මෝසම් වැසි සක්‍රීයවීම නිසා ඇතිවූ ආපදා තත්ත්වයන් හේතුවෙන් පවුල් 156,062ක පුද්ගලයන් 643,487ක සංඛ්‍යාවක් ආපදාවට ලක්විය. එමඟින් පුද්ගලයන් 60 දෙනෙකු මිය ගොස් පුද්ගලයන් 133 තුවාල ලැබූ අතර පුද්ගලයින් 7 දෙනෙකු අතුරුදහන්විය. නිවාස 375 පූර්ණ හානි සිදුවූ අතර නිවාස 19521 අර්ධ හානි සිදුවිය.

➢ **මෝසම් තත්ත්වයෙන් දැඩි සුළං ඇති වීම.**



2019 වර්ෂයේ දැඩි සුළං හේතුවෙන් පවුල් 13,376ක් ඉන් විපතට පත් වූහ. මුදවා ගැනීමේ මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම, මාර්ග එලි පෙහෙලි කිරීම, සන්නිවේදන සහ විදුලිබල සැපයීම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සහාය ඇතිව විපතට පත්වූවන්හට සහන ලබාදීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට හැකි විය. මෝසම් කාලය ඇරඹීමට පෙර තම නිවාස අසල ඇති අනතුරුදායක ගස් සහ අතු ඉවත් කර ගන්නා ලෙසත් ඒ සඳහා ආරක්ෂිත පියවර ලබා ගන්නා ලෙසත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් මහජනතාවට උපදෙස් ලබා දෙන ලදී.

➢ **කැලෑ / අනෙකුත් ගිනි අවස්ථාවලදී හදිසි ප්‍රතිචාර දැක්වීම.**

2019 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලය තුළ ශ්‍රී ලංකාව තුළ කැලෑ ගිනි 131ක ප්‍රමාණයක් වාර්තා වූ අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන සතු කාර්යක්ෂම සන්නිවේදන ජාලය උපයෝගී කොට ගෙන කඩිනමින් පොලිසිය, ගුවන් හමුදාව, යුද හමුදාවේ සහ ප්‍රාදේශීය ගිනි නිවන මධ්‍යස්ථානවල සහාය ලබා ගනිමින් ගිනි නිවාරණ කටයුතු සිදු කරන ලදී. 2019 හා 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වසරේදී කැලෑ ගිනි වැඩි වීමක් දක්නට ලැබිණ.





නිවාස / ගොඩනැගිලි ගිනි ගැනීම්

වගුව 7.1: 2017 සිට 2019 දක්වා වූ වර්ෂවල වාර්තා වූ කැළෑ ගිනි සම්බන්ධ තොරතුරු

වර්ෂය	කැලෑ ගිනි ප්‍රමාණය
2017	58
2018	102
2019	131



2017 සිට 2019 දක්වා වූ වර්ෂවල වාර්තා වූ කැළෑ ගිනි

ව්‍යසන මඟින් සිදුවූ අලාභ හානි පිළිබඳ සාරාංශය - 2019 ජනවාරි පළමු වැනි දින සිට 2019 දෙසැම්බර් 31 දක්වා කාල පරිච්ඡේදය තුළ

වගුව 7.2: 2019-12-31 දක්වා ආපදාවන්ට ලක් වූ පුද්ගලයන් පිළිබඳ සාරාංශය

සිදුවීම	මරණ	තුවාල	අතුරුදහන්වීම්	නිවාස විනාශ වීම්	නිවාස හානි වීම්	බලපෑමට ලක් වූ පවුල් සංඛ්‍යාව	බලපෑමට ලක් වූ පුද්ගලයන් සංඛ්‍යාව
සත්ව ප්‍රහාර	9	0	0	0	3	16	25
බෝට්ටු පෙරළීම	1	0	2	0	0	3	11
රසායනික ආපදා	1	1	0	0	0	2	10
වෙරළ බාදනය	0	0	0	0	0	4	13
කණ්ඩි කඩා වැටීම්	1	8	0	23	254	400	1708
සුළි සුළං	0	0	0	1	10	11	37
නියඟය	0	0	0	0	0	38773	140006
දියේ ගිලීම්	32	3	1	0	0	24	71
විදුලි සැර	1	0	0	0	0	1	7
ගිනි ගැනීම්	1	17	0	104	65	192	794
හදිසි ගංවතුර	0	5	0	10	142	2510	9892
ගංවතුර	13	23	2	139	6807	138894	578051
තද වැසි	0	0	0	0	3	53	164
නායයෑම්	4	3	1	14	127	656	2374
අකුණු අනතුරු	17	13	0	2	253	331	1304
පාෂාණ වැටීම්	0	0	0	3	22	70	271
තද සුළං	26	89	4	174	12029	13376	50845
ටොනාඩෝ	0	0	0	33	115	143	482
ගස් කඩා වැටීම්	0	0	0	0	23	29	104
බිත්ති කඩා වැටීම්	0	1	0	0	10	11	41
එකතුව	**106**	**163**	**10**	**503**	**19863**	**195499**	**786210**

7.3 පූර්ව දැනුම්දීම්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙහි, පූර්ව දැනුම් දීමේ කුළුණු 77ක් 2009 වසරේදී වෙරළ තීරයෙහි ස්ථාපිත කර ඇති අතර දෝෂ සහිත කුළුණු මේ වන විට අලුත්වැඩියා කටයුතු නිම කොට ඇත. තවද කෙටි පණිවිඩ ක්‍රමවේදය හරහා ප්‍රජාවන් දැනුවත් කිරීමේ නවීකරණ පද්ධතියක් හරහා ක්‍රියාත්මක කොට ඇත. දිස්ත්‍රික් ඒකකවල සහ ග්‍රාමීය මට්ටමේ ප්‍රජාවන් තුළ පූර්ව අනතුරු ඇඟවීම් ප්‍රචාරය කිරීමේ හැකියාව ශක්තිමත් කිරීමට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් ඉහළම ප්‍රමුඛතාවය ලබා දී ඇත. මේ වන විට දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි පූර්ව දැනුම් දීමේ පද්ධතිය ව්‍යාප්ත කොට ඇත. තවද VHF ක්‍රමවේදය හරහා බිම් මට්ටමේ දක්වා සන්නිවේදන කටයුතු විකාශනය කිරීම සඳහා අලුත්වැඩියා කිරීම් කටයුතු සිදු කරමින් පවතී.

- ජාත්‍යන්තර සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය හා සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාව වෙත පූර්ව අනතුරු ඇඟවීම් ලබා ගැනීම සඳහා ඇති ජාලය යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. (IOTWMS)
- සියළුම ප්‍රාදේශීය මාධ්‍ය වාර්තාකරුවන් අපගේ පූර්ව දැනුම්දීමේ පද්ධතිය සමඟ සම්බන්ධ කරන ලදී.
- හදිසි ආපදා තත්ත්වයකදී හෝ ඊට පෙර සියලු ආපදා කටයුතු වෙනුවෙන් පූර්ව දැනුම් දීම් තොරතුරු යාවත්කාලීන කිරීම.
- ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ තොරතුරු නිලධාරියා හරහා (Information Officer) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට තොරතුරු දැන ගැනීමේ පනතට ප්‍රකාරව ලැබෙන සියලු ඉල්ලීම්වලට ප්‍රතිචාර දැක්වීම.
- පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණුවල නඩත්තු කටයුතු මනාව පවත්වාගෙන යාම සඳහා වූ දෛනික පරීක්ෂා කිරීම් කටයුතු සහ අධීක්ෂණ කටයුතු සිදු කිරීම.
- DEWN පද්ධතියේ ග්‍රාහකයන් ප්‍රමාණය 23,000 දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.
- 5 වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස සා/ පෙළ විභාගය සහ අ.පො.ස උ/ පෙළ විභාගයට සමගාමීව විභාග දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින් හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් නිර්මාණය කොට හදිසි ආපදා තත්ත්වයකදී විභාග කටයුතු බාධාවකින් තොරව පවත්වා ගෙන යාම සඳහා විභාග කටයුතු සාර්ථක කිරීම සඳහා සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- 2019 ජනාධිපතිවරණට සමගාමීව මැතිවරණ දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වෙමින් හදිසි ප්‍රතිචාර දැක්වීමේ සැලසුම් නිර්මාණය කොට හදිසි ආපදා තත්ත්වයකදී මැතිවරණ කටයුතුවලට බාධා නොවී පැය 24 පුරාම මැතිවරණ කටයුතු සාර්ථක කිරීම සඳහා සියළු සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- මෙම දත්ත ගබඩාව වෙතට රාජ්‍ය නිලධාරීන්, ග්‍රාමීය කමිටු නිලධාරීන්, ආරක්ෂක අංශ ඇතුළු ප්‍රධාන සම්බන්ධතා ඇතුළත් කිරීම තුළින් හදිසි ආපදා තත්ත්වයකදී එම අනතුරු ඇඟවීමේ කෙටි පණිවිඩය ක්ෂණිකව ප්‍රජාව වෙත දැනුම්දීමට හැකිවී ඇත.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් නිකුත් කරන ලද නායයෑම් අනතුරු 60ක් 2019 වසරේදී නායයෑමට ගොදුරු විය හැකි ප්‍රදේශයන් සඳහා නිකුත් කරන ලදී. එලෙසම අයහපත් කාලගුණය වෙනුවෙන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද නිවේදන 336ක්

ජනතාව වෙත නිකුත් කර ඇත. එලෙසම ගංවතුර අවධානම දැනුම් දීම සඳහා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් හදිසි මෙහෙයුම් මැදිරිය මඟින් නිකුත් කරන ලද නිවේදන 177ක් ජනතාව වෙත නිකුත් කර ඇත.

- ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතියක්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය විසින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් හා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ස්ථාපිත කොට ඇත. එම දත්ත නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව ලබා දීම මෙම වසර තුළදී සිදු වීම හා එමඟින් ශ්‍රී ලංකාවට ලැබෙන වර්ෂාමාන දත්ත එසැනින් දැන ගැනීමට හැකිවීම තුළ හදිසි අවස්ථා සඳහා අවශ්‍ය තීන්දු තීරණ ලබා ගැනීම පහසු වී ඇත.



කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙහි ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිය



වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි ස්වයංක්‍රීය වර්ෂාමාන හා ජල මාපක



ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ස්වයංක්‍රීය වර්ෂාමාන පද්ධතිවල ක්‍රියාකාරිත්වය

7.4 ඇමතුම් මැදිරිය

වර්ෂ 2013 සිට ක්‍රියාත්මක වන ආපදා කළමනාකරණ ඇමතුම් මධ්‍යස්ථානය (ඇමතුම් අංකය 117) ආපදා අවස්ථාවලදී මහජනතාව සමග සන්නිවේදනය කිරීම සඳහා ස්ථාපිත කරන ලදී. ආපදා මඟින් මහජනතාව වෙත ඇති වන ගැටළු හා බලපෑම් පිළිබඳ එක එල්ලෙ ප්‍රශ්න යොමු කිරීම මඟින් ක්ෂණික ප්‍රතිචාර ලබා ගැනීම සඳහා හදිසි ඇමතුම් මැදිරිය නිරන්තරයෙන් කටයුතු සිදු කරයි. 2019 වසරේදී ලැබුණු ඇමතුම් 288,357ක ප්‍රමාණයක් සඳහා ප්‍රතිචාර දක්වා ඇත.

හදිසි ඇමතුම් මැදිරිය තුළ දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම සිදු කරන ලදී. මෘදුකාංග යාවත්කාලීන කිරීම හා ඇමතුම් මැදිරිය නවීකරණය කොට පැය 24 පුරාවට අඛණ්ඩව සක්‍රීයව පවත්වා ගැනීමට කටයුතු කරන ලදී.

117 ඇමතුම් මැදිරියට ලැබෙන ඇමතුම් පිළිබඳ සාරාංශ වාර්තාව - 2019

වගුව 7.3: 117 ඇමතුම් මැදිරියට ලැබෙන ඇමතුම් පිළිබඳ සාරාංශ වාර්තාව - 2019

කාල සීමාව	ආපදා සම්බන්ධ තොරතුරු විමසීමේ ඇමතුම්	වෙනත් ඇමතුම්	මුළු ඇමතුම් සංඛ්‍යාව
2019.01.01 සිට 2019.01.31 දක්වා	17615	5340	22955
2019.02.01 සිට 2019.02.28 දක්වා	20330	1167	21497
2019.03.01 සිට 2019.03.31 දක්වා	24471	1341	25812
2019.04.01 සිට 2019.04.30 දක්වා	24349	1244	25593
2019.05.01 සිට 2019.05.31 දක්වා	25439	939	26378
2019.06.01 සිට 2019.06.30 දක්වා	26873	1054	27917
2019.07.01 සිට 2019.07.31 දක්වා	24336	1027	25363
2019.08.01 සිට 2019.08.31 දක්වා	24778	1302	26080
2019.09.01 සිට 2019.09.30 දක්වා	20961	1602	22563
2019.10.01 සිට 2019.10.31දක්වා	18838	738	19576
2019.11.01 සිට 2019.11.30 දක්වා	17036	615	17651
2019.12.01 සිට 2019.12.31දක්වා	25879	1093	26972
එකතුව	**270905**	**17462**	**288357**




ඇමතුම් මැදිරිය

7.5 පොලිසිය සහ ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ කටයුතු

දිවයින පුරා ඇතිවන ඕනෑම ආපදා තත්ත්වයක් සඳහා නිරන්තරයෙන් ත්‍රිවිධ හමුදාව විසින් සෙවීම් හා මුදවා ගැනීම් කටයුතු සහ හදිසි ප්‍රතිචාර දැක්වීමේ කටයුතු ඉතාමත් සාර්ථකව සිදුකරන ලදී.

මෙම මධ්‍යස්ථානයෙහි සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ නිලධාරියකු යටතේ ත්‍රිවිධ හමුදා සහ පොලිස් නිලධාරීන් අනුයුක්ත කර ඇත. මෙහිදී හදිසි මෙහෙයුම් මැදිරියෙහි පැය 24 පුරාවට ත්‍රිවිධ හමුදා සහ පොලිස් හට පිරිස් රාජකාරී කරනු ලබන අතර මෙතෙක් සිදුවූ ආපදා තත්ත්වයන්වලදී ත්‍රිවිධ හමුදා මාණ්ඩලික ප්‍රධානී කාර්යයාලය සමඟ සම්බන්ධීකරණය වී ඉතාමත් කෙටි කාලයක් තුළදී අවශ්‍ය ස්ථානයන් කරා මුදවා ගැනීමේ සහ සහන සැලසීමේ හට පිරිස් යොමු කිරීමට සෑම විටම ක්‍රියාකරන ලදී.

ඉහත සඳහන් ආකාරයට 2019 වසරේ ඇතිවූ ගංවතුර, නාය යෑම්, කැලෑ ගිනි සහ සාමාන්‍ය ගිනි ඇතුළුව සියලුම ආපදාවන්වලදී ද මෝසම් වර්ෂාවන් නිසා අපිරිසිදු වූ පානීය ජල ළිං සුද්ධ පවිත්‍ර කිරීමේ කටයුතු සඳහා ද, ත්‍රිවිධ හමුදා මුදවා ගැනීමේ සහ සහන සේවා කණ්ඩායම්වල සේවය ලබා දෙන ලදී.
තවද ඉදිරියේදී ඇතිවිය හැකි ආපදාවන්වලදී ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණ කටයුතු වඩාත් ඵලදායීව සහ කාර්යක්ෂමව සිදුකිරීම සඳහා පොලිසිය සහ ත්‍රිවිධ හමුදා සම්බන්ධීකරණය පහත සඳහන් පරිදි ක්‍රියාත්මක වේ.

එක් එක් ආපදා අවස්ථාවන්හිදී මුදවා ගැනීම් සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලිසිය සහභාගී වූ දිස්ත්‍රික්ක හා ප්‍රධාන ආපදා

<u>කැළෑ ගිනි සහ අනෙකුත් ගිනි</u>

වගුව 7.4: කැළෑ ගිනි සහ අනෙකුත් ගිනි

	දිස්ත්‍රික්ක	සහභාගී වූ අකාරය
ත්‍රිවිධ හමුදාව හා පොලිසිය	මන්නාරම, මහනුවර, මොනරාගල, බදුල්ල, ගම්පහ, මාතලේ, ගාල්ල, රත්නපුර කුරුණෑගල,ගම්පහ, නුවර එළිය, මොනරාගල, රත්නපුර, බදුල්ල මන්නාරම, ගම්පහ	ත්‍රිවිධ හමුදා නිලධාරීන් විසින් ස්ථාන 132 සිදු වූ ගිනි මැඩ පැවැත්වීම සඳහා කටයුතු කරන ලදී.

<u>මෝසම් වැසි නිසා ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්ව, නායයෑම් හා වැව් පිටාර ගැලීම්</u>

වගුව 7.5: මෝසම් වැසි නිසා ඇති වූ අධික වර්ෂාව හේතුවෙන් ඇති වූ ගංවතුර තත්ත්ව, නයයෑම් හා වැව් පිටාර ගැලීම්

	දිස්ත්‍රික්ක	සහභාගී වූ අකාරය
ත්‍රිවිධ හමුදාව හා පොලිසිය	යාපනය, කිලිනොච්චිය, මුලතිව්, ගම්පහ, රත්නපුර, කොළඹ, පුත්තලම, හම්බන්තොට, මොනරාගල, බදුල්ල මඩකලපුව, ගාල්ල, මාතර, කුරුණෑගල, පොළොන්නරුව, කළුතර	නිරිත දිග මෝසම් වර්ෂාව, ඊසාන දිග මෝසම් වර්ෂාව සහ අන්තර් මෝසම් වර්ෂාව නිසා ඇති වූ ආපදා තත්ත්වයන්වලට ත්‍රිවිධ හමුදා නිලධාරීන් කණ්ඩායම් වශයෙන් මුදවා ගැනීම් හා සහන සැලසී සඳහා කටයුතු සිදු කරන ලදී.

7.6 සෙවීම් සහ මුදවා ගැනීම් පිළිබඳ ආපදා කළමනාකරණ දින 12 ක නේවාසික පුහුණු පාඨමාලාව

ආපදා අවස්ථාවන්හි, ත්‍රිවිධ හමුදා හා පොලිසියේ සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම් සහ සෞඛ්‍ය අංශයේ සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්වලින් ජීවිත බේරා ගැනීමෙහි ලා සුවිශේෂී කාර්ය භාරයක් සිදුවිය. ඒ අනුව, සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම් බල ගැන්වීමේ අරමුණින්, ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) අනුග්‍රහයෙන්, විශේෂ බලකා පුහුනු පාසල-මාදුරුඔය සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා ආපදා ප්‍රතික්‍රියා පුහුණු

මධ්‍යස්ථානය - ගම්පොළ යන ස්ථානයන්හිදී සෙවීම් සහ මුදවා ගැනීම් කණ්ඩායම්වල සාමාජිකයන් 248 දෙනෙකු සඳහා පාඨමාලාවන් පැවැත්වීම සිදුකර ඇත. මේ සඳහා මූල්‍ය සහය සහ තාක්ෂණික සහාය ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ලබා දෙන ලදී.

❖ **ගංවතුර සහ අනෙකුත් ව්‍යසන පිළිබඳව වන හදිසි ප්‍රතිචාර කටයුතු සඳහා 2018 වර්ෂයේ උපකරණ මිලදී ගෙන 2019 වර්ෂයේ බෙදා හැරීම.**

➢ ශ්‍රී ලංකාව තුළ නිරන්තර සිදුවන ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වන ප්‍රතිචාර දැක්වීමේ උපකරණ මිලදී ගෙන පිඩාවට පත්වන දිස්ත්‍රික් සඳහා බෙදාදීමේ කාර්යය ද හදිසි මෙහෙයුම් අංශය විසින් සිදු කරයි.

දිස්ත්‍රික් මට්ටමින් ඉල්ලුම් කරන ලද අවශ්‍යතාවයන් සහ පසුගිය ආපදා අවස්ථාවන්වලදී මුහුණුදුන් ගැටලු මෙන්ම අත්දැකීම් පාදක කරගෙන මෙම මිලදී ගැනීමේ කටයුතු සිදු කරයි. ඒ අනුව වසරින් වසර විවිධ භාණ්ඩ මිලදී ගනිමින් ප්‍රතිචාර දැක්වීමේ කටයුතු සඳහා දිස්ත්‍රික් වෙත මෙම උපකරණ බෙදා දීම සිදු කරන ලදී. ආපදාවන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා හදිසි මෙහෙයුම් අංශය වෙත ප්‍රතිපාදන නොලැබුනු අතර ඒ පිළිබඳව අන්තර් කාලීන කළමනාකරණ කමිටුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කරන ලදුව 2019.08.26 වන දින පැවති කමිටු රැස්වීම මඟින් සමස්ත ප්‍රතිචාර දැක්වීමේ භාණ්ඩ ප්‍රමාණයෙන් 20% ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අනුමැතිය ලැබුණි.



2018 වසරේදී මිලදී ගැනීමට කටයුතු කරන ලද බෝට්ටු දම්වැල් කියත් 49ක්, පොරව 85ක්, අඟුල් 37ක්, රබර් බෝට්ටු 12ක්, ජීවිතාරක්ෂක කබා 273ක්, ජන ඇමතුම් කට්ටල 97ක්, මාන කැති 980ක්, බෝට්ටු එන්ජින් 37ක්, ජීවිත ආරක්ෂක කඹ (මීටර් 100) 140ක්, ජීවිත ආරක්ෂක කඹ (මීටර් 200) 7ක්, මුදවා ගැනීමේ බෑග් 200ක්, වර්ෂාමාන 64ක්, තාපෝලින් ෂීට් 10ක් හා වැහි කබා 20ක් අවශ්‍යතාවය මත දිස්ත්‍රික් 25 වෙත හා ත්‍රිවිධ හමුදාව හා පොලීසිය වෙත 2019 අප්‍රේල් 10 වන දින බෙදා දීමට කටයුතු කරන ලදි.

➢ 2019 වර්ෂයේ අග භාගයේදී පමණ බෝට්ටු එන්ජින් 35ක් මිලදී ගන්නා ලදී. ඒ සඳහා මුළු වියදම වශයෙන් මිලියන 14ක මුදලක් වැය වන ලදී. එම මිලදී ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා සිදු කරන ලදී. එම බොට්ටු එන්ජින් ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට බෙදා දෙන ලදි.

➢ හදිසි මෙහෙයම් මැදිරියට අත්‍යවශ්‍ය පැවති සාකච්ඡා මේසයක් (Conference Table) 2019 දෙසැම්බර් මස 30 වන දින ඊ.එච් කුරේ ආයතනය මඟින් රු.462,399.00 මිලකට ප්‍රසම්පාදන ක්‍රියාවලිය හරහා මිලදී ගන්නා ලදී.

7.7 SPILLEX 2019 පෙරහුරු වැඩසටහන පැවැත්වීම

සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇතුළු පාර්ශවකාර ආයතන එකතු වී සමුද්‍රීයව සිදු වන තෙල් විසිරීම ව්‍යසනයට අදාළව පෙරහුරුවක් 2019 අප්‍රේල් 4 සහ 5 දිනයන්හි ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදි.

එහිදී සියලු සිද්ධි විධාන පද්ධතිය (ICS) භාවිතා කරමින් එහි වූ නියමිත තනතුරු හා වගකීම් නිසියාකාරව බෙදා ගනිමින් ප්‍රධාන මෙහෙයුම් මැදිරිය වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මැදිරිය භාවිතා කරන ලදී. එහි ඇති සියලු සන්නිවේදන ජාල මේ සඳහා එදින භාවිතයට ගෙන පෙරහුරුවට අදාළ සියලු නිවේදන අවශ්‍යතාවයන් මෙමඟින් ඉටු කරනු ලබයි.

වසර කිහිපයක සිට සිදු කරනු ලබන මෙම පෙරහුරුව සඳහා 2019 වසරේදී කොළඹ ගෝල්ෆේස් පිටිය යොදා ගනිමින් ප්‍රායෝගික පෙරහුරුවක් සිදු කරන ලදී. මේ සඳහා සම මෙහෙයුම් අණ දෙන නිලධාරී (Unified Command) වශයෙන් සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ සභාපති ද, අනෙක් මෙහෙයුම් අණ දෙන නිලධාරී වශයෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් ද කටයුතු කරන ලදී.

මෙහිදී ජාතික තෙල් විසිරීම් අවිනිශ්චිත සැලසුමට අනුව සියලු විධිවිධානයන් ක්‍රියාත්මක කළ අතර Table Top Exercise හෝ Field Exercise (භූමියේ සිදු කරන ප්‍රාදේශීය ක්‍රියාකාරකම්) ඇතුළත්ව අංග සම්පූර්ණ පෙරහුරුවක් සිදු කරන ලදී.

එක් එක් වසරේදී සිදු කරනු ලබන පෙරහුරු වැඩසටහනෙහි ඇති වන අඩුපාඩු ඊළඟ වසරේදී එම අඩුපාඩු සඳහා අවශ්‍ය පිළියසම් යොදමින් හා එක් එක් විශේෂ අවස්ථාවන්ට අදාළව පැන නඟින සියලු කරුණු සඳහා ඊළඟ වසරේදී පිළියම් සකස් කොට ඇති විය හැකි අනපේක්ෂිත තෙල් විසිරී යාමේ තර්ජනය සඳහා පෙර සූදානම් වීම, පුහුණු වීම, අවස්ථානෝචිතව තීරණ ගැනීම, පිළියම් යෙදීම, අවශ්‍ය ස්ථාන සඳහා නිශ්චිත වූ උපකරණ බෙදා හැරීම යන කටයුතු සිදු කිරීම සඳහා මෙම පෙරහුරුව ඉවහල් වේ.



පෙරහුරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

7.8 හදිසි අවස්ථාවන්හිදී මාධ්‍ය සම්බන්ධීකරණ

ආපදා අවස්ථාවන්හිදී පැය 24 පුරාම සියලුම මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය භාවිතා කරමින් පූර්ව දැනුම්දීම් සිදුකිරීමින් ජනතාව දැනුවත් කිරීමේ කටයුතු නිරන්තර සිදු කරනු ලබයි. තවද 2019 වසරේ ඇතිවූ ගංවතුර තත්ත්වයට ප්‍රථම නියමිත වෙලාවට පූර්ව දැනුම්දීම් මාධ්‍ය මඟින් නිකුත් කරන ලදී.

තවද, මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීමේ කටයුතු සහ තොරතුරු ලබාදීමේ කටයුතු සිදු කරන ලද අතර එය ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍යයන් සඳහා ද ක්‍රියාත්මක කරන ලදී. එමෙන්ම ජාතික හා ජාත්‍යන්තර වශයෙන් සමාජ මධ්‍ය ජාලා ඔස්සේ නිරන්තරයෙන්ම ජනතාව දැනුවත් කරන ලදී.



මාධ්‍ය හරහා ජනතාව දැනුවත් කිරීම - ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

7.9 ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම (ජා.හ.මෙ.සැ.)



ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම මඟින් රට තුළ ව්‍යසන ඇති විය හැකි අවස්ථා පැහැදිලි කරනු ලබන අතර ශ්‍රී ලංකාව තුළ සිදුවන කාළගුණ, ජල, ජීව විද්‍යාත්මක, තාක්ෂණික හා මිනිසා විසින් ඇති කරනු ලබන ව්‍යසන සඳහා ප්‍රතිචාර යාන්ත්‍රණයන් එමඟින් ආවරණය කරනු ලැබේ. කිසියම් ආයතනයක ශක්‍යතාවය සහ නිත්‍ය වගකීම ඉක්මවා යන ආකාරයේ හදිසි අවස්ථාවකදී ආයතන හා පුද්ගලයින් වෙත වගකීම් පවරාදීම සඳහා පහසුකම් සැලසීම, පූර්ව අනතුරු ඇඟවීමේ යාන්ත්‍රණය සක්‍රිය කිරීම සහ හදිසි අවශ්‍යතා මෙහෙයුම් සම්බන්ධීකරණය සහ ආයතනික වගකීම් හා කාර්ය භාරය, විස්තර කර ඇත. භාෂාත්‍රයෙන් පිළියෙල කරන ලද ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සඳහා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය 2017 අගෝස්තු 22 වන දින අංක අමප/17/2130/715/032 දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය මඟින් ලබාදී ඇති අතර එහි සංශෝධනයන් සම්පූර්ණ කර නැවත අනුමැතිය සඳහා සූදානම් කරමින් පවතී.

7.10 2019 වර්ෂය තුළදී කරන ලද හදිසි මෙහෙයුම් අංශයට අදාළ අනිකුත් කාර්යයන්

<u>හදිසි මෙහෙයුම් කටයුතු පහසු කිරීම්</u>

- බ්‍රිතාන්‍යයේ සැල්ෆර්ඩ් (Salford) විශ්වවිද්‍යාලය මඟින් ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණය පහසු කිරීම සඳහා Emergency Response Mobilize Software Platform සහිත ටච් ටේබල් (Touch Table) එකක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් අංශය වෙත 2019 වර්ෂයේ දෙසැම්බර් මස පරිත්‍යාග කරන ලදී. එමඟින් හදිසි මෙහෙයුම් සිදු කිරීම සඳහා අවශ්‍ය විවිධ මෘදුකාංග ඇතුළත් කර ගනිමින් මෙහෙයුම් සම්බන්ධීකරණය සිදු කළ හැක. සිතියම් පරිශීලණය කිරීම ඉතා පහසුවෙන් සිදු කළ හැකි වීමත් එම ස්ථානීය දර්ශණයන් ඉතා පැහැදිලිව නිරීක්ෂණ කිරීමේ හැකියාවත් විවිධ වූ මොඩල්ස් (Model) එනම්, Flood Inundation Modal, Landslide In fact Modal, Tsunami Inundation Modal වැනි මොඩලයන් පහසුවෙන් ක්‍රියාත්මක කිරීමේ හැකියාවත් එක් එක් ආයතන විසින් එක් කාර්යයක් සඳහා විවිධ Platform භාවිතා කර තිබියදී එම Platform එක් වේදිකා තලයකට ගෙන ඒමක් මෙමඟින් සිදු කර ගත හැකිය.





හදිසි මෙහෙයුම් මැදිරිය

- **<u>GIS Unit (ඒකකයක්) ස්ථාපිත කිරීම</u>**



හදිසි මෙහෙයුම් මැදිරිය තුළ හදිසි ආපදා තත්ත්වයක් සම්බන්ධීකරණය කිරීම හා පූර්ව අනතුරු ඇඟවීම පහසු කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක වන හදිසි ප්‍රතිචාර දැක්වීමේ සිතියම් ඒකකය (Emergency Mapping Unit) ආරම්භ කරන ලදී. එමඟින් 2019 වසරේ ඇති ගංවතුර ඇති වූ ස්ථාන හඳුනාගෙන එම අවස්ථාවන් සම්බන්ධීකරණය කිරීම සඳහා විශේෂ දත්ත ඇතුළත් සංෂිප්ත වාර්තා සහිත සිතියම් හා දත්ත පද්ධතීන් ඉදිරිපත් කරමින් ක්ෂණික තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු ලබා දීමේ ක්‍රියාවලියක් සැකසීම, අවශ්‍ය වාර්තා සකසා ලබා දීම හා එම වාර්තා මඟින් අවශ්‍ය ආයතන හා පුද්ගලයන් දැනුවත් කිරීම් සිදු කිරීම වැනි කරුණු රැසක් මෙම ඒකකය ආරම්භ කිරීම මඟින් සිදු කිරීමට බලාපොරොත්තු වනු ඇත.

7.11 හදිසි මෙහෙයුම් අංශය මගින් සිදු කරනු ලබන කාර්යයන්

- **පෘතුවියේ සිදු වන භූමි කම්පා පිළිබඳව අධීක්ෂණය හා සම්බන්ධීකරණ කටයුතු කිරීම.**

ඉන්දු ඕස්ට්‍රේලියන් භූ කාරක තැටියේ පමණක් නොව පෘතුවියට අයත් සියලුම භූ කාරක තැටි තුළ හටගන්නා භූමි කම්පා පිළිබඳ තොරතුරු **USGS APP** මඟින් ලබා ගෙන එම තොරතුරු මත අවශ්‍යතාවය අනුව කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව හා පතල් හා කැණීම් කාර්යාංශය **(GSMB)** සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරමින් එම ආයතනවල තාක්ෂණික තොරතුරු අනුව සැලකිය යුතු මට්ටමින් භූමි කම්පා ඇති වූ විට රික්ටර් මාපාංක 5ට වැඩි (5M) ඒවා පිළිබඳ අදාළ දිස්ත්‍රික්යන්හි ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක දැනුවත් කිරීම හා අවශ්‍ය මඟපෙන්වීම සිදු කර සුනාමි ඇති වීමට ඇති ඉඩකඩ පිළිබඳව දැනුවත් කරමින් මහජනතාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරීමට පියවර ගනු ලබයි.

- **දෛනික තත්ත්ව වාර්තා පිළියෙල කිරීම.**

දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලින් විධිමත් වූ ආකෘති භාවිතා කර ලබා ගන්නා තොරතුරු අනුව ජාතික මට්ටමින් දෛනික තත්ත්ව වාර්තා දිනකට තුන් වතාවක් යාවත්කාලීන කර අන්තර්ජාලය වෙත යොමු කරනු ලබයි. එසේම එම තත්ත්ව වාර්තා ජනාධිපති ලේකම් කාර්යාලය, අගමැති ලේකම් කාර්යාලය හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ද ෆැක්ස් මඟින් යොමු කරනු ලබයි. සාමාන්‍යයෙන් දෛනික තත්ත්ව වාර්තා 1095ක් පමණ 2019 වසරේදී නිකුත් කර ඇති අතර විශේෂ අවස්ථාවලදී ද විශේෂ තත්ත්ව වාර්තා ඉදිරිපත් කිරීම සිදු කරනු ලබයි.

- **ආපදා පෙරහුරු වැඩසටහන්වලදී ඊට අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම.**

සුනාමි, ජල ගැලීම් හා නායයෑම් පෙරහුරු වැඩසටහන් විවිධ මට්ටමින් සිදු කරනු ලබන අතර වාර්ෂිකව සුනාමි පෙරහුරු වැඩසටහන අන්තර්ජාතික හා කලාපීය මට්ටමින් සිදු කරනු ලබන අතර ඊට අවශ්‍ය තාක්ෂණික සහය හදිසි මෙහෙයුම් මැදිරිය තුළින් ලබා දෙනු ලබයි. ඒ හැරුනු විට දිස්ත්‍රික්කවල සුනාමි, ජල ගැලීම් හා නායයෑම් පෙරහුරු වැඩසටහන් ජාතික, ප්‍රාදේශීය හා ග්‍රාමීය මට්ටමින් සිදු කරනු ලබන අවස්ථාවලදී ඊට අවශ්‍ය තාක්ෂණික සහය දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකවලට ලබා දෙනු ලබයි.

- **හදිසි මෙහෙයුම් මැදිරිය නැරඹීමට පැමිණෙන අයව දැනුවත් කිරීම.**

දේශීය/ විදේශීය ශිෂ්‍ය කණ්ඩායම්, ආරක්ෂක අංශයන්හි නිලධාරීන්, පාර්ශවකරුවන්, රාජ්‍ය නිලධාරීන් මෙන්ම ආපදා කළමනාකරණ පිළිබඳ පුහුණුවන කණ්ඩායම් කණ්ඩායම් සඳහා හදිසි මෙහෙයුම්, පූර්ව දැනුම්දීම්, ආපදා කළමනාකරණය ආදී විෂයයන් පිළිබඳව වීඩියෝ සම්මන්ත්‍රණ මැදිරිය සහ හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානය යොදා ගනිමින් කරන ලද දැනුවත් කිරීම් 20ක් පමණ සිදු කරන ලදී.




හදිසි අවස්ථා මෙහෙයුම් මධ්‍යස්ථානයේ දැනුවත් කිරීම් සිදු කරමින්

7.12 අභියෝග

- හදිසි මෙහෙයුම් මැදිරිය යනු රටේ සිදු වන ඕනෑම ව්‍යසනයකදී සහ හදිසි අවස්ථාවකදී එම අවස්ථාව කළමනාකරණය කර ගැනීම සඳහා පැය 24x7 රාජකාරියේ යෙදෙන එක් අංශයකි. එමඟින් රටේ දිස්ත්‍රික් 25 තුළ සිදු වන ව්‍යසනයන් සම්බන්ධීකරණය කර ගනිමින් ආපදාවන්ට ගොදුරු විය හැකි හෝ ගොදුරු වී ඇති පුද්ගලයන් බේරා ගැනීම හෝ මුදවා ගැනීම අනෙකුත් පාර්ශවයන් සමඟ එකතු වී සිදු කරනු ලබයි. මේ සඳහා ජාතික හදිසි මෙහෙයුම් ඒකකය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යයාලයේ පවතින දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකක පැය 24 රාජකාරිය සිදු කිරීම වැදගත් වේ. මෙවන් සමහර දිස්ත්‍රික්කයන් හා ජාතික හදිසි මෙහෙයුම් ඒකකය පැය 24x7 පුරා ක්‍රියාත්මක වුවත් පවතින පුරප්පාඩු හේතුවෙන් පැය 24x7 සේවය ඉටු කිරීම සඳහා අනෙකුත් දිස්ත්‍රික්කයන් යොමු කර ගැනීමට අපහසු වී ඇත. එබැවින් පැය 24x7 සඳහා අවශ්‍ය බඳවාගැනීම් කඩිනමින් සිදු කළ යුතුව ඇත.

- පූර්ව අනතුරු ඇඟවීම් සහ හදිසි මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන උපකරණ ප්‍රමාණවත් නොවන බැවින් එම උපකරණ මිලදී ගැනීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම.

- හදිසි අවස්ථාවලදී සුළු මුදල් වියදම් වශයෙන් යම් මුදලක් අතැතිව තිබිය යුතු වුවත් සුළු ක්‍රියාකාරකම් එනම්, මුදවා ගැනීමේ කණ්ඩායම් ප්‍රවාහනය කිරීම, සමහර උපකරණ හෝ යන්ත්‍ර සඳහා ඉන්ධන වියදම්, යන්ත්‍ර අමතර කොටස් ක්ෂණික මිලදී ගැනීම් සඳහා මුදල් අතැතිව තිබිය යුතු වුවත් එවැනි මුදලක් ළඟ නොතිබීම.

8. මූල්‍ය අංශය

8.1 2019 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය ප්‍රගතිය

2019 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සඳහා රු.මි. 587.5ක ප්‍රතිපාදන මහාභාණ්ඩාගාරය විසින් ලබාදී තිබේ. එම ප්‍රතිපාදනවලින් රු.මි. 300ක් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පුනරාවර්තන වියදම් සඳහා වෙන් කර තිබූ අතර ඉන් රු.මි. 287.79ක් වියදම් කිරීමට හැකිවිය. ප්‍රාග්ධන වියදම් සඳහා රු.මි. 287.5ක් වෙන් කර තිබූ අතර එම ප්‍රතිපාදනවලින් රු.මි. 205.18ක් වියදම් කර තිබේ. මෙම සමස්ත ප්‍රතිපාදනවලින් එකිනෙක වැය විෂයන් සඳහා 2019 දෙසැම්බර් 31 දින වනවිට පහත දැක්වෙන පරිදි වැයකර තිබේ.

වගුව 8.1: 2019 දෙසැම්බර් මස 31 දිනට මූල්‍ය ප්‍රගතිය

වැය විෂය අංකය	ව්‍යාපෘතිය / වැඩසටහන / ක්‍රියාකාරකම්	මුළු සංශෝධිත ප්‍රතිපාදන 2019 (රු. මි)	මුළු වියදම් (රු. මි.)	ප්‍රගතිය%	
				මූල්‍ය	භෞතික
130-2-7-2-1503	**පුනරාවර්තන වියදම්**	**300**	**287.79**	**96**	**96**
	ප්‍රාග්ධන වියදම්				
130-2-7-2-2201 (I)	ආ. ක. ම. නිලධාරීන්ගේ ධාරිතා වර්ධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	3	3	100	100
130-2-7-2-2201 (II),(iii)	ගෘහ භාණ්ඩ, තොරතුරු තාක්ෂණ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ මිලට ගැනීම	5.5	3.94	72	72
130-2-7-3-2509	දිස්ත්‍රික්වල ආපදා අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	200	131.23	66	85
130-2-7-5-2509 (1)	ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ සූදානම් කිරීම - පුහුණු හා දැනුවත් කිරීමේ අංශය	20	19.68	98	98
130-2-7-5-2509 (11)	ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ සූදානම් කිරීම - පෙර සූදානම් අංශය	20	16.72	84	84
130-2-7-7-2509	ශ්‍රී ලංකාව සඳහා බහුවිධ ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීම	15	9.72	65	95
130-2-7-8-2103	ගංවතුර හා නායයෑම් සඳහා ආපදා ප්‍රතිචාර දැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා පිටත දහන යන්ත්‍ර (බෝට්ටු එන්ජින්) මිලට ගැනීම.	14	13.72	98	100
130-2-7-10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහයට අන්තර්ග්‍රහණය කිරීම.	10	7.17	72	95
	මුළු ප්‍රාග්ධන වියදම්	**287.50**	**205.18**	**67**	**82**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2019 රු. '000	2018 රු. '000
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත සහ උපකරණ	3	880,379	1,069,617
අස්පෘශ්‍ය වත්කම්	4	11,648	8,556
ජංගම වත්කම්			
ගංවතුර, නායයාම් විශේෂ ණය අත්තිකාරම්		90	209
ආපදා ප්‍රතිචාර උපකරණ තොග	5	8,979	49,987
භාණ්ඩ ලේඛණ	6	10,514	11,167
පෙර ගෙවීම් සහ අත්තිකාරම්	7	3,775	5,717
තැන්පතු සහ වෙනත් ලැබියයුතු දෑ	8	2,010	1,629
මුදල් සහ මුදල්වලට සමාන දෑ	9	33,458	38,471
මුළු ජංගම වත්කම්		**58,826**	**107,180**
මුළු වත්කම්		**950,853**	**1,185,353**
අරමුදල් සංචිත සහ වගකීම්			
ශුද්ධ වත්කම් / සම කොටස්			
සමුච්චිත අරමුදල්		**(741,074)**	**(142,062)**
සංචිත			
සංචිත ප්‍රත්‍යාගණනය - මෝටර් වාහන		206,436	206,436
මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන		1,078,382	869,847
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - මහා භාණ්ඩාගාරය		957	2,552
වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන - ICET		520,489	655,599
ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	10		
		(219,953)	(533,979)
මුළු ශුද්ධ වත්කම් / සම කොටස්		**845,237**	**1,058,393**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

ජංගම නොවන වගකීම්	සටහන්	**2019** රු. '000	**2018** රු. '000
වෙනත් සංවිධානවලින් ප්‍රදාන	11	14,425	16,020
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්	12	39,310	33,686
ජංගම වගකීම්			
වෙළෙඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ	13	51,675	77,048
වෙනත් ප්‍රතිපාදන	14	206	206
මුළු ජංගම වගකීම්		**51,881**	**77,254**
මුළු වගකීම්		**105,616**	**126,960**
මුළු අරමුදල් සහ වගකීම්		**950,853**	**1,185,353**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුව සකස් කර තිබේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරු වගකීම දරති.

නිශාන්ත අබේසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ මූල්‍ය (C.D)

මේජර් ජෙනරල් (විශ්‍රාමික) එස්. රණසිංහ
ආර්ඩබ්පි ආර්එස්පි එම්එස්සී එන්ඩියු පීඑස්සී
අධ්‍යක්ෂ ජනරාල්

අන්තර් කළමනාකරණ කමිටුව වෙනුවෙන් අත්සන් කළේ.

එච්. යූ. ආර්. ෆොන්සේකා
සාමාජික IMC

කමල් ගුණරත්න WWV RWP RSP USP ndc psc
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
ලේකම් - ආරක්ෂක අමාත්‍යාංශය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	සටහන්	2019 රු. '000	2018 රු. '000
ආදායම	15		
		280,550	287,125
වෙනත් ආදායම්	16		
		152,045	227,662
		432,595	**514,787**
පරිපාලන වියදම්			
	17	**(488,379)**	**(534,668)**
වෙනත් වියදම්	18	(9,249)	(13,439)
වෙනත් මෙහෙයුම්වල (අතිරික්තය/ හිඟය)		**(65,033)**	**(33,320)**
මූල්‍ය වියදම්		-	-
පෙර බදු (අතිරික්තය/ හිඟය)			
		(65,033)	**(33,320)**
බදු		-	-
වසර සඳහා මුළු අතිරික්තය (හිඟය)		**(65,033)**	**(33,320)**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශුද්ධ වත්කම්/ හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය

	මහා භාණ්ඩාගාරයේ ප්‍රාග්ධන ප්‍රධාන	ප්‍රාග්ධන ප්‍රධාන වත්කම් – මහාභාණ්ඩාගාරය	ප්‍රාග්ධන ප්‍රධාන වත්කම් ICET	ප්‍රාග්ධන සංචිත නැවත ඇගයීම M / V	සමුච්චිත අරමුදල	**මුළු ශුද්ධ වත්කම් ප්‍රමාණය**
	රු. '000	රු.. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2018 ජනවාරි 01 වන විට ශේෂය	**308,560**	**5,263**	**865,413**	**206,436**	**(108,742)**	**1,276,930**
පසුගිය වසරේ ගැලපීම්	-	-	-	-	-	-
2018 වසර සඳහා ක්‍රමක්ෂය	-	(2,711)	(209,814)	-	-	(212,525)
වසර තුළ ලද ප්‍රාග්ධනය	561,287	-	-	-	-	561,287
වසර සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	(533,979)	-	-	-	-	(533,979)
වසර සඳහා වන ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන	-	-	-	-	(33,320)	(33,320)
ප්‍රත්‍යාගණන සංචිත	-	-	-	-	-	-
M/V 2018 වසර						
2019 දෙසැම්බර් 31ට ශේෂය	**335,868**	**2,552**	**655,599**	**206,436**	**(142,062)**	**1,058,393**
2019 ජනවාරි 01 දිනට ශේෂය	335,868	2,552	655,599	206,436	(142,062)	1,058,393
පෙර වසරේ ගැලපීම්	-	-	-	-	-	-
2019 වසර සඳහා ක්‍රමක්ෂය	-	(1,595)	(135,109)	-	-	(136,704)
වසර තුළ ලද ප්‍රාග්ධනය	208,535	-	-	-	-	208,535
වසර සඳහා ප්‍රාග්ධන ප්‍රධාන මත ආයෝජන	(219,954)	-	-	-	-	(219,954)
2019 වසර සඳහා අතිරික්තය (හිඟය)	-	-	-	-	(65,033)	(65,033)
2019 දෙසැම්බර් 31ට ශේෂය	**324,449**	**957**	**520,490**	**206,436**	**(207,095)**	**845,237**

අමුණා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා ඇති සටහන් මූල්‍ය ප්‍රකාශයන්හි අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වන මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රගතිය පිළිබඳ ප්‍රකාශය

	2019 රු. '000	2018 රු. '000
පෙර බදු අතිරික්තය (හිඟය)	(65,033)	(33,320)
ගැලපීම්		
ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය	180,623	252,826
වත්කම් ප්‍රාග්ධන ප්‍රදානයන්හි ක්‍රමක්ෂය	(136,704)	(212,525)
මුදල් නොවන ලැබීම්	(1,187)	(96)
මුදල් නොවන ආදායම් – වෙනත් ආදායම්	(2,992)	-
වත්කම් බැහැර කිරීමෙන් ලද ලාභය	(92)	-
විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම් සඳහා ප්‍රතිපාදන	6,770	5,556
පාරිතෝෂික ගෙවීම්	(1,146)	(203)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීමට පෙර	**(19,761)**	**12,237**
මෙහෙයුම් අතිරික්තය (හිඟය)		
කාර්ය මණ්ඩල ගං වතුර/ නාය යාම් විශේෂ ණය වැඩිවීම්/ (අඩුවීම්)	119	120
වෙනත් ලැබිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(314)	(15)
භාණ්ඩ ලේඛණයේ වැඩිවීම් / (අඩුවීම්)	653	(3,228)
ආපදා ප්‍රතිචාර උපකරණ තොග වැඩිවීම්/ (අඩුවීම්)	41,008	(7,417)
පෙර ගෙවුම් සහ අත්තිකාරම් වැඩිවීම්/ (අඩුවීම්)	1,942	(3,067)
වෙනත් ගෙවිය යුතු දෑ වැඩිවීම් / (අඩුවීම්)	(25,373)	42,015
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මූල්‍ය ප්‍රවාහ	**(1,726)**	**40,645**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් මූල්‍ය ප්‍රවාහයන්		
දේපළ, පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම්	(6,260)	(37,063)
අස්පෘශ්‍ය වත්කම් අත්පත්කරගැනීම	-	(8,556)
දේපළ, පිරියත සහ උපකරණ **ගැලපීම්**	12,873	-
දේපල පිරියත සහ උපකරණ අලෙවි බැහැර කිරීම්	120	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**6,733**	**(45,619)**
මූල්‍ය කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහ		
ප්‍රාග්ධන ප්‍රදාන ශුද්ධ වැඩිවීම් (ලැබීම්)	208,535	561,287
ප්‍රාග්ධන ශුද්ධ වැඩිවීම් (ගෙවීම්)	(219,953)	(533,979)
රා.නො.ස./ අ.රා.නො.ස. වලින් ශුද්ධ ප්‍රදාන	1,398	5,912
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහ	**(10,020)**	**33,220**
මුදල් සහ මුදල්වලට සමාන දෑ වල ශුද්ධ වෙනස්කම්	(5,013)	28,246
වසර ආරම්භයේදී මුදල් සහ මුදල්වලට සමාන දෑ	38,471	10,225
වසර අවසානයේ මුදල් සහ මුදල්වලට සමාන දෑ (සටහන A)	**33,458**	**38,471**

සටහන A – මුදල් සහ මුදල්වලට සමාන දෑ	**රු. '000**	**රු. '000**
බැංකුවේ ඇති මුදල්	33,458	38,471
	33,458	**38,471**

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ 1 සිට 18 දක්වා වන සටහන් මූල්‍ය ප්‍රකාශවල අත්‍යවශ්‍ය කොටසක් නිරූපණය කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

අයවැය සන්සන්දනාත්මක ප්‍රකාශය – 2019

2019 දෙසැම්බර් 31 දිනට අවසන් වන වර්ෂය සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට රු. මිලියන 587.5ක මුදලක් වෙන් කර තිබේ. ඉන් රු. මිලියන 30ක් වර්තන වියදම් සඳහා වෙන්කර ඇති අතර ඉන් රු. මිලියන 287.5 වියදම් කර ඇත. එමෙන්ම, රු. මිලියන 287.5 ක් ප්‍රාග්ධන වියදම් ලෙස වෙන්කර තිබෙන අතර ඉන් රු. මිලියන 205.8ක් වියදම් කර තිබේ.

වැය ශීර්ෂ අංකය	ව්‍යාපෘතිය / වැඩසටහන/ ක්‍රියාකාරකම	ප්‍රතිපාදන (සංශෝධිත) (රු. මි.)	තථ්‍ය වියදම (රු. මි.)	ප්‍රගතිය %	
				මූල්‍ය	භෞතික
130-2-7-2-1503	**වර්තන වියදම**	**300**	**287.79**	**96**	**96**
	ප්‍රාග්ධන වියදම				
130-2-7-2-2201 (I)	ආ. ක. අ. යේ ධාරිතා වර්ධන වැඩසටහන්	3	3	100	100
130-2-7-2-2201 (II), (III)	ගෘහ භාණ්ඩ, තොරතුරු තාක්ෂණ උපකරණ සහ වෙනත් කාර්යාල උපකරණ ප්‍රසම්පාදනය	5.5	3.94	72	72
130-2-7-3-2509	දිස්ත්‍රික්කවල ආපදාවල බලපෑම අවම කිරීම සඳහා අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.	200	131.23	66	85
130-2-7-5-2509 (I)	ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ සූදානම් කරවීම, දැනුවත්කිරීමේ අංශය.	20	19.68	98	98
130-2-7-5-2509 (II)	ආපදා කළමනාකරණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම සහ සූදානම් කරවීම, පෙර සූදානම් අංශය.	20	16.72	84	84
130-2-7-7-2509	ශ්‍රී ලංකාව සඳහා බහු ආපදා අවදානම් පැතිකඩ සකස් කිරීම.	15	9.72	65	95
130-2-7-8-2103	ගං වතුර සහ නායයාම් ආපදා ප්‍රතිචාර යාන්ත්‍රණයේ ධාරිතා වර්ධනය	14	13.72	98	100
130-2-7-10-2509	ආපදා අවදානම් අවම කිරීම සංවර්ධනයේ ප්‍රධාන ධාරාවට අනුගත කිරීම.	10	7.17	72	95
මුළු ප්‍රාග්ධන වියදම		**287.5**	**205.68**	**67**	**82**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

1. පොදු තොරතුරු

1.1 වසතිය සහ නෛතික ස්වභාවය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය යනු, ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය ලබා දීම පිණිස 2005 අංක 13 දරන පනත යටතේ ස්ථාපිත කර ඇති ව්‍යවස්ථාපිත මණ්ඩලයක් වන අතර එය විද්‍යා මාවත, කොළඹ 7 හි පිහිටා තිබේ.

ආපදා කළමනාකරණ ජාතික සභාව පිහිටුවීම සඳහා පනතින් ප්‍රතිපාදන සැළසෙන අතර ශ්‍රී ලංකාව තුළ ආපදා අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සඳහා ආපදා කළමනාකරණ ජාතික සභාවට සහාය දීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පිහිටුවයි. අමාත්‍යාංශයේ ලේකම් ගේ සභාපතිත්වයෙන් යුතුව ආයතනයේ මනා ක්‍රියාකාරීත්වය අරමුණු කරගෙන අන්තර්වාර කළමනාකරණ කමිටු පිහිටුවා තිබේ. තව දුරටත් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

මධ්‍යස්ථානයේ කාර්යයන් පනතේ (1) උප කොටස යටතේ දක්වා තිබෙන අතර ඒවා පහත පරිදි වේ.

- ජාතික ආපදා කළමනාකරණ සැළසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම සකස් කිරීමේ දී සභාවට සහාය ලබා දීම සහ එය වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය අවස්ථාවල යෝජනා ලබා දීම.

- ජාතික ආපදා කළමනාකරණ සැලසුම සහ ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම දැරීම සහ ආපදා තත්ත්වයක් ප්‍රකාශ කළ අවස්ථාවක ජාතික හදිසි මෙහෙයුම් සැලැස්ම ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.

- අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු හෝ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන විවිධ ආපදා කළමනාකරණ සැලසුම් ජාතික ආපදා කළමනාකරණ සැලසුමට අනුගත කිරීම.

- විවිධ අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය සංස්ථා විසින් සකස් කරන ආපදා කළමනාකරණ සැලසුම් පදනම් කරගෙන පනතේ 10 වගන්තිය යටතේ ආපදා සූදානම, අවම කිරීම, වැළැක්වීම, සහන, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ කටයුතුවලට සැලසුම් සහ වැඩසටහන් සකස් කිරීම සහ එවැනි වැඩසටහන් සහ සැලසුම් ක්‍රියාත්මක කරන සංවිධාන සම්බන්ධීකරණය කිරීම එවැනි ක්‍රියාකාරකම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් මූල්‍ය ආධාර ලබා ගැනීම සහ එම මූල්‍ය ආධාර අදාළ ප්‍රදේශවලට නිදහස් කිරීම සහ එම ක්‍රියාකාරකම් අධීක්ෂණය සහ ඇගයීම.

- යෝග්‍ය සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ආපදා කළමනාකරණයට අදාළ ක්‍රියාකාරකම් සඳහා උපදෙස් සහ මාර්ගෝපදේශ

නිකුත් කිරීම සහ එම සංවිධාන සහ ලේකම්වරුන් සමඟ සහයෝගයෙන් වැඩ සටහන් ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ආපදා කළමනාකරණයට අදාළ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ප්‍රවර්ධනය කිරීම සහ ආපදා කළමනාකරණය පිළිබඳ දත්ත පද්ධතියක් සකස් කිරීම සහ නඩත්තු කිරීම.
- සභාවට/ අන්තර් කළමනාකරණ කමිටුවට වරින් වර සහ අවශ්‍ය අවස්ථාවල මේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් වාර්තා ඉදිරිපත් කිරීම.

1.3 ප්‍රධාන මෙහෙයුම් ස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාලය විද්‍යා මාවත, කොළඹ 7හි පිහිටා ඇති අතර සෑම කච්චේරියකම දිස්ත්‍රික් සම්බන්ධීකරණ ඒකක 25 ක් පිහිටුවා තිබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.4 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබෙන්නේ ආයතනය අඛණ්ඩ පැවැත්මක් සහිත එකක් බව උපකල්පනය කරමින් ය. නුදුරු අනාගතය තුළ ආයතනයට අඛණ්ඩ පැවැත්මක් සහිතව කටයුතු කිරීමට ඇති හැකියාව පිළිබඳ කළමනාකාරිත්වය විසින් තක්සේරුවක් කර තිබේ. තවදුරටත් අඛණ්ඩ පැවැත්මක් සහිතව ඉදිරියට යාමට ආයතනය තුළ ඇති හැකියාවට සැළකිය යුතු අවිනිශ්චිත තත්ත්වයක් ඇතිකරන ද්‍රව්‍යාත්මක අවිනිශ්චිතතාවන් පිළිබඳව කළමනාකාරිත්වය දැනුවත් වී නැති අතර ආයතනයේ මෙහෙයුම් නතර කිරීමට හෝ ආයතනය ඇවර කිරීමට හෝ ඔවුන්ගේ අදහසක් නොමැත. එමනිසා මූල්‍ය ප්‍රකාශ අඛණ්ඩ පැවැත්මක් තිබේ යන පදනම මත ක්‍රියාත්මක වේ.

1.5 මූල්‍ය කාලසීමාව

නියෝජනය කරන ආයතනයේ මූල්‍ය කාල සීමාව 2019 ජනවාරි 1 සිට 2019 දෙසැම්බර් 31 දක්වා වේ.

1.6 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ පදනම

1.6.1 අනුකූල වීමේ ප්‍රකාශය

මෙම ආයතනයේ මූල්‍ය ප්‍රකාශයන් සකස් කර තිබෙන්නේ ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර තිබෙන නිර්ණායකවලට අනුකූලව වේ.

1.6.2 මිනුම්වල පදනම

අදාළ සටහන් යටතේ සාධාරණ වටිනාකම සම්බන්ධ යෝග්‍ය හෙළි කිරීම් කර ඇති අවස්ථාවල හැර මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම උපචිත පදනම අනුව සකස් කර තිබෙන අතර ඓතිහාසික වියදම් පදනම මත සිදු කර තිබේ.

1.6.3 සන්සන්දනාත්මක තොරතුරු

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශන වල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.4 ප්‍රමාණාත්මක බව සහ සමාහරණය

සමාන අයිතමයන් සහිත සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙනම දක්වා තිබේ. වෙනස් ස්වාභාවයේ අයිතමයන් හෝ කටයුතු ඒවා ප්‍රමාණාත්මක නොවන අවස්ථාවල හැර වෙනම ඉදිරිපත් කර තිබේ.

1.6.5 ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල්

මූල්‍ය ප්‍රකාශ ආයතනය ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරය තුළ ආයතනයේ ශ්‍රිතයාත්මක සහ පිළිගැන්වීමේ ව්‍යවහාර මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබේ. ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර තිබෙන සියළු මූල්‍ය තොරතුරු වෙනත් ආකාරයකින් සඳහන් කර නොමැති අවස්ථාවල ආසන්න රු. 1000ට සකස් කර තිබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.7 සැළකිය යුතු ගිණුම්කරණ තක්සේරු සහ විනිශ්චයන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ සූදානම් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලවීම ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තාගත වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වල ගිණුම්කරණ ප්‍රතිපත්තියට බලපාන විනිශ්චයන්, තක්සේරු සහ උපකල්පනයන් සිදු කිරීමට අවශ්‍ය වේ. ඇස්ත ප්‍රතිඵල මෙම භාවිතා කරන ලද තක්සේරු සහ විනිශ්චයන්ගේන වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු හෝ පදනම් කරගත් උපකල්පන දැනට ක්‍රියාත්මක වන පදනම මත සමාලෝචනය කරයි. සංශෝධනය එම අදාළ කාලයට පමණක් බලපාන්නේ නම් හෝ අනාගත කාලයට බලපාන්නේ නම් ගිණුම්කරණ ඇස්තමේන්තුවලට කරන සංශෝධන ඇස්තමේන්තු සංශෝධනය කරන කාලයට අනුව හඳුනාගනු ලැබේ. මූල්‍ය ප්‍රකාශවල හඳුනාගන්නා ප්‍රමාණයන් මත වඩාත්ම සැළකිය යුතු බලපෑම තිබෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති යොදාගැනීමේදී ඇස්තමේන්තු, අවිනිශ්චිතතාවන් සහ තීරණාත්මක විනිශ්චයන් පිළිබඳ සැළකිය යුතු ක්ෂේත්‍ර සම්බන්ධ තොරතුරු පහත දැක්වේ.

1. නිශ්චිත දායකත්ව සැළසුම්

සේවකයාගේ පශ්චාත් සේවා දායක ප්‍රතිලාභ සැලසුම් තීරණය වන්නේ ආරක්ෂිත අනාගත මුදල් පිටතට ගලා ඒම් ක්‍රමය භාවිතා කරමින් වේ. එවන් ක්‍රමයන්වලට සාමාන්‍ය මාසික චේතනය සම්පූර්ණ කරන ලද වර්ෂ ගණන වර්ෂ අවසානයේදී සැළකිල්ලට ගනු ඇත. සැලසුමේ දීර්ඝ කාළීන ස්වභාවය අනුව එවන් ඇස්තමේන්තු සැළකිය යුතු අවිනිශ්චිතාවන්ට භාජනය වේ.

2. ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්ගේ වෙනස්කම්

ගිණුම්කරණ ඇස්තමේන්තු සහ තීරණාත්මක විනිශ්චයන්ගේ යම් වෙනස්කම් ඇත්නම් ඒවා මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වල හෙළි කරනු ලැබේ.

සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සාරාංශය

2.1 වත්කම් සහ ඔවුන්ගේ තක්සේරුවල පදනම්

2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

1. හඳුනාගැනීමේ සහ ගණනය කිරීමේ පදනම

දේපළ, පිරියත සහ උපකරණ හඳුනාගනු ලබන්නේ එම වත්කම්වලට අදාළ ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා එන බවත් එම වත්කම්වල වියදම විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි වන්නේ නම් පමණි.

සියලුම දේපළ , පිරියත සහ උපකරණ ආරම්භයේදී වියදම මත සඳහන් කරන අතර ඉන් පසුව සමුච්චිත ක්ෂයවීම් සහ අපචය හානි අඩුකර ගණනය කරනු ලැබේ. අලුත්වැඩියා සහ නඩත්තු වියදම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ප්‍රකාශයක් තුළින් හඳුනාගන්නා අතර දේපළ, පිරියත සහ උපකරණ අපචය වීම් සඳහාවන ධාරණ අගය අපචය වීම් සඳහා සමලෝචනය කිරීම සිදු කරන්නේ සිද්ධීන්ගේ වෙනස්වීම් හෝ සිද්ධීන් ධාරණ අගය නැවත අය කරගත නොහැකි බවට අඟවන්නේ නම් පමණි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැළකිය යුතු ගිණුම්කරන ප්‍රතිපත්ති

1. ක්ෂයවීම්

ක්ෂය වීම් ගණනය කරනු ලබන්නේ සියලු දේපල, පිරියත සහ උපකරණවල විදයම මත සෘජු රේඛා ක්‍රමය උපයෝගී කරගෙන වන අතර එය සිදු කරනු ලබන්නේ එම වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය මත එම ප්‍රමාණයන් කපා හැරීම සඳහා වේ.

වත්කම්වල ඇස්තමේන්තුගත ආයු කාලය පහත පරිදි වේ:

වත්කම් කාණ්ඩය	ප්‍රයෝජනවත් ආයු කාලය
ගොඩනැගිලි	50
ගෘහ භාණ්ඩ	10
සුනාමි සහ පූර්ව දැනුම් දීමේ කුළුණු	20
විදුලි සංදේශ උපකරණ	5 - 20
මෝටර් වාහන	5 - 10
පරිගණක	10
කාර්යාල උපකරණ	10

වත්කමක් ක්ෂය වීම ආරම්භ වන්නේ එය භාවිතාව සඳහා තිබෙන අවස්ථාවේ සිට වන අතර එය අවසන් වන්නේ එම වත්කම අලෙවිය සඳහා යනුවෙන් වර්ගීකරණය කරන ලද මුල් දිනය සහ එම වත්කම හඳුනාගත් දිනයටය.

දේපළ පිරියත සහ උපකරණවල විවිධ ප්‍රයෝජනවත් ආයු කාළ සිහිත සැළකිය යුතු අයිතමයන් වෙන වෙනම හඳුනාගෙන ක්ෂයවීම් කරනු ලැබේ.

2. ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලබන්නේ ඉවත් කිරීම මත හෝ එය භාවිතා කිරීමෙන් කිසිදු අනාගත ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විටයි. වත්කමක් ශේෂ පත්‍රයෙන් ඉවත් කිරීම මත ලැබෙන යම් කිසි ලැබීමක් හෝ අලාභයක් ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ ධාරණ අගය අතර වෙනස ලෙස වන අතර එය වසර තුළ විස්තීරණ අදායම් ප්‍රකාශය තුළ ඇතුළත් කරන අතර වත්කම් ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ.

2.1.2 අස්පෘශ්‍ය වත්කම්

අස්පෘශ්‍ය වත්කම් හඳුනාගනු ලබන්නේ එම වත්කම්වලට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය තුළට ගලා ඒමේ හැකියාවත් වත්කම්වල හානිත් විශ්වසනීය ලෙස ගණනය කළ හැකි වන්නේ නම් පමණි.

1. පරිගණක මෘදුකාංග

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග බලපත්‍ර ඒවා අත්පත් කරගැනීමට සහ භාවිතා කරන මට්ටමට ගෙන ඒම සඳහා වැය කළ වියදම මත ප්‍රාග්ධනිත කරනු ලැබේ. මෙම වියදම් ඒවායේ ඇස්තමේන්තුගත ආයු කාලය එනම් එවකට (වසර 10) මත ක්‍රමක්ෂය කරනු ලැබේ. පරිගණක මෘදුකාංග නඩත්තු කිරීම හා සම්බන්ධ වියදම් ගෙවිය යුතු වියදම් ලෙස හඳුනාගනු ලැබේ. ආයතනය මඟින් පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ සුවිශේෂී වූ මෘදුකාංග නිෂ්පාදන පහත සඳහන් නිර්ණායක සම්පූර්ණ වූ පසු අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගනු ලබයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කිරීම තාක්ෂණික වශයෙන් ශක්‍ය නිසා භාවිතා කිරීමට පහසු වේ ;
2. මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කර එය භාවිතා කිරීමට කළමනාකාරිත්වය අපේක්ෂා කරයි;
3. මෘදුකාංග නිෂ්පාදනය භාවිතා කිරීමට හැකියාවක් තිබේ;
4. මෘදුකාංග නිෂ්පාදනය අනාගත ආර්ථික ප්‍රතිලාභ ඇතිකරන ආකාරය ප්‍රදර්ශනය කළ හැකිය;
5. මෙම මෘදුකාංගය සකස් කිරීමේ කටයුතු සිදු කිරීමට සහ භාවිතා කිරීමට අවශ්‍ය වන තාක්ෂණික , මූල්‍ය සහ වෙනත් සම්පත් පවතින අතර ;
6. මෘදුකාංගය සකස් කිරීමට අදාළ වියදම් විශ්වසනීය ලෙස ගණනය කළ හැකිය.

මෘදුකාංග නිෂ්පාදනයේ කොටසක් ලෙස සෘජුව ආදේශ කළ හැකි ප්‍රාග්ධනික්ත වියදම්වලට මෘදුකාංග නිෂ්පාදනය සඳහා වන සේවක වියදම් සහ අදාළ වැය ශීර්ෂවල යෝග්‍ය කොටස් ඇතුළත් වේ.

අස්පෘශ්‍ය වත්කම් ලෙස හඳුනාගන්නා වියදම් ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමක්ෂය කරනු ලබන අතර එය වසර 10 ඉක්මවා නොයයි. මෘදුකාංගය භාවිතයට සුදුසු මට්ටමට පත්වන තෙක් මෘදුකාංගය සකස් කිරීමට යන වියදම සිදු කරගෙන යන ප්‍රාග්ධන වැඩ කටයුතු ලෙස පවත්වාගෙන යයි.

2.1.3 භාණ්ඩ ලේඛණ

භාණ්ඩ ලේඛන සටහන් කරන්නේ යල් පැනගිය සහ අඩු වේගයකින් ගමන් කරන අයිතමයන් සඳහා නියමිත දීමනා සකස් කිරීමෙන් පසු පිරිවැයේ සහ ශුද්ධ යථාර්තවාදී වටිනාකමේ අඩු අගය මත වේ.

2.1.4 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ යනු, සක්‍රිය වෙළෙඳපොලේ සඳහන් නොවන ස්ථිර හෝ නිශ්චය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ.

මූලික වශයෙන් ණය සහ ලැබිය යුතු දෑ හඳුනාගනු ලබන්නේ ඒවා ආරම්භ වූ දවසේ සිටය. මුදල් නොගෙවීමේ අවදානම ආවරණය කිරීමට තිබෙන හිඟ මුදල්වලින් අඩු කොට එහි වියදම මත ණය සහ ලැබිය යුතු දෑ සඳහන් කරයි.

ණය සහ ලැබිය යුතු දෑ යන්නට සේවක ණය සහ අත්තිකාරම්, තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ ඇතුළත් වේ.

2.1.5 මුදල් සහ මුදල්වලට සමාන දෑ

ආයතනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් සහ මුදල්වලට සමාන දෑ සලකා බලයි. මුදල් සහ මුදල්වලට සමාන දෑ යනු අතැති මුදල් සහ බැංකුවේ ඇති මුදල් වේ.

2.1.6 වගකීම් සහ ප්‍රතිපාදන

වගකීමක් ජංගම ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ එය සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ බේරුම් කිරීමට අපේක්ෂා කරන අවස්ථාවන්හි දී වේ. එය මූලික වශයෙන් සේවයේ අනාගත අරමුණ වෙනුවෙන් පවත්වාගන්නා අතර වාර්තාකරණ කාළසීමාවෙන් පසු මාස දොළහක් ඇතුළත බේරුම් කළ යුතු අතර එසේ නැතිනම් වාර්තා කරන කාල සීමාව අවසානයේ අවම වශයෙන් මාස දොළහකට එම වගකීම විලම්බනය කිරීමට කොන්දේසි විරහිත අයිතියක් නැත. ආයතනය අනිත් සියළුම වගකීම් ජංගම නොවන ලෙස වර්ගීකරණය කරයි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සැළකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

2.1.7 ප්‍රතිපාදන

මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් හඳුනාගන්නේ යම් කිසි අතීත සිදුවීමක් නිසා ආයතනයට යම් කිසි නෛතික හෝ අර්ථකාරී බැඳීමක් ඇති විට එම වගකීම බේරුම් කිරීම සඳහා වන්කම් පිටතට ගලා ඒමක් සිදුවීමට ඇති හැකියාවත් එම වගකීම විශ්වසනීය ලෙස ගණනය කිරීමට හැකි වීමත් යන කාරණය තුළ වේ.

2.1.8 සේවක ප්‍රතිලාභ

1. සේවක ප්‍රතිලාභ සැළසුම් - පාරිතෝෂික

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත යටතේ සේවකයන්ට පාර්තෝෂික ගෙවීමට ගිණුම්වල ප්‍රතිපාදන සළසා ඇති අතර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවකයන්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තුළ සේවය කල කාල සීමාව සඳහා මූල්‍ය වර්ෂය අවසානයේ වන වැටුපෙන් හරි අඩක ප්‍රමාණයට ගණනය කරන ලද වැටුප ගෙවනු ලැබේ. මෙම අයිතමය විවධ වගකීම් යටතේ කාණ්ඩ කරනු ලැබේ. මෙම ප්‍රතිපාදනය බාහිර වශයෙන් මූල්‍යකරණය කර හෝ ආයුගණක ලෙස ගණනය කර නැත.

2. නිශ්චිත දායකත්ව සැළසුම් - සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසිවලට අනුව සේවකයන් සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ දායකත්වයන්ට හිමිකම් කියයි. මේවා විස්තීරණ අදායම් ප්‍රකාශයේ දරන ලද වියදම් ලෙස හඳුනාගනු ලැබේ. ආයතනය දළ පාරිශ්‍රමිකවලින් 12%ක් සහ 3%ක් වශයෙන් සේවයකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට පිළිවෙලින් දායකත්වය සපයයි.

2.1.9 විදේශ මුදල් ගණුදෙනු පරිවර්තනය

ශ්‍රී ලංකා රුපියල් නොවන මුදල්වලින් සිදුවන ගනුදෙනු එම ගණුදෙනු සිදුකරන දිනයේ තථ්‍ය අනුපාත මත ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලබයි.

2.1.10 අරමුදල්, ප්‍රදාන සහ සංචිත උපයෝජනය සහ ලාබාගනැනීම් සම්බන්ධයෙන් වන ගිණුම්කරණය

ආයතනයට විශේෂිත සංවර්ධන ක්‍රියාකාරකම් සහ වැඩසටහන් සඳහා විවිධ ප්‍රදානයන් ලැබෙන අතර ඒවා අරමුදල් උපයෝජනය කළ වර්ෂයේ සහ ප්‍රදාන ලැබුණ වර්ෂයේ ආදායම් සහ වියදම් ලෙස හඳුනාගනු ලැබේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 03 – දේපල, පිරියත සහ උපකරණ

	01.01.2019 දිනට මුළු වියදම රු.. '000	වසර තුළ එකතු කිරීම්/ මාරු කිරීම සටහන රු.'000	වසර තුළ බැහැර කිරීම් රු.. '000	31.12.2019 දිනට මුළු වියදම රු.. '000	01.01.2019 දිනට කපා හරින ලද රු.. '000
ස්ථාවර වත්කම්					
සුනාම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	427,322	-	-	427,322	250,910
කාර්යාල උපකරණ	71,334	5,035	14,244	62,125	44,538
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	15,110	855	104	15,861	8,460
පරිගණක සහ උපාංග	111,037	1,556	12,059	100,535	38,960
මෝටර් වාහන	360,760	-	5,008	355,752	311,692
විදුලිසන්දේශ උපකරණ	1,562,736	-	-	1,562,736	410,516
මෘදුකාංග	6,657	-	6,657	-	4,541
	2,548,300	**7,446**	**31,542**	**2,524,331**	**1,069,617**

	01.01.2019 ට සමුච්චිත රු. '000	වසර සඳහා ප්‍රතිපාදන/ ගැලපුම් රු. '000	වසර තුළ ගැලපීම් සඳහා රු. '000	31.12.2019 දිනට මුළු පිරිවැය රු. '000	01.01.2019 දිනට වටිනාකම රු. '000
ක්ෂයවීම්					
සුනාම් සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	176,412	21,366	-	197,778	229,544
කාර්යාල උපකරණ	26,796	3,853	1,275	29,373	32,752
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	6,651	1,205	104	7,751	8,109
පරිගණක	72,077	9,342	12,058	69,361	31,174
වාහන	49,068	35,569	5,008	79,630	276,122
විදුලි සන්දේශ උපකරණ	1,152,221	107,839	-	1,260,060	302,677
මෘදුකාංග	2,116	-	2,116	-	-
	1,483,225	**160,727**	**20,561**	**1,643,952**	**880,379**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන් – 2019

සටහන 04 – අස්පෘශ්‍ය වත්කම්

	01.01.2019 දිනට මුළු වියදම රු. '000	වසර තුළ ඒකතු කිරීම් / මාරු කිරීම් රු. '000	වසර තුල මාරු කිරීම් / බැහැර කිරීම් රු. '000	31.12.2019 දිනට මුළු වියදම රු .'000	01.01.2019 දිනට ධාරණ අගය රු .'000
වියදම					
මිනුම්පති ජී අයි ඒස් දත්ත	8,556	-	-	8,556	8,556
මෘදුකාංග	-	6,657	-	6,657	-
	8,556	**6,657**	**-**	**15,213**	**8,556**

	01.01.2019 දිනට මුළු වියදම රු. '000	වසර තුළ ඒකතු කිරීම් / මාරු කිරීම් රු. '000	වසර තුල මාරු කිරීම් / බැහැර කිරීම් රු. '000රු. '000	31.12.2019 දිනට මුළු වියදම රු .'000	01.01.2019 දිනට ධාරණ අගය රු .'000
ක්‍රමක්ෂය					
මිනුම්පති ජී අයි ඒස් දත්ත	-	856	-	856	7,700
මෘදුකාංග	-	593	2,116	2,709	3,948
	-	**1,449**	**2,116**	**3,565**	**11,648**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන්– 2019

සටහන 05 – තොග වශයෙන් ඇති ආපදා ප්‍රතිචාර උපකරණ

අයිතමය	2019 ප්‍රමාණය	2019 මුළු වටිනාකම රු. '000	2018 ප්‍රමාණය	2018 මුළු වටිනාකම රු. '000
දම්වැල් කියත්	-	-	67	3,704
ජීවිතාරක්ෂක කබා	823	2,881	402	1,407
බෝට්ටු එන්ජින්	7	2,723	45	18,225
බෝට්ටු (බඳ)	1	195	1	195
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා	458	227	4023	506
මැනුවල් සයිරන්	2	49	2	49
වර්ෂාමාන	190	523	452	1,213
මන්න කැති	11	11	1001	966
සෙවීස සහ මුදවාගැනීම් කඹ	1	59	88	5,522
සර්ච් ලයිට්	57	106	57	106
බෝට්ටු අදින ට්‍රෙලර් මොඩලය Nu – SH 718 BT	-	-	-	-
කට්ටුමරන්	1	124	43	5,332
PA පද්ධති UNHABITAT	10	759	-	-
ගම් බූට් වැය ශීර්ෂ 7 යටතේ මිලදී ගත්	13	17	13	17
ජෙනරේටර්	1	38	1	38
ආ.ක.ම. හඳුනාගැනීමේ කබා	825	408	1350	668
බේරාගැනීමේ බෑග්	80	132	580	957
චතුර ටැංකි 10001	46	373	46	373
රබර් අත් මේස්	236	41	236	41
මුහුණු ආවරණ	705	105	780	116
පොරෝ	5	4	100	89
වැහි කබා	34	52	174	268
චතුර පොම්ප BGVSP 2 SP	2	62	5	155
ටාපෝලින් - ආ.ස. සේ;	30	90	167	501
හදිසි බේරාගැනීමේ බෝට්ටු	-	-	12	9,540
මුළු වටිනාකම		**8,979**		**49,987**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 06 – භාණ්ඩ ලේඛණ

	2019		2018	
	රු.	'000	රු.	'000
ලිපි ද්‍රව්‍ය		3,830		2,647
පරිගණක ටෝනර් සහ කාට්රිජ්		3,247		3,300
අත් පත්‍රිකා		224		1,384
පොත් පිංච		1,440		2,157
වාහන අලුත්වැඩියා සහ නඩත්තු		1,711		1,415
වෙනත්		62		263
මුළු එකතුව		**10,514**		**11,166**

සටහන 07 – පෙර ගෙවුම් සහ අත්තිකාරම්	**රු. .**	**'000**	**රු.**	**'000**
අත්තිකාරම් - උත්සව		63		185
අත්තිකාරම් – UNDP		595		535
අත්තිකාරම් - මුද්දර		20		-
පූර්ව දැනුම් දීමේ කුළුණු සඳහා පෙර ගෙවීම්		2,542		4,392
අත්තිකාරම් - මුදල් ප්‍රධාන කාර්යාලය		-		4
අත්තිකාරම්- සේවා සහ නඩත්තු ප්‍රධාන කාර්යාය		-		12
අත්තිකාරම් -මුදල් දිස්ත්‍රික්ක		-		344
අත්තිකාරම් -පෙර සූදානම් සහ සැළසුම් අංශය		491		185
අත්තිකාරම්- දිස්ත්‍රික්ක වල පුහුණු සහ සැළසුම්		-		20
අත්තිකාරම් - ඉන්ධන - දිස්ත්‍රික්ක		64		40
		3,775		**5,717**

සටහන 08 – තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ	**රු.**	**'000**	**රු.**	**'000**
ඩොන්ගල් මත තැන්පතු		3		3
තැන්පතු - ලංකා විදුලි බල මණ්ඩලය		1,109		1,109
තැන්පතු - ජාතික ජල සැපයුම් සහ ජලාපවාහන මණ්ඩලය		52		52
වෙනත් ලැබිය යුතු දෑ		847		466
		2,011		**1,630**

සටහන 09 – මුදල් සහ මුදල්වලට සමාන දෑ	**රු.**	**'000**	**රු.**	**'000**
ලංකා බැංකුව - 2744646		33,458		38,471
අතැති මුදල්		-		-
		33,458		**38,471**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 10 – ප්‍රාග්ධන ප්‍රදාන මත ආයෝජන

	2019 රු '000	2018 රු. '000
ප්‍රාග්ධන වියදම්		
ධාරිතා වර්ධන - කාර්ය මණ්ඩල පුහුණු	3,000	3,000
කුරුණෑගල, මාතර, හම්බන්තොට,කළුතර, මාතලේ, මුලතිව් සහ බදුල්ල දිස්ත්‍රික්ක වල මධ්‍යම ප්‍රමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	105,498	394,258
දිස්ත්‍රික්ක තුල කුඩා පරිමාණයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති	-	-
හදිසි ගං වතුර සඳහා උපකරණ මිලදී ගැනීම	54,693	85,590
පෙරසූදානම් සැළසුම් සඳහා රාජ්‍ය නියෝජිතායතනවලට සහාය දීම	16,700	24,968
ගං වතුර අවම කිරීමේ වැඩසටහන පානදුර කළුතර ලේකම් කොට්ඨාස	-	-
ගං වතුර අවම කිරීමේ වැඩසටහන දඹුල්ල ලේකම් කොට්ඨාසය	-	-
ගං වතුර අවම කිරීමේ වැඩසටහන යාපනය දිස්ත්‍රික්කය	-	-
ආපදා පෙර සූදානම් සහ කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීම		19,496
පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ ධාරිතා වර්ධනය – UNHABITAT	-	-
පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳ ධාරිතා වර්ධනය – UNHABITAT අදියර II	-	-
ගං වතුර අවම කිරීමේ වැඩසටහන	-	-
ශ්‍රී ලංකාවේ බහු ආපදා අවදානම් පැතිකඩ සංවර්ධනය	8,450	3,603
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය- අත්පත් කර ගැනීම සහෙ වෙනත්	-	-
ගං වතුර සම්බන්ධයෙන් ප්‍රතිචාර ධාරිතාව ශක්තිමත් කිරීම	10,996	-
ට්‍රැක්ටර් බවුසර් සහ බෝට්ටු මිලදී ගැනීම	-	31
ආපදා අවදානම අවම කිරීමේ දිස්ත්‍රික් සංවර්ධනයේ ප්‍රධාන ධාරා ගත කිරීම	4,414	3,032
ප්‍රාග්ධන ප්‍රදාන මත ශුද්ධ ආයෝජන	**219,953**	**533,979**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය – 2019

සටහන 11– වෙනත් සංවිධානවලින් ප්‍රදාන

	2019 රු. '000	2018 රු. . '000
Oxfam ආධාර	357	**688**
UNDP ආ.ක.ම. හඳුනාගැනීමේ කඹා	628	645
වර්ල්ඩ් විෂන් ලංකා	28	28
ADPC	265	265
CSE	234	234
තොරතුරු තාක්ෂණයට අදාළ මිලදී ගැනීම් A/ C	38	38
ලෝක සෞඛ්‍ය සංවිධානය – WHO	514	355
දැයට කිරුළ සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය	121	121
UNGABITAT අදියර II	86	86
ADPC ආරක්ෂිත දිනය	33	33
වැඩමුළු සඳහා SAARC	1,756	1,756
IDMP සඳහා UNDP	1,104	1,104
RSSDP සඳහා UNDP	160	160
SFDRR සඳහා UNDP	-	981
DOSEG සඳහා UNDP	668	668
ආපදා අවදානම් අවම කිරීම පළාත් පාළන මට්ටමට ගෙන යාම සඳහාUNDP	1,000	1,000
NDMP සඳහා UNDP	5	5
උමා ඔය ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය	-	1,001
1% පරිපාලන වියදම් – ව්‍යාපෘති කාර්යාලය	768	3,386
NDRSC ආධාර	5,093	1,908
CRIWMP සඳහා ආ. ක. අ. යේ අරමුදල්	715	647
පාසල් සුනාමි වැඩසටන සඳහා UNDP	852	913
	14,425	**16,020**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් – 2019

සටහන 12 – විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම්

	2019 රු . '000	2018 රු. '000
2019 ජනවාරි 01 දිනට ශේෂය	**33,686**	**28,429**
වසර සඳහා ප්‍රතිපාදන	6,770	5,556
	40,456	33,985
ගෙවීම්	(1,146)	(299)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**39,310**	**33,687**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සේවය කළ සේවකයන්ට ඔවුන් එම අමාත්‍යාංශයේ සේවය කළ වසර ගණන අනුව එක් එක් වර්ෂයේ මූල්‍ය වර්ෂය තුළ අවසාන මාසයේ ලද වැටුප මෙන් අඩ මසක වැටුප ගණනය කොට ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික ගෙවීම සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගිණුම්වල ප්‍රතිපාදන සකස් කොට ඇත. මෙම අයිතමය විලම්බිත වගකීම් යටතේ සටහන් කර තිබේ. මෙම ප්‍රතිපාදන සඳහා බාහිර අරමුදල් ලැබීමක් හෝ ආයුගණක ලෙස ගණනය කිරීමක් සිදු නොවේ.

ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 අනුව - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් නිකුත් කර ඇති සේවක ප්‍රතිලාභ ප්‍රමිතීන් ට අනුව එහි 57 ඡේදයේ සහ පරිශිෂ්ටය ඩී හි දක්වා ඇති නිර්ණායකයන්හි ආයතනයේ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් සකස් කිරීම සඳහා නිර්ණායක දක්වා ඇති අතර යම් ආයතනයක කාර්ය මණ්ඩලය 100 ඉක්මවන්නේ නම් පරිශිෂ්ටය ඊ හි දක්වා ඇති උපදෙස් අනුගමනය කළ යුතුය. පරිශිෂ්ටය ඩී (2) හි භාණ්ඩ අලෙවිකරණයේ නියැලෙන හෝ සේවා සැපයීමේ නියැලෙස රාජ්‍ය සංස්ථා දැක්වේ.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශනවලට සටහන් – 2019

සටහන 13 – වෙනත් ගෙවිය යුතු දෑ

	2019 රු. '000	2018 රු . '000
ගෙවිය යුතු සේ.අ.සා. අරමුදල්	2,478	2,478
ගෙවිය යුතු උපයන විට සහ SRL	2	7
ගෙවිය යුතු වැටුප් සහ වේතන	30	29
ගෙවිය යුතු අතිකාල	1,878	1,185
ගෙවිය යුතු ප්‍රවාහන දීමනා	926	598
ගෙවිය යුතු ඉන්ධන වියදම්	271	176
ගෙවිය යුතු කුළී සහ දේශීය බදු	69	50
ගෙවිය යුතු තැපැල් සහ සන්නිවේදන	1,217	1,336
ගෙවිය යුතු වාහන නඩත්තු	560	660
ගෙවිය යුතු විද්‍යුත් සහ ජල	938	840
ගෙවිය යුතු වෙනත් සේවා	14	18
ගෙවිය යුතු කාර්ය මණ්ඩල සුභ සාධන	4	-
ගෙවිය යුතු අවම කිරීමේ ව්‍යාපෘති	42,629	68,367
ගෙවිය යුතු ආරක්ෂක සේවා	113	127
ගෙවිය යුතු සනීපාරක්ෂක සේවා	7	112
ගෙවිය යුතු පාර්තෝෂික	-	50
ගෙවිය යුතු වාර්ෂික විගණන ගාස්තු	539	-
Docu. Drama – කෙටි චිත්‍රපටිය	-	1,017
	51,675	**77,048**

සටහන 14 – වෙනත් ප්‍රතිපාදන

	රු. '000	රු. '000
තොග අභිමි වීම පිළිබඳ ප්‍රතිපාදන	206	206
	206	**206**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 15 – ආදායම්

	2019 රු. '000	2018 රු.'000
වර්තන වියදම් ප්‍රදාන	280,550	287,125
	280,550	**280,550**

මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු වර්තන වියදම් සඳහා වන ප්‍රදාන ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති 20 - රජයේ ප්‍රදාන සඳහා ආධාර පිළිගැනීම එම ආධාර ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇති විට පමණක් සිදු කළ යුතුය. එමනිසා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තම අදායම ලෙස 2019 දෙසැම්බර් 31 වන විට ලැබුණු වර්තන ආදායම පමණක් ඇතුළත් කර තිබේ. එහෙත් ආදායම මත වියදම සිදුවන පදනම මත ගිණුම්වලට ඇතුළත් කර තිබේ.

සටහන 16 – වෙනත් ආදායම්

		Rs. '000	Rs. '000
Oxfam ආධාර		691	-
UNDP ආධාර		260	322
ටෙන්ඩර් තැන්පතු - ආපසු නොගෙවන		10	136
විවිධ ආදායම්		1,337	5
ප්‍රාග්ධන ප්‍රදාන මත ක්‍රමක්ෂය	සටහන: 16.01	136,705	212,525
WHO ආධාර		2,410	1,078
NEOP සඳහා UNDP ආධාර		-	5
රක්ෂණ හිමිකම් පෑම		-	51
SFDRR සඳහා UNDP ආධාර		981	-
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය ආධාර		-	2,766
ඩේටා ව්‍යාපෘතිය සඳහා UNDP ආධාර		-	257
NDRSC ආධාර		4,112	7,667
CRIWMP සඳහා ආපදා කළමනාකාර අමාත්‍යාංශයේ ආධාර		842	272
පාසල් සුනාමී වැඩසටහන සඳහා UNDP ආධාර		61	2,163
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් සහාය ආධාර		-	415
ජංගම ව්‍යාපෘති ආධාර මගින් අදායම් හඳුනාගැනීම් සහාය		1,187	-
අවම කිරීම් ව්‍යාපෘතිවල පරිපාලන වියදම්වලින් 1% ක් උපයෝජනය කිරීම පිළිබඳ ආදායම් හඳුනා ගැනීම.		3,449	-
		152,045	**227,662**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 16 – වෙනත් අදායම්

උප සටහන – 16:01 වත්කම් සඳහා ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය

	01.01.2019 දිනට මුළු වියදම රු '000	එකතු කිරීම් / ආයෝජන වසර තුළ රු . '000	පෙර වර්ෂයේ ගැලපීම් රු . '000	31.12.2019 දිනට මුළු වියදම රු. '000
ලබාදුන් වත්කම්				
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	426,287	-	-	426,287
කාර්යාල උපකරණ	5,916	-	-	5,916
ගෘහ භාණ්ඩ සහ මෙවලම්	559	-	-	559
මෝටර් වාහන	259,413	-	-	259,413
විදුලි සන්දේශ උපකරණ	1,547,757	-	-	1,547,757
පරිගණක සහ උපාංග	66,763	-	-	66,763
මෝටර් වාහන – වෙනත් භාණ්ඩාගාර	31,675	-	-	31,675
	2,338,370	**-**	**-**	**2,338,370**

	01.01.2019 ට සමුච්චිත ශේෂය රු. '000	වසර සඳහා ක්‍රමක්ෂය රු. '000	පෙර වර්ෂයේ ගැලපීම් රු. '000	31.12.2019 ට සමුච්චිත ශේෂය රු. '000
ක්‍රමක්ෂය				
මෝටර් වාහන ICET	259,413	-	-	259,413
සුනාමි සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු ICET	154,528	21,314	-	175,842
පරිගණක සහ උපාංග ICET	43,610	6,676	-	50,286
කාර්යාල උපකරණ ICET	5,549	183	-	5,732
විදුලිසන්දේශ උපකරණ ICET	1,149,479	106,881	-	1,256,359
ගෘහ භාණ්ඩ සහ මෙවලම් ICET	447	56	-	503
මෝටර් වාහන භාණ්ඩාගාර වෙනත්	29,123	1,595	-	30,718
	1,642,149	**136,705**	-	**1,778,853**

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන් – 2019

සටහන 17 – පරිපාලන වියදම්

	2019 රු. '000	2018 රු. '000
ක්ෂය වීම්		
සුනාම සහ පූර්ව අනතුරු ඇඟවීමේ කුළුණු	21,366	21,366
විදුලි සන්දේශ උපකරණ	107,839	182,445
ඉඩම්	-	-
පරිගණක	9,342	7,944
කාර්යාල උපකරණ	3,853	3,384
මෘදුකාංග	-	1,017
ගොඩනැගිලි සහ ආකෘති	-	-
වාහන	35,569	35,569
ගෘහභාණ්ඩ සහ මෙවලම්	1,205	1,101
මැනුම්පති GIS දත්ත	856	-
මෘදුකාංග ක්‍රමක්ෂය	593	-
නඩත්තු වියදම්		
පිරියත යන්ත්‍රෝපකරණ සහ වෙනත් උපකරණ නඩත්තුව	21,287	14,526
ගොඩනැගිලි නඩත්තු	-	481
වාහන නඩත්තු	16,093	15,814
සුද්ගල පාරිශ්‍රමික		
ආ.ක.ම. විසින් සේ.අ.සා.අ. දායකත්වය (12%)	18,185	17,302
වෙනත් දිමනා	36,692	45,940
ආ.ක.ම. විසින් සේ.භා.අ. දායකත්වය (3%)	4,546	4,325
වැටුප් සහ වේතන වියදම් ගිණුම	116,580	99,737
රියදුරන්ට නිල ඇඳුම් දීමනා	152	152
අතිකාල වියදම්	17,120	12,995
වර්තන වියදම්		
ගෙවිය යුතු සේ.අ.සා සේ.භා.අ. දායකත්වය	-	-

බදුකරණය	-	-
ගෙවිය යුතු විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6,770	5,556
සේවා		
සනීපාරක්ෂක කටයුතු	1,300	1,208
විමර්ශන ගාස්තු	-	221
දැයට කිරුළ ආ. ක. අ.	-	-
කුළී සහ දේශීය බදු	858	2,041
IMC ගෙවීම්	267	376
සම්මුඛ පරීක්ෂණ වලට අදාළ වියදම්	124	114
තැපැල් සහ විදුලිසන්දේශ	18,032	18,346
වෙළෙඳ දැන්වීම්	126	931
භාෂාපරිවර්තන ගෙවීම්	346	164
ඩෙංගු වැඩසටහන සඳහා වියදම්	-	-
AMC ගෙවීම්	175	131

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

සටහන 17 – පරිපාලන වියදම්

	2019 රු. '000	2018 රු. '000
	410	626
වෙනත් වියදම්		
විදුලිය සහ ජලය	12,018	11,924
ආරක්ෂක සේවා	1,283	1,556
නීති ගාස්තු	16	85
ප්‍රවාහන ගාස්තු	92	18
වාර්ෂික විගණන ගාස්තු	539	-
සැපයුම්		
මුද්‍රණ, ලිපි ද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	11,083	7,055
පුවත් පත් සහ වෙනත්	170	195
ඉන්ධන වියදම්	10,262	9,302

සංග්‍රහ වියදම්	834	1,266
ප්‍රවාහන සහ යැපුම් වියදම්		
ප්‍රවාහන සහ යැපුම් වියදම් - දේශීය	9,063	5,766
ප්‍රවාහන සහ යැපුම් වියදම් - විදේශ	3,333	3,687
	488,379	**534,668**

සටහන 18 – වෙනත් වියදම්

	2019 **රු. '000**	**2018** **රු. '000**
Oxfam ආධාර වලින් වියදම්	691	-
UNDP ආධාර වලින් වියදම්	260	322
WHO වියදම්	2,410	1,078
NEOP වියදම්	-	5
SFDRR වියදම්	981	-
ආ.ක.ම. ව්‍යාපෘති කාර්යාලය සඳහා උමා ඔය වියදම්	-	1,517
NDRSC වියදම්	4,114	7,667
ආ. ක. අ.වීසින් ලබා දෙන ආධාර මත CRIWMP වියදම්	732	272
UNDP ආධාර මගින් පාසල් සුනාමි වැඩසටහන සඳහා ආධාර	61	2,163
හම්බන්තොට ලේකම් කාර්යාලයේ ආධාර වියදම්	-	415
	9,249	**13,439**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : ඩීඑමජී/ඒ/ඩීඑමසී/එෆ්එස්/2019/12

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2020 අගෝස්තු 12 දින

අධ්‍යක්ෂ ජනරාල්

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රසිද්ධ කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) වාර්ෂික තොග සමීක්ෂණයේදී හඳුනාගත් පිරිවැය රු.1,652,924 ක් වූ යල්පැන ගිය, විනාශ කල යුතු භාණ්ඩ හා හඳුනාගත් භාණ්ඩ ඌණතාවයන් හා අස්ථානගත වූ භාණ්ඩ සඳහා මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදනයන් සිදු කර නොතිබුණි.

(ආ) ආයතනයට එරෙහිව මෝටර් වාහන සැපයුම්කරුවකු විසින් රු.මිලියන 15ක් අයකර ගැනීමට නඩු පවරා තිබුණි. ඊට අමතරව තවත් බාහිර පාර්ශවයන් 07ක්ද ආයතනයට එරෙහිව වන්දි ඉල්ලා නඩු පවරා තිබුණු නමුත් මෙකී වගකීම් සම්බන්ධව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ප්‍රතිපාදන වෙන් කිරීමක් හෝ මූල්‍ය ප්‍රකාශන වල හෙලිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 19 අනුව සේවක පිරිවැටුම, ආබාධිත හා කලින් විශ්‍රාම ගැනීම්, වට්ටම් අනුපාත, අනාගත වැටුප් වැඩි වීම් හා ප්‍රතිලාභ ආදී ආයුගණක උපකල්පන පදනම් කරගෙන අයුගණක තක්සේරු ක්‍රමය (Actuarial valuation method) අනුව සේවක ප්‍රතිලාභ ගණනය කර ප්‍රතිපාදන වෙන් කළ යුතු වුවද ආයතනය විසින් සමාන්‍ය නෛතික විධිවිධාන පදනම් කරගෙන රු. මිලියන 39 ක ප්‍රතිපාදනයක් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතු අයවැයගත හා සත්‍ය වටිනාකම් සන්සන්දනය කිරීමේ ප්‍රකාශය සහ ඊට ආදල මූල්‍ය ප්‍රකාශනවල සටහන් යටතේ ඉදිරිපත් කළ යුතු හෙලිදරව් කිරීම් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින්

සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය පවත්වාගෙන ගොස් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

  අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිතිරීති විධිවිධාන වලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ 237	ඇස්තමේන්තුගත වටිනාකම රු.71,750,056 ක් වූ ආපදා අවම කිරීමේ ව්‍යාපෘති 14 ක වැඩ නිමකළ බවට විධිමත් වැඩ අවසන් කිරීමේ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මු.රෙ 751	සියළුම භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි ගණන් තැබිය යුතු වුවද මධ්‍යස්ථානය විසින් ලැබීම් හා නිකුත් කිරීම් එම අවස්ථාවන්හිදීම පොත්වල සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii) මු.රෙ.752	බඩු ලේඛන පොතෙහි සෑම සටහනක්ම බඩු ලේඛන වවුචරයකින් තහවුරු විය යුතු වුවද ගබඩා පොත් වල භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් සටහන් කිරීමේදී ඊට අදාල භාණ්ඩ ලැබීම් පත් හා නිකුත් කිරීම් පත්වල අංක තොග පොතෙහි සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම ලැබීම් හා නිකුත් කිරීම් යන දෙවර්ගයේම බඩු ලේඛන වවුවර් වලට අනුපිළිවෙලින් අංක යොදා ඒවා ගොනුකර තැබිය යුතු වුවද මධ්‍යස්ථානයේ භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීමේ පත් අනුක්‍රමික අංක පිළිවෙලක් නොමැතිව නිකුත් කර ගොනුගත කර තිබූ බව නිරීක්ෂණය විය.
(iv) මු.රෙ .754	සෑම මුදල් වර්ෂයකම අවසානයේදී බඩු ලේඛන පොත තුලනය කර " අතැති ශේෂය" ඊලඟ මුදල් වර්ෂයට ඉදිරියට ගෙන යා යුතු වුවද මධ්‍යස්ථානයේ ගබඩා පොත් 2018 වර්ෂයෙන් පසු එසේ තුලනය කර ශේෂ ඉදිරියට ගෙන ගොස් නොතිබුණි.

(ආ)	අංක 01/2012 හා 2012 ජනවාරි 05 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය	කොන්ත්‍රාත් පැවරීම සඳහා ප්‍රජාපාදක සංවිධාන තෝරාගැනීමේ කමිටු සඳහා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය විසින් නම් කළ නියෝජිතයෙකු ඇතුලත් විය යුතු නමුත් එවැනි නියෝජිතයන් පත්කර නොතිබුණි.
(ඇ)	අංක 6/97 හා 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 (VI) ඡේදය	අතිකාල වැඩ පැවරීම් සම්බන්ධයෙන් තමන් කරන ලද නිර්දේශයන් සෑම මාස 03 කට වරක්ම ආයතන ප්‍රධානියා විසින් සමාලෝචනය කළ යුතු වුවද එසේ කර නොතිබුණි.
(ඈ)	අංක 19 /89 හා 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 05 ඡේදය	ඡේදයේ සඳහන් උප වගන්තිවල දැක්වෙන තොරතුරු පරිදි අතිකාල වැඩ සඳහා ලේඛනයක් පවත්වාගෙන යා යුතු වුවත් චක්‍රලේඛය ප්‍රකාරව ලේඛනයක් පවත්වා නොතිබුණි.
(ඉ)	අංක 12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	
	(i) 6.5.3 ඡේදය	මධ්‍යස්ථානය විසින් 2014 සිට 2017 දක්වා වාර්ෂික වාර්තා 2020 ජුනි 16 දින වන විටත් පාර්ලිමේන්තුවට සභාගත කර නොතිබුණි.
	(ii) 9.7 ඡේදය	බහුවිධ අවදානම් සිතියම් ගත කිරීම සඳහා දත්ත සකස් කිරීම වෙනුවෙන් දිමනා ලෙස රු.3,428,400 ගෙවීම් කර තිබුණ ද ඒ සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය බලතල සහ කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බවග

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) ආපදා අවදානම් අවම කිරීම් සංවර්ධන ප්‍රවාහය ඇතුලත් කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කිරීමට උපදේශන සේවා ආයතනයක් තෝරා ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටුව උපදේශකගේ තෝරා ගැනීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.3 ඡේදයට අනුව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කර නොතිබුණු අතර මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට පෙර ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. උක්ත මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.4 ඡේදය ප්‍රකාරව එකඟ වූ වටිනාකමින් සියයට 20 ක් පමණක් අත්තිකාරම් වශයෙන් ගෙවිය හැකි වුවද එකඟ වූ වටිනාකමින් සියයට 30 ක් එනම් රු.1,927,500 ක් අත්තිකාරම් ඇපකරයක් රහිතව ගෙවා තිබුණි. මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.6.1 ඡේදයට අනුව ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර එකඟ වූ කාලය තුල කාර්යය නිමකරද නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකාවට බලපා ඇති බහුවිධ ආපදා තොරතුරු ඇතුලත් කරමින් අවදානම් දර්ශක පොතක් මුද්‍රණය කිරීම වෙනුවෙන් පැහැදිලිව හඳුනාගත් අවශ්‍යතාවයක් හා අරමුණක් නොමැතිව හා බෙදාහැරියයුතු ආයතන පිළිබඳ පූර්ව සැළසුමක්ද නොමැතිව රු. 1,850,000 ක් වැය කර පොත් 100 ක් මුද්‍රණය කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.(II) අනුව පිරිවිතර සමාලෝචනය හා අනුමත කිරීම සිදුවී නොතිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කිරීමට ලබාදුන් පිරිවිතර වලට පටහැනිව පොත් මුද්‍රණය කර තිබුණි.

(ඇ) ඊසාන දිග මෝසම් වර්ෂාවේ බලපෑම නිසා ඇති විය හැකි ආපදා තත්වයන් මැඩ පැවැත්වීම සඳහා වන පොලිසැක් උරුවල අවශ්‍යතාවය දිස්ත්‍රික් කාර්යාල මගින් 2019 වර්ෂයේ දන්වා තිබුණද මධ්‍යස්ථානය විසින් අදාල මිලදී ගැනීම් සැලසුම් නොකිරීම නිසා හදිසි මිලට ගැනීම මගින් අදාල මළු සම්පාදනය කර ගැනීමට සිදුව තිබුණි. මේ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවේ පිරිවිතර වලට අනුකූල නොවන ලෙස එක් දිනයකින්

හාණ්ඩ මිලට ගැනීම සඳහා රු.1,200,000 ක් වැය කර තිබූ අතර එයින් පොලිසැග් උර 500 ක් මධ්‍යස්ථානයේ මූල්‍ය හා මානව සම්පත් අංශය භාවිතයට ගෙන තිබුණි.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ සංශෝධන කටයුතු 2008 වර්ෂයේ සිට සිදු කර තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන තෙක් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර අවශ්‍යතාවයක් වන සෙන්දායි රාමුව අනුව ආපදා අවදානම අවම කිරීමේ සැලැස්මක් සකස් කිරීම සඳහා එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2015 වර්ෂයේදී මධ්‍යස්ථානයට රුපියල් මිලියන 1.30 ක ලබා දී තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් එවැනි සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එසේම, 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ 8 වන පරිච්ඡේදයේ 2 (අ) පරිදි 2018 - 2030 කාල පරිච්ඡේදය වෙනුවෙන් ජාතික ආපදා කළමනාකරණ සැලැස්මක් පිළියෙල කිරීම සඳහා එක්සත් ජාතින්ගේ සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂයේදී රුපියල් මිලියන 02 ක් මධ්‍යස්ථානය වෙත ලබාදී තිබුණු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාල කාර්යය අවසන් කර නොතිබුණි.

(ඇ) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුල ආපදා කළමණාකරන ව්‍යාපෘති 67 ක් ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යස්ථානය විසින් රුපියල් මිලියන 68.3 ක් තුන්වන පාර්ශවයක් වෙත මුදාහැර තිබුණ නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ආදාල ගිවිසුම්, ව්‍යාපෘති සඳහා පිළියෙල කළ අනුමත ඇස්තමේන්තු, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සහ පසුවිපරම් කටයුතු සිදු කිරීමට වගකිව යුතු පාර්ශව පිලිබඳ විස්තර, කොන්ත්‍රාත්කරුවන් සමග එලඹී ගිවිසුම්වල පිටපත් සහ ප්‍රගති වාර්තා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

(ඈ) මොනරාගල දිස්ත්‍රික්කයේ කෘෂි කාර්මික වගා ළිං ඉදි කිරීම වෙනුවෙන් රුපියල් මිලියන 26.9 ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද දිස්ත්‍රික් ලේකම්ගේ මාර්ගෝපදේශ අනුව කටයුතු නොකිරීම නිසා රුපියල් මිලියන 10.5 ක් 2019 දෙසැම්බර් 10 දින අමාත්‍යාංශය වෙත නැවත පවරාගෙන තිබුණි. එසේම ප්‍රතිලාභීන් 53 වෙනුවෙන් වගා ළිං සැකසීම සඳහා රුපියල් මිලියන 26.5 ක ප්‍රතිපාදන වෙන් කර තිබුණ ද ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය ඇගයීමකින් තොරව මුදල් වැයකර තිබීම හේතුවෙන් අවශ්‍යතාවයක් නොමැති ළිං 24 ක් තැනීම සඳහා වැය කළ රු.මිලියන 12 ක නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ඉ) තිරසර සංවර්ධන පිළිබඳ එක්සත් ජාතීන්ගේ "වසර 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සැම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව තිබුණු අතර තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ලහා වීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන මගින් විවිධ වැඩ සටහන් 05ක් වෙනුවෙන් ලැබී තිබුණු රුපියල් මිලියන 3.56 ක මුදලක් සහ සාර්ක් සංවිධානය මගින් අත්තිකාරම් වශයෙන් 2015 වර්ෂයේ ලබාදී තිබුණු රුපියල් මිලියන 1.75 ක් හා විවිධ සංවිධාන හා ආයතන විසින් ලබාදෙන ලද අරමුදල් රු.772,000 ක් අදාල කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. එසේම, ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් අමාත්‍යාංශය මගින් නගර 10 ක් සඳහා ආපදා අවදානම් සිතියම් සැකසීම සඳහා ලබා දුන් රුපියල් මිලියන 2 ක් හා ලෝක ආහාර වැඩසටහන මගින් ලබාදුන් රුපියල් මිලියන 2 ක මුදල් ප්‍රයෝජනයට නොගෙන ආපසු යවා තිබුණි.

(උ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක රුපියල් මිලියන 1,034.39 ක වියදමින් මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල 2010 වර්ෂයේදී ඉදිකර තිබුණු නමුත් එම ඉඩම සහ ගොඩනැගිල්ල මධ්‍යස්ථානය වෙත නිත්‍යානුකූල පවරා ගැනීමේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිම කර නොතිබුණි.

(ඌ) 2019 දෙසැම්බර් 31 වන දිනට මධ්‍යස්ථානයේ අනුමත කාර්ය මණ්ඩලය 465 වුවද සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 316 ක් වූ අතර කාර්ය මණ්ඩලය 149 ක පුරප්පාඩු පැවතුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න

විගණකාධිපති